

පදාර්ථ විස්තරාර්ථ සහිත

# සංයුක්ත නිකාය

# නිදාන වර්ගය

C. H. Windsor 14
Mayalla 14.6.

පදාර්ථ, විස්තරාර්ථ සහිත.

# සංයුත්තනිකාය.

## නිදානවග්ගය

අභිසමය සංයුත්තකය. 1- බුද්ධවග්ගය..


ව්‍යාඛ්‍යා කර්තෘ:-

ගෞ: නුගවෙල පඤ්ඤාජෝති

ස්වාමිපාදයන් වහන්සේ

විද්‍යාශේඛර පිරිවෙණ,

කුඹියන්ගොඩ-මාතලේ.



ප්‍රකාශක:-

දෙල්වීර සිරිසේන වීරවර්ධන,

සියඹලාගොඩ.

2483 / 1939 ජූලි 21 දින

ශ්‍රීභාරතී යන්ත්‍රාලය-කොළඹ.

# සඥාපනය.

භාග්‍යවතුන් වහන්සේ කරුණා නිධානයහ. උන්වහන්සේ විසින් දෙශිත ධර්මය නෛර්‍ය්‍යාණික යැ. එසේ හෙයින් එය අනුගමනය කරන සියල්ලෝ මැ ලෞකික වූ ද, ලොකොත්තර වූ ද, හිත සැප තාක් සිද්ධකර ගැනීමෙහි අසහාය මාර්ගයට පිළිපන්නාහු වෙති. තථාගත ධර්මය බැබලෙනුයේ අනාවරණයෙහි හා ව්‍යාප්තියෙහි පමණට යැ. එහෙයින් එම ධර්මය බෞද්ධලොකයා අතරැ ව්‍යාප්ත කරලීම ලොකශාසනාභිවෘද්ධියට අසහායොපකාරී වූ සත්කාර්‍ය්‍යයෙකි.

සර්වඥ දෙශිත පිටකත්‍රය ධර්මයන් අතුරෙන් සූත්‍රපිටකයට අයත් සගාථක- නිදාන- ඛන්ධක- සළායතන- මහා වර්ග යන කොටස් පසකින් සමන්විත වූ සංයුක්තනිකාය ය වනාහි ධර්ම නැමති රත්නයන්ට ආකරයකි. ධර්මධරයන් වහන්සේලාට සිතුමිණකි. ධර්මරසය විඳිනු කැමැති සියල්ලවුන් විසින් මැ නිතර පරිශීලනය කළයුතු ග්‍රන්ථ රත්නයකි.

එහෙත් හෙළබසින් කැරුණු සන්න ගැටපද ආදියක් නොමැති වීම නිසා පාළිභාෂා විෂයයෙහි විශෙෂ පටුත්වයක් නැත්තවුන්හට එයින් ප්‍රයොජනය ගැනීම දුෂ්කර වැ පැවතිණි.

මෙය සැළකිමෙන් ධර්මධර ස්ථවිරයන් වහන්සේලා ලවා ලියවීමෙන් මෙම ධර්මග්‍රන්ථය ගිහි පැවිදි ආධුනිකයන් අතට පත් කිරීමෙහි ව්‍යාපෘත වූ සියඹලාගොඩ ඩී. ඇස්. වීරවර්ධන මහතාණන්ගේ හා එයට ආධාරදුන් දායකමහතුන්ගේ සදුත්සාහයෙහි ප්‍රතිඵලයක් වශයෙන් පදාර්ථ- විස්තරාර්ථ සහිත වැ සම්පූර්ණ සගාථක වර්ගය දක්නට ලැබීම සියල්ලන්ගේ මැ ප්‍රීතියට හේතුවකි. එහෙයින් මතු මතුත් මෙම සත්කාර්‍ය්‍යයට ආධාරදීම බෞද්ධ ලොකයාගේ යුතුකමකි.

මෙපරිද්දෙන් සම්පූර්ණ ග්‍රන්ථය මැ දෙමසකට වරක් කලාපය බැගින් නොකඩවා බෞද්ධ ලොකයා අතට මෙම ධර්මග්‍රන්ථය පත්කිරීමෙහි මහත් අභිලාෂය අප සමග දන්වන ලදී. තවද මෙහි "නිදානවර්ගය ලියාදෙනු මැනවැ" යි කරනලද ආරාධනය පරිදි ලොකශාසනාභිවෘද්ධිය සලකා මෙමැ සත්කාර්‍ය්‍යයෙහි යෙදුනමු. නිදානවර්ගය පිළිබඳ වැ මෙයට පෙරැ ලියනලද ව්‍යාඛ්‍යානයෙක් නොදක්නා ලැබෙන හෙයින් මෙය ඒ පිළිබඳව යෙදුණු ප්‍රථම උත්සාහයැ යි සිතමු. සගාථකවර්ගයේ දී විස්තරකරනලද හෙයින් බොහෝ ධර්මකරුණු මෙහි සැකෙවින් ලියන්නට යෙදුණුබව ද දන්වනු කැමැත්තෙමු.

මේවගට,- ලොකශාසනාභිවෘද්ධිකාමී,

නුගවෙල-පඤ්ඤාජොති භික්ෂු.

විද්‍යාශෙඛර පිරිවෙන,
කුඹියන්ගොඩ,-මාතලේ.
21. 7 39.

# නිදාන වග්ගො.

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මා සම්බුද්ධස්ස.**

1 එවමෙමසුතං එකංසමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි 'භික්ඛවො'ති "භදන්තෙ"ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං, භගවා එතදවොච. පටිච්චසමුප්පාදං වො භික්ඛවෙ දෙසිස්සාමි. තං සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමී'ති. එවං "භන්තෙ"ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච. කතමො ච භික්ඛවෙ පටිච්චසමුප්පාදො?

2 "අවිජ්ජාපච්චයා භික්ඛවෙ සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං, සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති". අයං වුච්චති භික්ඛවෙ, පටිච්චසමුප්පාදො.

3 "අවිජ්ජායත්වෙව අසෙස විරාගනිරොධා සඞ්ඛාරනිරොධො, සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො, විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො, නාමරූපනිරොධා සළායතනනිරොධො, සළායතනනිරොධා ඵස්සනිරොධො, ඵස්සනිරොධා වෙදනානිරොධො, වෙදනානිරොධා තණ්හානිරොධො, තණ්හානිරොධා උපාදානනිරොධො, උපාදානනිරොධා භවනිරොධො, භවනිරොධා ජාතිනිරොධො, ජාතිනිරොධා ජරාමරණං සොක පරිදෙව දුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතී"ති

ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

( 1 )

1 සාවත්ථි, "පටිච්චසමුප්පාදං වො භික්ඛවෙ දෙසිස්සාමිති. විභජිස්සාමි. තං සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමී"ති. "එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං" භගවා එතදවොච කතමොච භික්ඛවෙ, පටිච්චසමුප්පාදො? "අවිජ්ජාපච්චයා භික්ඛවෙ සංඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාම

රූපපච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා, වෙදනා පච්චයා. තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදාන පච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං, සොක පරිදෙව දුක්ඛ දොමනස්සු පායාසා සම්භවන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති." කතමඤ්ච භික්ඛවෙ, ජරාමරණං? "යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්ත නිකායෙ ජරා ජීරණතා ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො" අයං වුච්චති ජරා.

2 කතමඤ්ච භික්ඛවෙ මරණං? "යං තෙසං තෙසං සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුති චවනතා භෙදො අන්තරධානං මච්චු මරණං කාලකිරියා ඛන්ධානං භෙදො කලෙබරස්ස නික්ඛෙපො" ඉදං වුච්චති මරණං ඉති අයඤ්ච ජරා, ඉදං ච මරණං, ඉදං වුච්චති භික්ඛවෙ ජරාමරණං."

3 කතමා ච භික්ඛවෙ ජාති? "යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති සඤ්ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො" අයං වුච්චති භික්ඛවෙ, ජාති.

4 කතමො ච භික්ඛවෙ, භවො? "තයො මෙ භික්ඛවෙ, භවා, කාමභවො, රූපභවො, අරූපභවො" අයං වුච්චති භික්ඛවෙ, භවො.

5 කතමඤ්ච භික්ඛවෙ උපාදානං? "චත්තාරිමානි භික්ඛවෙ, උපාදානානි, කාමුපාදානං, දිට්ඨුපාදානං, සීලබ්බතුපාදානං, අත්ත වාදුපාදානං" ඉදං වුච්චති භික්ඛවෙ, උපාදානං.

6 කතමා ච භික්ඛවෙ, තණ්හා? "ඡයිමෙ භික්ඛවෙ තණ්හා කායා. රූපතණ්හා, සද්දතණ්හා, ගන්ධතණ්හා, රසතණ්හා, ඵොට්ඨබ්බතණ්හා, ධම්මතණ්හා" අයං වුච්චති භික්ඛවෙ තණ්හා.

7 කතමා ච භික්ඛවෙ, වෙදනා.? "ඡයිමෙ භික්ඛවෙ, වෙදනා කායා චක්ඛු සම්ඵස්සජා වෙදනා, සොත සම්පස්සජා වෙදනා, ඝාණ සම්ඵස්සජා වෙදනා, ජිව්හා සම්ඵස්සජා වෙදනා, කායසම්ඵස්සජා වෙදනා, මනොසම්ඵස්සජා වෙදනා" අයං වුච්චති භික්ඛවෙ වෙදනා.

8 කතමො ච භික්ඛවෙ ඵස්සො? ඡයිමෙ භික්ඛවෙ ඵස්ස කායා, 'චක්ඛුසම්ඵස්සො, සොත සම්ඵස්සො, ඝාණසම්ඵස්සො, ජිව්හාසම්ඵස්සො, කායසම්ඵස්සො, මනොසම්ඵස්සො" අයං වුච්චති භික්ඛවෙ ඵස්සො.

9 කතමඤ්ච භික්ඛවෙ, සළායතනං? චක්ඛායතනං, සොතායතනං, ඝාණායතනං, ජිව්හායතනං, කායායතනං, මනායතනං." ඉදං වුච්චති භික්ඛවෙ සළායතනං,

10 කතමඤ්ච භික්ඛවෙ නාමරූපං? "වෙදනා, සඤ්ඤා, චෙතනා, ඵස්සො, මනසිකාරො" ඉදං වුච්චති නාමං. "චත්තාරො ච මහාභූතා චතුන්නඤ්ච මහාභූතානං උපාදායරූපං" ඉදං වුච්චති රූපං. ඉති ඉදඤ්ච නාමං ඉදඤ්චරූපං ඉදං වුච්චති භික්ඛවෙ නාමරූපං.

11 කතමඤ්ච භික්ඛවෙ විඤ්ඤාණං? "ඡයිමෙ භික්ඛවෙ විඤ්ඤාණකායා. චක්ඛුවිඤ්ඤාණං, සොතවිඤ්ඤාණං, ඝාණවිඤ්ඤාණං, ජිව්හාවිඤ්ඤාණං, කායවිඤ්ඤාණං, මනොවිඤ්ඤාණං" ඉදං වුච්චති භික්ඛවෙ විඤ්ඤාණං.

12 කතමෙ ච භික්ඛවෙ සඞ්ඛාරා? "තයො මෙ භික්ඛවෙ සඞ්ඛාරා. කායසඞ්ඛාරො, වචීසඞ්ඛාරො, චිත්තසඞ්ඛාරො" ඉමෙ වුච්චන්ති භික්ඛවෙ සඞ්ඛාරා.

13 කතමා ච භික්ඛවෙ අවිජ්ජා? "යං ඛො භික්ඛවෙ දුක්ඛෙ අඤ්ඤාණං, දුක්ඛසමුදයෙ අඤ්ඤාණං දුක්ඛනිරොධෙ අඤ්ඤාණං දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං" අයං වුච්චති භික්ඛවෙ අවිජ්ජා.

14 ඉති ඛො භික්ඛවෙ අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

15 අවිජ්ජායත්වෙව අසෙසවිරාග නිරොධා සඞ්ඛාරනිරොධො සඞ්ඛාර නිරොධා විඤ්ඤාණනිරොධො විඤ්ඤාණනිරොධා -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතී'ති.

( 2 )

1 සාවත්ථි- "මිච්ඡාපටිපදඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි, සම්මාපටිපදඤ්ච, තං සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමී'ති. එවම්භන්තෙ'ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච.

2 කතමා ච භික්ඛවෙ මිච්ඡාපටිපදා? "අවිජ්ජාපච්චයා භික්ඛවෙ සඞ්ඛාරා සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති." අයං වුච්චති භික්ඛවෙ මිච්ඡාපටිපදා.

3 කතමා ච භික්ඛවෙ සම්මාපටිපදා? "අවිජ්ජායත්වෙව අසෙස විරාගනිරොධා සඞ්ඛාරනිරොධො, සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො විඤ්ඤාණනිරොධා -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති." අයං වුච්චති භික්ඛවෙ සම්මාපටිපදා.

( 3 )

සාවත්ථි... විපස්සිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි. කිච්ඡං වතා'යං ලොකො ආපන්නො, ජායති ච ජීයති ච මීයති ච චවති ච උපපජ්ජති ච, අථ ච පනිම'ස්ස දුක්ඛස්ස නිස්සරණං නප්පජානාති ජරාමරණස්ස; කුදාස්සු නාම ඉමස්ස දුක්ඛස්ස නිස්සරණං පඤ්ඤායිස්සති ජරාමරණස්සා''ති අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි. කිම්හි නු ඛො සති ජරාමරණං හොති, කිම්පච්චයා ජරාමරණන්ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො. ජාතියා ඛො සති ජරාමරණං හොති, ජාතිපච්චයා ජරාමරණන්ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි, කිම්හි නු ඛො සති ජාති හොති, කිම්පච්චයා ජාතී ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො. භවෙ ඛො සති ජාති හොති, භවපච්චයා ජාතී ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි. කිම්හි නු ඛො සති භවො හොති කිම්පච්චයා භවො' ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො, උපාදානෙ ඛො සති භවො හොති, උපාදානපච්චයා භවො' ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි කිම්හි නු ඛො සති උපාදානං හොති, කිම්පච්චයා උපාදානන්ති, අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො, තණ්හාය ඛො සති උපාදානං හොති, තණ්හාපච්චයා උපාදානන්ති, අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි කිම්හි නු ඛො සති තණ්හා හොති, කිම්පච්චයා තණ්හා'ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො, වෙදනාය ඛො සති තණ්හා හොති, වෙදනාපච්චයා තණ්හාති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි, කිම්හි නු ඛො සති වෙදනා හොති, කිම්පච්චයා වෙදනා ති, අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු, පඤ්ඤාය අභිසමයො, ඵස්සෙ ඛො සති වෙදනා හොති, ඵස්සපච්චයා වෙදනාති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි. කිම්හි නු ඛො සති ඵස්සො හොති කිම්පච්චයා ඵස්සො'ති, අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො, සළායතනෙ ඛො සති, ඵස්සො හොති. සළායතනපච්චයා ඵස්සොති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි, කිම්හි නු ඛො සති සළායතනං හොති කිම්පච්චයා සළායතනන්ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධි

සත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො, නාමරූපෙ ඛො සති සළායතනං හොති, නාමරූපපච්චයා සළායතනන්ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි, කිම්හි නු ඛො සති නාමරූපං හොති, කිම්පච්චයා නාමරූපන්ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො, විඤ්ඤාණෙ ඛො සති නාමරූපං හොති, විඤ්ඤාණපච්චයා නාමරූපන්ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි, කිම්හි නු ඛො සති විඤ්ඤාණං හොති කිම්පච්චයා විඤ්ඤාණන්ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු, පඤ්ඤාය අභිසමයො සඞ්ඛාරෙ ඛො සති විඤ්ඤාණං හොති සඞ්ඛාරපච්චයා විඤ්ඤාණන්ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි. කිම්හි නු ඛො සති සඞ්ඛාරා හොන්ති, කිම්පච්චයා සඞ්ඛාරෙ'ති අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු, පඤ්ඤාය අභිසමයො, අවිජ්ජාය ඛො සති සඞ්ඛාරා හොන්ති අවිජ්ජාපච්චයා සඞ්ඛාරෙති. ඉතිහිදං අවිජ්ජාපච්චයා සඞ්ඛාරං සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං —පෙ— එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. 'සමුදයො සමුදයො'ති, ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි. පඤ්ඤා උදපාදි. විජ්ජා උදපාදි ආලොකො උදපාදි.

2 අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි. කිම්හි නු ඛො අසති ජරාමරණං නහොති. කිස්ස නිරොධා ජරාමරණනිරොධොති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො; ජාතියා ඛො අසති ජරාමරණං නහොති, ජාති නිරොධා ජරාමරණනිරොධොති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි කිම්හි නු ඛො අසති ජාති නහොති, කිස්ස නිරොධා ජාතිනිරොධොති,

අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො, භවෙ ඛො අසති ජාති නහොති, භවනිරොධා ජාතිනිරෙධො'ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි කිම්හි නු ඛො අසති භවො නහොති, කිස්ස නිරොධා භවනිරොධො'ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො. උපාදානෙ ඛො අසති භවො නහොති, උපාදානනිරොධා- භවනිරොධො'ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි. කිම්හි නු ඛො අසති උපාදානං නහොති, කිස්ස නිරොධා උපාදාන

නිරොධො'ති. අථ ඛො භිකඛවෙ විපසසිසස බොධිසතතසස යොනිසො මනසිකාරා අහු පඤඤාය අභිසමයො. තණහාය ඛො අසති උපාදානං නහොති. තණහානිරොධා උපාදානනිරොධො'ති. අථ ඛො භිකඛවෙ විපසසිසස බොධිසතතසස එතදහොසි. කිමහි නු ඛො අසති තණහා නහොති, කිසස නිරොධා තණහා නිරොධො'ති අථ ඛො භිකඛවෙ විපසසිසස බොධිසතතසස යොනිසො මනසිකාරා අහු පඤඤාය අභිසමයො. වෙදනාය ඛො අසති තණහා නහොති, වෙදනා නිරොධා තණහානිරොධො'ති. අථ ඛො භිකඛවෙ විපසසිසස බොධිසතතසස එතදහොසි. කිමහි නු ඛො අසති වෙදනා නහොති, කිසස නිරොධා වෙදනා නිරොධො'ති අථ ඛො භිකඛවෙ විපසසිසස බොධිසතතසස යොනිසො මනසිකාරා අහු පඤඤාය අභිසමයො ඵසෙස ඛො අසති වෙදනා නහොති, ඵසසනිරොධා වෙදනානිරොධො'ති. අථ ඛො භිකඛවෙ විපසසිසස බොධිසතතසස එතදහොසි. කිමහි නු ඛො අසති ඵසෙසා නහොති, කිසස නිරොධා ඵසසනිරොධො'ති. අථ ඛො භිකඛවෙ විපසසිසස බොධිසතතසස යොනිසො මනසිකාරා අහු පඤඤාය අභිසමයො. සළායතනෙ ඛො අසති ඵසෙසා නහොති. සළායතනනිරොධා ඵසසනිරොධො'ති. අථ ඛො භිකඛවෙ විපසසිසස බොධිසතතසස එතදහොසි. කිමහි නු ඛො අසති සළායතනං නහොති. කිසස නිරොධා සළායතන නිරොධො'ති. අථ ඛො භිකඛවෙ විපසසිසස බොධිසතතසස යොනිසො මනසිකාරා අහු පඤඤාය අභිසමයො. නාමරූපෙ ඛො අසති සළායතනං නහොති, නාමරූපනිරොධා සළායතනනිරොධො'ති අථ ඛො භිකඛවෙ විපසසිසස බොධිසතතසස එතදහොසි. කිමහි නු ඛො අසති නාමරූපං නහොති, කිසස නිරොධා නාමරූපනිරොධො'ති අථ ඛො භිකඛවෙ විපසසිසස බොධිසතතසස යොනිසො මනසිකාරා අහු පඤඤාය අභිසමයො. විඤඤාණෙ ඛො අසති නාමරූපං නහොති, විඤඤාණ නිරොධා නාමරූපනිරොධො'ති අථ ඛො භිකඛවෙ විපසසිසස බොධිසතතසස එතදහොසි කිමහි නු ඛො අසති විඤඤාණං නහොති, කිසස නිරොධා විඤඤාණ නිරොධො'ති

අථ ඛො භිකඛවෙ විපසසිසස බොධිසතතසස යොනිසො මනසිකාරා අහු පඤඤාය අභිසමයො, සඞඛාරෙ ඛො අසති විඤඤාණං නහොති, සඞඛාරනිරොධා විඤඤාණ නිරොධො'ති. අථ ඛො භිකඛවෙ විපසසිසස බොධිසතතසස එතදහොසි කිමහි නු ඛො අසති සඞඛාරා නහොනති. කිසස නිරොධා සඞඛාර නිරොධො'ති. අථ ඛො භිකඛවෙ විපසසිසස බොධිසතතසස යොනිසො මනසිකාරා අහු පඤඤාය අභිසමයො අවිජජාය ඛො අසති සඞඛරා නහොනති අවිජජානිරොධා සඞඛාරනිරොධො'ති.

3 ඉතිහි'දං අවිජ්ජා නිරොධා සඞ්ඛාරනිරොධො, සඞ්ඛාර නිරොධා විඤ්ඤාණනිරොධො, -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

නිරොධො නිරොධොති ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදී'ති.

( 4 )

(සත්තන්නම්පි බුද්ධානං එවං විත්ථාරෙතබ්බං)

සිඛිස්ස භික්ඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස-පෙ-

( 5 )

වෙස්සභුස්ස භික්ඛවෙ, භගවතොඅරහතො සම්මාසම්බුද්ධස්ස-පෙ-

( 6 )

කකුසන්ධස්ස භික්ඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස-පෙ-

( 7 )

කොනාගමනස්ස භික්ඛවෙ, භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස-පෙ-

( 8 )

කස්සපස්ස භික්ඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස-පෙ-

( 9 )

1 පුබ්බෙ'ව මෙ භික්ඛවෙ සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙ'ව සතො එතදහොසි. කිච්ඡං වතා'යං ලොකො ආපන්නො ජායති ච ජීයති ච මීයති ච චවති ච උපපජ්ජති ච. අථ ච පනි'මස්ස දුක්ඛස්ස නිස්සරණං නප්පජානා'ති, ජරාමරණස්ස. කුදාස්සු නාම ඉමස්ස දුක්ඛස්ස නිස්සරණං පඤ්ඤායිස්සති ජරාමරණස්සා'ති.

2 තස්ස මය්හං භික්ඛවෙ, එතදහොසි කිම්හි නු ඛො සති ජරාමරණං හොති කිම්පච්චයා ජරාමරණං තස්ස මය්හං භික්ඛවෙ යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො ජාතියා ඛො සති ජරාමරණං හොති ජාතිපච්චයා ජරාමරණ'න්ති. තස්ස මය්හං භික්ඛවෙ, එත'දහොසි. කිම්හි නු ඛො සති ජාති හොති-පෙ- භවො, උපාදානං, තණ්හා වෙදනා, ඵස්සො, සළායතනං, නාමරූපං, විඤ්ඤාණං, සඞ්ඛාරා හොන්ති. කිම්පච්චයා සඞ්ඛාරා'ති

තස්ස මය්හං භික්ඛවෙ යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො, අවිජ්ජාය ඛො සති සඞ්ඛාරා හොන්ති. අවිජ්ජා පච්චයා සඞ්ඛාරා'ති. ඉතිහි'දං භික්ඛවෙ අවිජ්ජාපච්චයා සඞ්ඛාරා සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

සමුදයො සමුදයො'ති ඛො මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

3 තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි. කිම්හි නු ඛො අසති ජරාමරණං නහොති. කිස්ස නිරොධා ජරාමරණනිරොධො'ති. තස්ස මය්හං භික්ඛවෙ යොනිසොමනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො. ජාතියා ඛො අසති ජරාමරණං නහොති ජාතිනිරොධා ජරාමරණනිරොධො'ති. තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි. කිම්හි නු ඛො අසති ජාති නහොති -පෙ- භවො, උපාදානං, තණ්හා, වෙදනා, ඵස්සො, සළායතනං, නාමරූපං, විඤ්ඤාණං, සඞ්ඛාරා නහොන්ති. කිස්සනිරොධා සඞ්ඛාර නිරොධො'ති.

තස්ස මය්හං භික්ඛවෙ යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො. අවිජ්ජාය ඛො අසති සඞ්ඛාරා නහොන්ති. අවිජ්ජා නිරොධා සඞ්ඛාරනිරොධො'ති. ඉතිහි'දං අවිජ්ජා නිරොධා සඞ්ඛාර නිරොධො, සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො, -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති. නිරොධො නිරොධො'ති ඛො මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජාඋදපාදි, ආලොකො උදපාදී'ති.

( 10 )

---

## බුද්ධවග්ගො පඨමො.

---

**තස්සුද්දානං.**

දෙසනා විභඞ්ගං පටිපදා ච-
විපස්සි සිඛි ච වෙස්සභූ,
කකුසන්ධො කොනාගමනො ච කස්සපො-
මහායසො සක්‍යමුනී ච ගොතමො'ති.

---

# නිදාන වර්ගය.

——||——

( 1 )

පදවි:-

මෙ, (ආනන්දස්ථවිරවූ) මාවිසින්; එවං, මෙසේ; සුතං,(මේ සූත්‍රය) අසන ලදී. නොහොත්; මෙ, මාගේ; සුතං, ඇසීම; එවං, මෙසේය. කෙසේද? යත්– එකං සමයං, එක් සමයෙක්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සාවත්ථියං, සැවැත්නුවර සමීපයෙහි; ජෙතවනෙ, ජෙතවන නම්වූ; අනාථපිණ්ඩිකස්ස, අනාථපිණ්ඩික (=සුදත්ත) මහ සිටුහුගේ; ආරාමෙ, අරම්හි; විහරති, වැඩවෙසෙන සේක.

තත්‍ර ඛො, එකල්හි වනාහි; නොහොත් එහිදී වනාහි; භගවා, භාග්‍යවතුන්වහන්සේ; භික්ඛවො! ඉති, මහණෙනි කියා; භික්ඛූ, භික්ෂූන්; ආමන්තෙසි, ඇමතූසේක. භදන්ත! ඉති, ස්වාමීන්වහන්ස! කියා; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; භගවතො, භාග්‍යවතුන්වහන්සේට; පච්චස්සොසුං, පිළිවදන් ඇස්වූහ.

භගවා, භාග්‍යවතුන්වහන්සේ; භික්ඛවෙ, මහණෙනි!; වො, තොපට; පටිච්චසමුප්පාදං, ප්‍රතීත්‍යසමුත්පාදය; දෙසිස්සාමි, දෙශනා කරන්නෙමි. තං, ඒ ප්‍රතීත්‍යසමුත්පාදය; සුණාථ, අසව්; සාධුකං, මනාකොට, මනසිකරොථ ඉති, මෙනෙහිකරව් යන; එතං, මෙය; අවොච, වදාළසේක

භන්තෙ, ස්වාමිනි!; එවං ඛො ඉති, එසේය කියා; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; භගවතො, භාග්‍යවතුන්වහන්සේට; පච්චස්සොසුං, පිළිවදන්ඇස්වූහ. භගවා, භාග්‍යවතුන්වහන්සේ; එතං, මේ මතුප්‍රකාශවන පටිච්චසමුප්පාදය; අවොච, වදාළසේක.

2 භික්ඛවෙ, මහණෙනි! පටිච්චසමුප්පාදෙ, පටිච්චසමුප්පාදය; කතමො ච, කවරේද? භික්ඛවෙ, මහණෙනි; අවිජ්ජාපච්චයා, අවිද්‍යා ප්‍රත්‍යයයෙන්; සංඛාරා, සංස්කාරයෝ වන්නාහුය. සංඛාරපච්චයා, සංස්කාර ප්‍රත්‍යයයෙන්; විඤ්ඤාණං, විඥානය වන්නේය. විඤ්ඤාණ පච්චයා, විඥාන ප්‍රත්‍යයයෙන් නාමරූපං, නාමරූපය වන්නේය; නාමරූපපච්චයා, නාමරූප ප්‍රත්‍යයයෙන්; සළායතනං, ෂඩායතනය වන්නේය. සළායතනපච්චයා, ෂඩායතන ප්‍රත්‍යයයෙන්; ඵස්සො, ස්පර්ශය වන්නේය. ඵස්සපච්චයා, ස්පර්ශ ප්‍රත්‍යයයෙන්; වෙදනා, වෙදනාතොමෝ වන්නීය. වෙදනාපච්චයා, වෙදනා ප්‍රත්‍යයයෙන්; තණ්හා, තෘෂ්ණාතොමෝ වන්නීය. තණ්හා පච්චයා, තෘෂ්ණා ප්‍රත්‍යයයෙන්; උපාදානං, උපාදානය වන්නේය. උපාදානපච්චයා, උපාදාන ප්‍රත්‍යය

යෙන්; භවො, භවය වන්නේය. භවපච්චයා, භව ප්‍රත්‍යයයෙන්; ජාති, ජාතිහොමෝ වන් නීය. ජාතිපච්චයා, ජාති ප්‍රත්‍යයයෙන්; ජරාමරණං ජරාමරණය ද; සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා, සොකය-පරිදෙවය-දුක්ය- දොම්නස්ය- උපායාසය, යනමොංචිහු; සම්භවන්ති, සම්භව වන්නාහුය

එවං, මෙසේ; එතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස, මේ සියලු දුක්සමූහයාගේ; සමුදයො, සමුදය හෙවත් හටගැණීම; හොති, වන්නේය; භික්ඛවෙ, මහණෙනි! අයං, මේ; පටිච්චසමුප්පාදො ඉති, පටිච්චසමුප්පාද යැයි; වුච්චති, කියනුලැබේ.

3 අවිජ්ජායත්‍ව-එව, අවිද්‍යාවගේ ම; අසෙසවිරාගනිරොධා, විරාග සංඛ්‍යාත මාර්ගයෙන්වූ අශෙෂ නිරොධයෙන්; සංඛාර නිරොධො, සංස්කාරයන්ගේ අනුත්පාද නිරොධය වන්නේය. සංඛාර නිරොධා -පෙ- ජාතිනිරොධා, ජාති නිරොධයෙන්; ජරාමරණං, ජරාමරණය ද; සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා, සොකය පරිදෙවය-- දුක්ය- දොම්නස්ය- උපායාසය යනමොංචිහු, නිරුජ්ඣන්ති, නිරුධ වන්නාහුය. එවං, මෙසේ; එතස්ස කෙවලස්ස, මේ සියලු නොහොත් අමිශ්‍රවූ; දුක්ඛක්ඛන්ධස්ස, දුඃඛරාශියගේ; නිරොධො හොති ඉති, නිරොධය වන්නේය යනුයි.

භගවා, භාග්‍යවතුන්වහන්සේ, ඉදං, මේ සූත්‍රය; අවොච, වදාළසේක. අත්තමනා, සතුටුසිත්ඇති; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; භගවතො, භාග්‍යවතුන්වහන්සේගේ; භාසිතං, දෙශනය, අභිනන්දුං ඉති, අනුමෝදන්වූහු යනුයි,

**1=පටිච්චසමුප්පාද සූත්‍රය යි.**

---

**භික්ඛවෙ:**- ශ්‍රාවකපිරිස තමන්වහන්සේගේ දෙශනාවට අභිමුඛකිරීම් වශයෙන් මෙය වදාරනලදී **භික්ඛු** ශබ්දයාගේ නිරුක්ති නයින් ලැබෙන අර්ථය කිපඅයුරකින් දක්වා තිබේ

"සංසාරෙ භයං ඉක්ඛතී ති භික්ඛු" සසරබිය දක්නිම් ඇත්තේ භික්ඛු නම්. සසරබිය දක්නා තැනැත්තේ සසර තරණයකිරීමට යතන කරයි සියලු පාපක්‍රියාවන්ගෙන් වෙන්ව මධ්‍යම ප්‍රතිපත්තියට අනුකූලව තමන් ද පිහිටා අනුන්ද පිහිටුවමින් සසර එතර කරන මාර්ගයෙහි පිළිපැදීම් සංඛ්‍යාත භික්ෂුගුණය මෙයින් ප්‍රකාශිත යි.

"කිලෙසෙ භින්දතී ති වා භික්ඛු." කෙලෙස් සිඳදමානු ඔ හෝ භික්ඛු නම්. මෙයින් කෙලශයනට වසඟනොවී ඒ කෙලෙස් බිඳදැමීමට යත්නකිරීම් සංඛ්‍යාත භික්ෂුගුණය ප්‍රකාශිතයි.

"භික්ඛති සීලෙනා ති වා භික්ඛු" සිඟීමෙන් දිවිපැවැත්වීම සවභාවකොට ඇත්තේනු යි භික්ඛු නම්. මෙයින් භික්ෂණ ශීලතා ගුණය ප්‍රකාශිත යි. මෙසේ දිවිපවත්වන භික්ෂුව ඒ ඒ කුලයන් පිළිබඳ උස්පහත්කම් නොතකයි. සියල්ලන් කෙරෙහි සමසිත් ඇති කිරීමෙන් මධ්‍යම ප්‍රතිපදාවට අනුකූලව ගමන් කරයි. මෙසේ හෙයින් උඩඟුකමට හා දීනකමට නිභා කරයි. මේ දක්වන ලද්දේ භික්ඛු ශබ්දයාගේ කතිපය අර්ථ කෙනෙකි.

භාග්‍යවතුන් වහන්සේ කරුණාපූර්වකව මෙසේ ආමන්ත්‍රණය කිරීමෙන් තමන්වහන්සේගේ ධර්මය ශ්‍රාවකයන්තුළ මනාව ඇසීමෙහි අභිලාෂය හා සාධුමනසිකාර සම්පත්තිය ද උපදවති. ශාසන සම්පත්තිය වනාහි මනාව මෙනෙහිකිරීම උඩ රඳා පවතියි.

මෙසේ ධර්මදේශනාවට මත්තෙන් ශ්‍රාවකයනට ආමන්ත්‍රණය කොට දේශනාව කෙරෙහි ඔවුන්ගේ සිත් යොමුනොකළහොත් අන්දෙයක් සිතමින් ද, විසුරුණු (=එකඟනොවූ) සිතින් ද, අන්‍ය ධර්මයක් ප්‍රත්‍යවේක්ෂා කරමින් ද, කමටහන් මෙනෙහි කරමින් ද, සිටින භික්ෂුන්හට මේ දේශනාතොමෝ කුමක් නිදානකොට ඇත්තී ද, කුමක් ප්‍රත්‍යය කොට ඇත්ති ද, කවරනම් අර්ථොත්පත්ති යෙක්හි ලා දේශනාකරන ලද්දිදැ යි, සැලකීම දුෂ්කර වෙයි. එකල දේශනය වරදවා සිතට ගතිති නැතහොත් සිතටගත නොහැකි වෙති. එහෙයින් ධර්මය දේශනාකිරීමට ප්‍රථම මෙසේ පිරිසට ආමන්ත්‍රණය කිරීම වටනේ ම යැ

භික්ෂු- භික්ෂුණී- උපාසක- උපාසිකා වශයෙන් බුදුන්ගේ ශ්‍රාවක පිරිස කොටස් සතරෙකි. එසේ ඇතිකල භික්ෂුන්හට ම ආමන්ත්‍රණය කරනලද්දේ ඔවුන් සෙසු තෙපිරිසට දෙටුහෙයින් හා භාග්‍යවතුන් වහන්සේගේ සමීපචාරී හෙයිනි.

**භගවා එතදවොච:**- භාග්‍යවතුන් වහන්සේ ඒ වේලාවෙහි දේශනා කළයුතු සියලු සූත්‍රය වදාළසෙයෙක. මෙතෙකින් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ විසින් අර්ථ- ව්‍යඤ්ජන යන මෙයින් සම්පූර්ණවූ බුදුවරයන් පිළිබඳ දේශනාඥානයාගේ ගම්භීරත්වය ප්‍රකාශ වන මෙම සූත්‍රයාගේ සුකරාවබොධය පිණිස කාල- දෙශ- දෙශක- පරිස කාරණ යන මෙයින් සමන්විතවූ නිදානය ප්‍රකාශකරන ලදී.

**පටිච්චසමුප්පාදං වො භික්ඛවෙ දෙසිස්සාමි:**-- මහණෙනි! නුඹලාට **පටිච්චසමුප්පාදය** දේශනා කරමි- යනාදි ක්‍රමයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් දක්වනලද සූත්‍රයාගේ අර්ථවර්ණනාවට අවසරය පැමිණියේ වෙයි. භාග්‍යවතුන් වහන්සේගේ සූත්‍ර දේශනා ක්‍රමය ප්‍රථමයෙන් ප්‍රකාශකොට එහි වර්ණනය දැක්වීම යොග්‍ය හෙයින් ප්‍රථමකොට දේශනාක්‍රමය දක්වන්නෙමු.

අත්තජ්ඣාසය- පරජ්ඣාසය- පුච්ඡාවසික- අට්ඨුප්පත්තික- යැයි, භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාහේතු සතරෙකි.

වත්ථූපම, වීණොපම, ඉන්ද්‍රිය, බල, බොජ්ඣඞ්ග, මග්ග, සුත්තන්තහාරක යනාදිය මෙන් යම්සූත්‍රකෙනෙක් භාග්‍යවතුන් වහන්සේ අනුන්ගේ අයැදීමක් නැතිව තමන්වහන්සේගේ ම අදහසින් දෙශනාකරන ලද්දාහු ද? ඔව්හු **අත්තජ්ඣාසය** නම් වෙති.

චූළරාහුලොවාද, මහාරාහුලොවාද, ධම්මචක්කප්පවත්තන, අනත්තලක්ඛණ, ආසීවිසොපම, ධාතුවිභඞ්ග යනාදි සූත්‍රමෙන් යම් සූත්‍රකෙනෙක් මෙරමාගේ අදහස- වැටහීම- දර්ශනශක්තිය- සිත- ප්‍රවීනාව- අවබොධය යන මේනෙක්ද අපෙක්‍ෂා කොට මෙරමා අදහස් අනුව දෙශනාකරන ලද්දාහු ද? ඔව්හු **පරජ්ඣාසය** නම් වෙති.

සිව්පිරිස (=භික්‍ෂු- භික්‍ෂුණී· උපාසක- උපාසිකා) චතුර්වර්ණය (=ක්‍ෂත්‍රිය- බ්‍රාහ්මණ ගෘහපති- මහාසාල), නාග, සුපර්ණ, ගන්ධර්ව, අසුර, යක්‍ෂ, දෙව, බ්‍රහ්ම යනාදීන් විසින් අසනලද ප්‍රශ්න අනුව දෙශිත බොජ්ඣඞ්ග, දෙවතාසංයුත්ත, මාරසංයුත්ත, බ්‍රහ්මසංයුත්ත, සක්කපඤ්හ, චූළවෙදල්ල, මහාවෙදල්ල, සාමඤ්ඤඵල, ආලවක, සුචිලොම, බරරොම, යනාදි සූත්‍ර **පුච්ඡාවසික** නම් වෙති.

ඒ ඒ අවස්ථාවන්හි උපන් කරුණුඅනුව දෙශනාකරණලද චූළසීහනාද, පුත්තමංසූපම, දාරුක්ඛන්ධූපම, ඵෙණපිණ්ඩූපම, පාරිච්ඡත්තකූපම යනාදිසූත්‍ර **අට්ඨුප්පත්තික** නම් වෙති.

යථොක්ත චතුර්විධ දෙශනාවන් අතුරෙන් මෙතන්හි දෙශිත **පටිච්චසමුප්පාදසූත්‍රය** පරජ්ඣාසික (=මෙරමාඅදහස්අනුවදෙශිත) නම් වෙයි.

මෙසේ දෙශනාකරනුලබන ධර්මය ශ්‍රවණය කරන්නාහු ද තම තමන්ගේ ඥානගතිය අනුව **උග්ඝටිතඤ්ඤූ- විපඤ්චිතඤ්ඤූ- නෙය්‍ය - පදපරම** යනුවෙන් කොටස් සතරකට බෙදෙති.

සංක්‍ෂෙපයෙන් දෙශිත ධර්මය ඇසීම් පමණකින් යම්පුද්ගල යකුහට ධර්මාවබොධය වේනම් හේ **උග්ඝටිතඤ්ඤූපුද්ගල** නමි.

සංක්‍ෂෙප දෙශනාවෙන් ධර්මාවබොධය නොවී එහි විස්තර දෙශනාවත් ඇසීමෙන් යම්පුද්ගලයකුහට ධර්මාවබොධය වේනම් හේ **විපඤ්චිතඤ්ඤූපුද්ගල** නමි.

සංක්‍ෂෙප විස්තර විසින් දෙශිතධර්මය ශ්‍රවණයකළපමණින් ධර්මාවබොධය නොවී ධර්මය ඉගෙණීම පිළිවිසීම, මෙනෙහිකිරීම, කල්‍යාණමිත්‍රසෙවනය, භජනය, පයිරුපාසනය (-වෙන නැවත නැවත එළඹීම) යන මෙහි පිළිවෙළින් යෙදීමෙන් යම්පුද්ගලයකු හට ධර්මාවබොධය වේනම් හේ **නෙය්‍යපුද්ගල** නමි.

මේ තුන් ආකාරයෙන් ම යම්පුද්ගලයකුහට ධර්මාවබොධයක් ඒ අත්බැව්හි ලබාගත නොහැකි වේනම් හේ පදපරමපුද්ගල නම්. ඔහුගේ ධර්මශ්‍රවණාදිය මතුආත්මභාවයක ධර්මාවබොධයට ප්‍රත්‍යය වන්නේ ය

භාග්‍යවතුන් වහන්සේ සැවැත්පුර දෙව්රම්වෙහෙර වැඩ වෙසෙනකලැ එක්සවස්භානයෙකැ සමාන පැවැතුම්ඇති, ධූතාඞ්ග ධාරීවූ, පටන්ගන්නාලද වීය්‍ර්‍යයඇති, ශාසනබ්‍රහ්මචය්‍ර්‍යයෙහි මනාව ඇලුණු, විදර්ශකවූ, ජනපදවාසී පන්සියයක් භික්ෂූහු එක්කෙනා- දෙදෙනා- තිදෙනා සිව්දෙනා- පස්දෙනාවහන්සේ බැගින් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ මටසිලුටු සියුම් ප්‍රත්‍යාකාර දෙශනාව ප්‍රාර්ථනය කරන්නාහු බුදුන්වැද- ලොමයෙන් කරනලද රක්තවර්ණ පලසකින් වටකරනලද්දක් මෙන් උන්වහන්සේගේ හාත්පස්හි වැඩඋන්හු. ඔවුන්වහන්සේගේ අදහස්අනුව භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රධර්මය දෙශනාකිරීමට පටන්ගත්සේක.

දක්ෂචිත්‍රකාරතෙම (සිතියම්කරන්නා) තමන්හට සිතියම්කිරීමට ලැබුණු භිත්තිය ඔපනොදමන ලද්දක්නම් පළමුකොට මත්තිකාලෙපාදියෙන් ඔපදමා දෙවනු චිත්‍රකර්ම කරයි හෙවත් රූ නඟයි. ඔපදමනලද භිත්තියක්නම් නැවත ඔපදැමීම් කෘත්‍ය්‍යක නොසෙදී පළමුකොට ම සිතියම් කරයි.

එසේම භාග්‍යවතුන් වහන්සේ ද භාවනානුයොගී නොවූ ආදිකර්මික කුලපුත්‍රයකු ලැබ පළමුකොට ම ඔහුට අභිඤ්ඤය කුළුගන්වා ශූන්‍යතා ප්‍රතිසංයුක්ත විදර්ශනා සඞ්ඛ්‍යාත සියුම් ධර්මය දෙශනා නොකොට සීල- සමාධි- කම්මස්සකතාඤාණ සම්මාදිට්ඨි යන ගුණයන්හි යොදවමින් පූර්වභාගප්‍රතිපදාව දෙශනාකොට හෙවත් ශීලකථාදියෙහි පරිකර්මකියාදී පසුව අභිඤ්ඤය කුළුගන්වා ශූන්‍යතාප්‍රතිසංයුක්ත විදර්ශනාසංඛ්‍යාත සියුම් ධර්මය දෙශනා කරනසේක.

නිමවූ පූර්වභාගප්‍රතිපදාවඇති හෙවත් ශීලයෙන්පිරිසුදුවූ පටන්ගන්නාලද වීය්‍ර්‍යඇති භාවනානුයොගී විදර්ශකපුද්ගලයකු ලදකල ඔහුට නැවත පූර්වභාග ප්‍රතිපදාව දෙශනා නොකොට ඔහුගේ අදහස් අනුව සෘජුවම අභිඤ්ඤය පදස්ථානකොටඇති සියුම්වූ ශූන්‍යතා ප්‍රතිසංයුක්ත විදර්ශනාලක්ෂණය දෙශනාකරනසේක.

යථොක්ත භික්ෂූහු පන්සියයක්දෙනා වහන්සේ පූර්වභාග ප්‍රතිපත්තියෙන් පිරිසුදු වූවහුය. ධොවිත සුවර්ණබඳු වූවාහුය. මනාව පිරිමදිනලද මිණිරුසක් වැනියාහ. ත්‍රිවිධමාර්ගඵලයන්හි පිහිටියාහුය. ඉතිරිවූයේ එක් ලොකොත්තරමාර්ගයකි ඒ භික්ෂූන්ගේ චිත්තානුකූලව එය හෙවත් අග්‍රමාර්ගය ලැබීමපිණිස මේසූත්‍රධර්මය දෙශනාකළසේක.

**පටිච්චසමුප්පාදං**:- "පටිච්ච ඵලං උප්පජ්ජති එතස්මා'ති පටිච්චසමුප්පාදො" යම්හේතුවකින් යම්බඳුඵලයක් ලැබේ ද ඒ හේතුව **පටිච්චසමුප්පාද** නම්. එයින් උපන් ඵලය **පටිච්ච සමුප්පන්න** නම්. හෙතු-ඵල ධර්‍ම සි.

"තබ්භාව භාවී භාවාකාරමත්තොපලක්ඛිතො පටිච්චසමුප්පාද නයො"- මේ අභිධර්‍මාර්‍ථසඞ්ග්‍රහයෙහි පටිච්චසමුප්පාද ක්‍රමය හැඳින්වූ අයුරු සි. ප්‍රත්‍යධර්‍මය විද්‍යමානකල්හි ද්‍රත්‍යොත්පන්න (=ප්‍රත්‍යය නිසා උපන්) ධර්‍මය ඇතිවීම් **සඞ්ඛ්‍යාත** ආකාරමාත්‍රයෙන් යුක්ත වූයේ පටිච්චසමුප්පාද ධර්‍මක්‍රමය යි යනු එහි අර්‍ථයි. ප්‍රත්‍යාකාරය යනුද මෙයටම නමෙකි. "**ඉමස්මිං සති ඉදං හොති, ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති**"- මෙම හේතුව ඇතිකල්හි මේඵලය වන්නේයි, මෙමහේතුවගේ ඉපදීමෙන් මෙමඵලයාගේ ඉපදීම වන්නේ ය, යන ධර්‍මනියාමය මෙයින් ප්‍රකාශිතයි.

මිළඟ සූත්‍රයෙහි පටිච්චසමුප්පාදය පිළිබඳ විස්තරදෙශනානයක් දක්නාලැබේ. එහෙත් මෙහිදිම එය ඉගෙනීම මතුසූත්‍රද්‍ගැනීමට ද මඟක්වේයැ යි, හැහෙනහෙයින් ඒ පිළිබඳ සුළුවිස්තරයක් දක්වන්නෙමු.

පටිච්චසමුප්පාදයෙහිලා දතයුතු- අද්ධතුනෙක් ද, අඞ්ගදොළොසෙක් ද, ආකාරවිස්සෙක් ද සන්ධිතුනෙක් ද, සංක්‍ෂෙප සතරෙක් ද, වට්ටතුනෙක් ද, මූල්දෙකෙක් ද වෙති.

**අතීතඅද්ධ, අනාගතඅද්ධ, පච්චුප්පන්නඅද්ධ** යනු අද්ධ තුන සි. අවිද්‍යා සංස්කාර දෙක අතීතඅද්ධ යැ, ජාති, ජරාමරණ දෙක අනාගත අද්ධ යැ. මධ්‍යයෙහිවූ විඥානාදිඅට පච්චුප්පන්න අද්ධ යැ. අද්ධ යනු කාලයට නම්.

**අවිජ්ජා, සංඛාර, විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වෙදනා, තණ්හා, උපාදාන, භව, ජාති, ජරාමරණ** යන මොව්හු දොළොස් අඞ්ගයෝයි ශොකාදි වචන නිස්සන්ද (=ජාතියගේ අමුඛ්‍ය) ඵල දැක්වීම කි. එහෙයින් වෙන් වැ අඞ්ගවශයෙන් නොගැනේ.

අවිද්‍යා, සංස්කාර දෙක ගැනීමෙන් තෘෂ්ණා- උපාදාන- භව යන තුන්දෙන ද ගන්නාලද්දාහු වෙති. එසේම තෘෂ්ණා උපාදාන- භව ග්‍රහණයෙන් අවිද්‍යා- සංස්කාර දෙදෙන ගන්නාලද්දාහු වෙති. ජාති- ජරාමරණ ග්‍රහණයෙන්ම විඥානාදි ඵලපඤ්චකය ගැනෙන්නේ ය.

මෙසේ ගත්කල්හි **අවිජ්ජා- සංඛාර- තණ්හා- උපාදාන-** භව යන පස අතීත හෙතු සි.

**විඥාන- නාමරූප- ෂඩායතන= ස්පර්ශ- වේදනා** යන පස වර්තමාන ඵල යි.

**තෘෂ්ණා- උපාදාන- භව- අවිද්‍යා සංස්කාර** යන පස වර්තමාන හේතු යි.

**විඥාන- නාමරූප- ෂඩායතන- ස්පර්ශ- වේදනා** යන පස අනාගත ඵල යි  මෙසේ ආකාර විස්සෙක් වේ.

සන්ධි තුන හා සංක්ෂෙප සතර ද මෙහිම ඇතුළත් වෙති  හේ මෙසේය- අවිද්‍යා සංස්කාර **අතීතහෙතු සංක්ෂෙපය** යි. තෘෂ්ණා, උපාදාන, භව ද මෙහි ඇතුළත් වෙති  විඥාන, නාමරූප, ෂඩායතන, ස්පර්ශ, වෙදනා **වර්තමාන ඵලසංක්ෂෙපය** යි. තෘෂ්ණා, උපාදාන භව **වර්තමාන හෙතුසංක්ෂෙපය** යි. අවිද්‍යා, සංස්කාර ද මෙහි ඇතුළත් වෙති. ජාති, ජරාමරණ **අනාගත ඵල සංක්ෂෙපය** යි. විඥාන, නාමරූප, ෂඩායතන, ස්පර්ශ, වෙදනා ද මෙහි ඇතුළත් වෙති. මේ සංක්ෂෙප සතර යි.

මෙහි සංස්කාර + විඥාන අතර එක් සන්ධිය කි  එය **හෙතුඵල සන්ධිය** යි. වෙදනා × තෘෂ්ණා අතර එක් සන්ධිය කි. එය **ඵලහේතු සන්ධිය** යි  භව + ජාති අතර එක් සන්ධිය කි. එය **හෙතුඵල සන්ධිය** යි.

මෙසේ සංක්ෂෙප සතර අතර සන්ධිතුනක් ලැබේ. ප්‍රථම සන්ධිය අතීතහෙතු හා වර්තමාන ඵල ද, ද්විතීය සන්ධිය වර්තමාන ඵල හා වර්තමාන හේතු ද, තෘතීය සන්ධිය වර්තමාන හේතු හා අනාගතඵල ද සම්බන්ධ කොරෙති.

අවිද්‍යා, තෘෂ්ණා, උපාදාන **ක්ලෙශවට්ටය** යි. කර්මභව සඞ්ඛ්‍යාත භවෛකදෙශය ද, සංස්කාරය ද. **කර්මවට්ටය** යි  උත්පත්තිභව සංඛ්‍යාත භවෛකදෙශය ද, අවශෙෂය ද, **විපාකවට්ටය** යි. මෙසේ වට්ටතුනෙකි

අවිද්‍යා, තෘෂ්ණා දෙක මුල්දෙක යි. මේ මූල්දෙක සිඳීමෙන් යථොක්ත ත්‍රිවිධවෘත්තය සිඳෙයි. මෙසේ සම්බන්ධවූ අනාදිමත් ත්‍රෛභූමක වෘත්තය **පටිච්චසමුප්පාදය** යි.

**අවිජ්ජාපච්චයා සඞ්ඛාරා**- අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර වත්නාහු ය  මෙහි අවිද්‍යා යනු කිම? දුඃඛසත්‍යය, සමුදයසත්‍යය, නිරොධසත්‍යය, මාර්ගසත්‍යය යන චතුරාර්යසත්‍යයන්ගේ නොදැන්ම අවිද්‍යා නම් එනම් මොහය යි. මේ මොහය (=නොදැන්ම) හේතු කොටගෙන සත්වයා අනන්තසසර සැරිසරන්නේ ය. මෙයට ප්‍රතිපක්ෂ ධර්මය විද්‍යාව යි; හෙවත් අග්‍රමාර්ගඥානය යි. එය ලබන තෙක් ඉන් මොබ සියලු සත්වයනට ඒ ඒ පමණට අවිද්‍යාව ඇත්තේය.

සංඛාර යනු කිම? කායසංඛාර, වචීසංඛාර, මනොසංඛාර යන තිදෙන හෙවත් කායද්වාරයෙහි පැවැති කුශලාකුශල චේතනාරාශිය, වාග්ද්වාරයෙහි පැවැති කුශලාකුශල චේතනාරාශිය, මනොද්වාර යෙහි පැවැති කුශලාකුශල චේතනාරාශිය යන මොව්හු සංඛාරනම් වෙති **"චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි"** යනු දෙශනා හෙයින් චේතනා යනු කර්මයට නමෙකි. මෙහි සංඛාර නාමයෙන් දක්වන ලද්දේ එය යි.

ප්‍රත්‍යය වන්නේ කෙසේද? ප්‍රවෘත්තිය (=පැවැත්ම) ට හෝ නිෂ්පත්තිය (=ඉපදීම)ට උපකාරවන ධර්ම ප්‍රත්‍යය නම්. මෙහි අවිද්‍යාව සංස්කාරයට ප්‍රත්‍යය වනුයේ පැවැත්මට යැ. එහෙයින් අවිද්‍යාවෙන් සංස්කාරය උපදින්නේ යැයි, අර්ථ නොගෙන අවිද්‍යාව ඇතිබැවින් සත්වයන් විසින් කරනුලබන කුශල අකුශල සංස්කාර හෙවත් කර්ම වන්නේයැ යි, සැලකිය යුතු. අවිද්‍යාව නැත්නම් කරනු ලබන යහපත හෝ අයහපත කර්ම නොවන්නේ ය; රහතනට අවිද්‍යාව නැත. එහෙයින් රහතන් වහන්සේලා විසින් කරනුලබන දෑය කර්ම නොවේ ඊට ක්‍රියා යැයි කියනු ලැබේ. මෙසේ අවිද්‍යාව ඇතිබව හේතුකොටගෙන කුශලාකුශලකර්ම හෙවත් සංස්කාර රැස්කරනු ලබන හෙයින් අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාර වන්නාහු යැ යි, දතයුතු.

**සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං** – සංස්කාර ප්‍රත්‍යයෙන් විඥානය වන්නේය. සංඛාරය යටදක්වන ලදී විඥානය යනු කිම? චක්ෂු විඥානය, ශ්‍රොත්‍රවිඥානය, ඝ්‍රාණවිඥානය ජිහ්වාවිඥානය, කායවිඥානය මනොවිඥානය යන විපාකසිත් විඥාන නම් වෙති. ප්‍රතිසන්ධි, ප්‍රවෘත්ති වශයෙන් විපාකසිත් දෙකොටසෙකි ලොකොත්තර විපාකසිත් මෙහි ඇතුළත් නොවේ

ප්‍රත්‍යය වන්නේ කෙසේද? සංස්කාරය විඥානයට ප්‍රත්‍යය වනුයේ ප්‍රවෘත්තියට නොව නිෂ්පත්තියට යැ ගියජාතියේ රැස්කරන ලද සංස්කාර හෙවත් කර්ම හෙතුකොටගෙන මේ ජාතියේ විඥාන යැ යි කියනලද විපාකය පහළ වේ. ගියජාතියේ සංස්කාර නුවූයේ නම් මේ ජාතියේ විඥාන (විපාක) නොලැබේ. එසේම සංස්කාර (=කර්ම) නානත්වයෙන් විඥාන (=විපාක) යාගේ ප්‍රභෙදය වන්නේය එහෙයින්ම සත්වයන් පිළිබඳ ප්‍රභෙදය ද වන්නේය. මෙසේ සංස් කාර ප්‍රත්‍යයෙන් විඥානය ඇතිවනබව දතයුතු

**විඤ්ඤාණපච්චයා නාමරූපං** විඥාන ප්‍රත්‍යයෙන් නාමරූප වන්නේය. විඥානය නම් විපාකසිත යැ යි, යටකියනලදී, විපාක සිත චෛතසික හා සම්ප්‍රයුක්තවම යෙදේ. එහෙත් විඤ්ඤාණ යනු වෙන් ගතයුත්තේ චිත්තය පමණකැ යි සිතැතබාගතයුතු. නාම රූපයකතන්හි නාම යනුවෙන් චෛතසික ගැනෙන හෙයිනි.

'නාමරූප යනු කිම? "නාමඤ්ච රූපඤ්ච නාමරූපඤ්ච නාමරූපං" නාමය ද රූපය ද නාමරූපය ද නාමරූප නම් වේ. එකශෙෂ කොට ගතයුතු.

එකල– විඥාන ප්‍රත්‍යයෙන් නාමවන්නේ යැ, විඥාන ප්‍රත්‍යයෙන් රූපවන්නේ යැ, විඥාන ප්‍රත්‍යයෙන් නාමරූප වන්නේයැ. කියා ගතයුතු. වේදනා, සඥා, සංස්කාර යන ස්කන්ධත්‍රය නාමනම්.

"රුප්පනලක්ඛණං රූපං" විරොධි ප්‍රත්‍යයෙන් විකාරයකට පැමිණෙන සවභාවය රූපයාගේ ලක්‍ෂණය යි. එනම්= සතරමහා, භූතයන් හා සතරමහාභූතයන් නිසා පවත්නා චක්‍ෂුරාදි ඉතිරි සුවිසි රූප ද යන අටවිසි රූපයෝ යි

විඥානය නාමරූපයට ප්‍රත්‍යය වන්නේ කෙසේ ද? විඥාන නාම රූපයට ප්‍රත්‍යය වන්නේ පැවැතිමට යැ, නිපැත්මට නොවේ, විඥාන වත්ම ඒ හේතුවෙන් නාමරූප ද වේ; විඥානය නම් ප්‍රතිසන්ධි චිත්තය යි, ඒ හා යෙදෙන චෛතසික නාමයයි, ඒ සමග යෙදෙන කම්ජරූප රූප නමි. මේ කොටස් තුනෙහි පහළවීම එක විටම =ඉදිරිපසුනොවී) සිදුවන්නකි; එකවිටම පහලවුව ද විඥානය ප්‍රධාන වශයෙන්පැවැත්මට ප්‍රත්‍යයවන හෙයින් විඥාන හේතුවෙන් නාමරූප වන්නේයැයි කියනලදි

නාමරූපපච්චයා සළායතනං – නාමරූප ප්‍රත්‍යයෙන් ෂඩායතනය වන්නේය, නාමරූපය යට දක්වන ලදී. ෂඩායතන නම් කිම? චක්ඛායතන, සොතායතන, ඝානායතන, ජිහවායතන, කායායතන, මනායතන යන සය යි. චක්‍ෂුඃප්‍රසාද රූපය චක්ඛායතන නමි, ශ්‍රොතායතනාදිය ද මෙසේමැයි. චක්ඛුවිඥානාදිය මනායතන නම්; "ඡට්ඨායතනඤ්ච ඡළායතනඤ්ච ඡළායතනං"යි මෙද එකශෙෂ විය යුතු, ෂඩායතනය අරූපාවචරය සඳහා යැ,

නාමරූපය ෂඩායතනයනට ප්‍රත්‍යයවන්නේ කෙසේ ද? නාම රූප ද ෂඩායතනයනට ප්‍රත්‍යයවන්නේ පැවැත්මට යැ, නිපැත්මට නොවේ. ෂඩායතනයෝ විඥාන, නාමරූපවලින් බැහැරවූවෝ නොවෙති. විඥාන සමගම නාමරූප, ෂඩායතන ඵස්ස, වේදනා වෙති, එහෙන් ෂඩායතනයන්ගේ පැවැත්මට හේතුවන හෙයින් නාමරූපප්‍රත්‍යයෙන් ෂඩායතන වේයැයි කියනලදී.

සළායතන පච්චයා ඵස්සො:– ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය වන්නේ යැ, ෂඩායතන යට කියනලදී. ඵස්සය නම් ඵස්ස චෛතසිකය යි, ස්පර්ශකිරීම එහි ලක්‍ෂණ ය යි. එහෙත් ආයතන සම්බන්

යෙන් චක්ඛුසම්ඵස්සාදි වශයෙන් සයකට බෙදෙයි, චක්ඛායතන යාගේ සම්බන්ධයෙන් ලැබෙන ස්පර්ශය චක්ඛුසම්ඵස්ස නම්. සෙස්ස ද මෙසේ ම යැ.

ෂඩායතනය ස්පර්ශයට ප්‍රත්‍යවන්නේ කෙසේ ද? මෙහිදු ප්‍රත්‍ය යවීම පැවැත්මට යැ, ආයතන නැත්නම් ඒ ඒ ආයතන සම්බන්ධ යෙන් පවත්නා ස්පර්ශය ද නොවන්නේ යැ. **"චක්ඛුං ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො"** යි. එහෙයින් වදාරනලදී. මෙසේ ස්පර්ශයට හේතුව ආයතන හෙයින් ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය වන්නේයැ යි කියනලදී.

**ඵස්සපච්චයා වෙදනා:**– ස්පර්ශ ප්‍රත්‍යයෙන් වෙදනා වන්නී යැ ඵස්සය යට කියනලදී; වෙදනා යනු එනම් චෛතසිකය යි. එය චක්ඛුසම්ඵස්සජ වෙදනා, සොතසම්ඵස්සජවෙදනා, ඝානසම්ඵස්ස ජවෙදනා, ජිව්හාසම්ඵස්සජවෙදනා, කායසම්ඵස්සජවෙදනා, මනොසම්ඵස්සජවෙදනා යනුවෙන් සවැදෑරුම් වේ. චක්ෂුස්පර්ශයෙන් ඇතිවන සුඛාදි වෙදනා චක්ඛුසම්ඵස්සජ වෙදනා නම් වේ, සොත සම්ඵස්සජාදිය ද මෙසේම යි.

ඵස්සය වේදනාවට ප්‍රත්‍යය වන්නේ කෙසේ ද? මෙහිදු ප්‍රත්‍යය වන්නේ පැවැත්මට යැ, ඵස්සය ඇතිකල්හිම වෙදනා වේ, චක්ෂුරාදි ආයතන රූපාදි ආරම්මණයන්හි ගැටීමෙන් චක්ෂුර්විඥානාදිය පහළ වන්නේය, එහි ලැබෙන වෙදනා චක්ඛුසම්ඵස්සජ වෙදනා ආදි වශයෙන් සැළකිය යුතු, මෙසේ හෙයින් ස්පර්ශ ප්‍රත්‍යයෙන් වෙදනා වන්නියැ යි කියනලදී.

**වෙදනාපච්චයා තණ්හා:**– වෙදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණා තොමෝ වන්නීය. වෙදනාව යට දක්වනලදී. **"සුඛවෙදනා සදිසො තණ්හාය අඩිසස්සයො නාම නත්ථි"** සුඛවෙදනාව සමාන තෘෂ්ණාවට උපකාරවූවක් නැත, යනු වදාළ හෙයින් මෙහි ප්‍රධානව ගැනෙනුයේ සුඛවෙදනා යැ.

තෘෂ්ණා නම් ලොභය යි එය චෛතසිකයකි. ගන්නා අරමුණු වශයෙන් රූපතණ්හා, සද්දතණ්හා, ගන්ධතණ්හා, රසතණ්හා, පොට්ඨබ්බතණ්හා, ධම්මතණ්හායැ යි ෂ සවැදෑරුම්. රූපය අරමුණු කොට පවත්නා තෘෂ්ණාව රූපතණ්හා නම්. සද්දතණ්හාදිය ද මෙසේම සැළකිය යුතු.

වෙදනාව තෘෂ්ණාවට ප්‍රත්‍යයවන්නේ කෙසේද? මෙය ද ප්‍රත්‍යය වන්නේ පැවැත්මට යැ. වෙදනාව ඇතිහෙයින් තෘෂ්ණාව වන් නේ යැ. වෙදනාවක් නොවේනම් තෘෂ්ණාව නොවේ. සත්වයෝ වෙද

නාවකොරෙහි මමත්වයෙන් රූපාදි ඒ ඒ අරමුණු දෙන්නවුන් කෙරෙහි ද සත්කාර කෙරෙති එහෙයින් වේදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වන්නේයැ යි කියනලදී.

**තණ්හාපච්චයා උපාදානං:** තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදානය වන්නේ ය. තෘෂ්ණාව යට දක්වනලදී. උපාදානය නම් දැඩි කොට ගැනීම යි කාමූපාදාන, දිට්ඨුපාදාන, සීලබ්බතුපාදාන, අත්තවාදූපාදාන යැ යි ඒ චතුර්විධ යි.

වස්තුසඞ්ඛ්‍යාත කාමය දැඩිකොට ගන්නේ කාමූපාදානය යි. කාම යම උපාදානවූයේ හෝ කාමූපාදාන නම්. තෘෂ්ණාව අත දිගුකිරීම මෙනි. උපාදානය දිගුකළ අතට අසුවූද්‍රය දැඩිකොට ගැනීම මෙනි.

දිට්ඨුපාදානය නම් "නත්ථිදින්නං" යනාදීන් ප්‍රකාශිත දශවස්තුක මිථ්‍යාදෘෂ්ටිය යි. සීලබ්බතුපාදානය නම් අජශීලාදියෙන් හා කුක්කුර ව්‍රතාදියෙන් ශුද්ධිය වන්නේය යන විශ්වාසග්‍රහණය යි. අත්තවාදූපාදානය නම් "රූපංඅත්තතො සමනුපස්සති" යනාදිවශයෙන් ප්‍රකාශිත විංශතිවිධ සක්කාය දෘෂ්ටිය යි.

මෙසේ හෙයින් උපාදාන යන්නෙන් දැඩිතෘෂ්ණාව හා දෘෂ්ටිය ප්‍රකාශිතයි.

තෘෂ්ණාව උපාදානයට ප්‍රත්‍යයවන්නේ කෙසේද? මෙය ද උපකාරවන්නේ පැවැත්මට ය. නිපැත්මට නොවේ. ප්‍රථම තෘෂ්ණාව හේතුකොටගෙනම අනතුරු උපාදානය (=දෘඪග්‍රහණය) දෘෂ්ටි සහිතව හෝ රහිතව වන හෙයින් තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදානයනය වන්නේයැ යි, කියන ලදී.

**උපාදානපච්චයා භවො:-** උපාදාන ප්‍රත්‍යයෙන් භවය වන්නේ යැ. උපාදානය යට කියනලදී. කර්මවශයෙන් හෝ උත්පත්තිවශයෙන් වැඩීම භව නම්. මෙහිලා විශේෂයෙන් උත්පත්තිභවය සැළකිය යුතු එය කාමභව, රූපභව, අරූපභව වශයෙන් ත්‍රිවිධ යි.

උපාදානය භවයට ප්‍රත්‍යයවන්නේ කෙසේ ද? මෙය ද ප්‍රත්‍යය වන්නේ ප්‍රවෘත්තියට යැ. උපාදානය හා යෙදෙන චේතනාව කර්ම වන්නේ යැ. එයින් උපපත්තිභවය වේයැ යි ගතහොත් නිෂ්පත්තියට ද ප්‍රත්‍යය වේයැ යි, ගතයුතු. කර්මයෙන් උත්පත්තිභවය නිපැදෙන හෙයිනි. එහෙත් "භවපච්චයා ජාති" යි එය මතුප්‍රකාශවන බැවින් මෙහි නොගැනේ.

අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාර වේයැ යි, කියේත් මෙයම යැ. එහෙත් එය කීයේ අතීතඅද්ධය ගැනයැ. වර්තමානයෙහිලා එයම ගන්නාකල උපාදාන සංඛ්‍යාත දැඩිලොභය හෙතුකොටගෙන එහි යෙදෙන චේතනාභවසඞ්ඛ්‍යාත කර්මයවන්නේයැ යි, කියනලදී.

**භවපච්චයා ජාති**:-භවප්‍රත්‍යයෙන් ජාතිතොමෝ වන්නී යැ. මෙහි භවය නම් යට කියැවුණු කම්මභව, උපපත්තිභව දෙකින් කම්ම භවය යි. කුශලාකුශලචේතනා හා තත්සම්ප්‍රයුක්ත ලොභාලොභාදිය කර්මභව නම්.

ජාති නම් උත්පත්තිය යි. ස්කන්ධයන්ගේ පහළවීම යි. "**ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො**" යනු දෙශනා යි.

භවය ජාතියට ප්‍රත්‍යයවන්නේ කෙසේ ද? මෙය ප්‍රත්‍යය වන්නේ නිෂ්පත්තියට යැ මේ ආත්මයෙහි කරනුලබන භව සංඛ්‍යාත කර්මහෙතුකොටගෙන මතුආත්මයෙහි ජාතිසංඛ්‍යාත විඥානාදිය සුදුසුපරිදි පහළවන්නේ යැ. මෙය කිසිවකුගේ මැවීමක් නොවේ. කර්මශක්තියෙන්ම සිදුවන්නකි. සංස්කාරප්‍රත්‍යයයෙන් විඥානයවන්නේ යැ, යන්නෙහි අදහස් ද මෙයම යැ. එහෙත් එය අතීතභවයෙන් වර්තමානජාතිය හෙවත් උත්පත්තිය පිළිබඳව යි. මෙය වර්තමානභවයෙන් අනාගතඉපැද්ම පිළිබඳව යි.

**ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති**:- ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ · ශොක-පරිදෙව- දුක්- දෞර්මනස්- උපායාස යන මොව්හු සම්භව වන්නාහ. ජාතිය යට දක්වනලදී! **ජරාව** නම්- ස්කන්ධයන්ගේ දිරීම යැ. **මරණය** නම්:- ස්කන්ධයන්ගේ බිඳීම යැ. **ශොකය** නම්- ඒ ඒ ව්‍යසනාදියෙන් පෙළෙන්නවුන්ගේ ශොකකිරීම් ආකාරයෙන් පවත්නා දෞර්මනස යැ **පරිදෙවය** නම්- එබන්දන්ගේ වැළපීම යැ. **දුක්ඛ** නම්- කායික දුඃඛ යැ. **දොමනස්ස** නම් මානසික දුඃඛ යැ. **උපායාසය** නම්- දැඩිආයාසය යි, හෙවත් ශොකකිරීම් ආදියෙන්වන වෙහෙස යැ.

ශොකය මදගින්නෙන් භාජනයක්තුළතිබෙන කිසිවක පැසීම වැනි යැ. පරිදෙවය එයම දැඩිගින්නෙන් පැසීමෙන් භාජනයෙන් පිටත වැගිරීම වැනි යැ උපායාසය බැහැර වැගිරීමෙන්පසු වැගිරීමට නොහැකිව ඉතිරි ව පැසී පැසී තිබෙන කොටස වැනි යැ.

ජාතිය ජරාමරණාදියට ප්‍රත්‍යය වන්නේ කෙසේ ද? යමකුගේ උත්පත්තිසංඛ්‍යාත ජාතියක් නොවේ නම් දිරීම් විනාශවීම් ආදියක් නොවේ ම යැ. දිරීම් නැතිවීම් ආදියට භාජනවන කෙනෙකුම නැති බැවිනි. එහෙයින් ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණාදිය වන්නේ යැ යි දතයුතු.

**පටිච්චසමුප්පාදය** පිළිබඳව ප්‍රත්‍යය ධර්මයන්ගේ හා ප්‍රත්‍යයොත්පන්නධර්මයන්ගේ ඉතා කෙටි හැඳින්වීමකි. මේ දක්වනලද්දේ.

විශෙෂාවබොධය අපෙක්ෂාකරන්නවුන් විසින් විශුඩිමාගීය බලා ඉගෙන ගතයුතු තවද "අවිජ්ජාපච්චයාසඞ්ඛාරා" යනාදීන් දෙශනාකරන ලද්දේ අඬය ක්‍රමය යි. හෙවත් අවිද්‍යාදිය ප්‍රත්‍යය කොටගෙන සංස්කාරාදිය වීමෙන් ක්‍රමයෙන් සත්ත්‍වයා සසර බැඳි බැඳී දුක්රාශියකින් මැඩෙමින් සිටිනආකාරය යි.

"අවිජ්ජායත්වෙ'ව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො." යනාදීන් දෙශනාකරනලද්දේ ව්‍යතිරෙක ක්‍රමය යි. අවිද්‍යාදි ප්‍රත්‍ය සිඳලීමෙන් ප්‍රත්‍යොත්පන්නධර්ම ද සිඳදමා සත්ත්‍වයා සසරින් එතර වනආකාරය එයින් ප්‍රකාශ වේ. එය මතුසූත්‍රයෙහි මනාව විස්තර වන හෙයින් හා මේ අනුසාරයෙන්ම දතහැකි හෙයින් ද මෙහිදී විස්තර කිරීම ආවශ්‍යක නොවේ.

**වො:–** මෙය පච්චත්ත, උපයොගාදි අර්ථයන්හි වැටේ. එය දැන ගැනීම ප්‍රයොජනවත් වේයැයි හැඟෙනහෙයින් අඬක්ෂිපයක වැටෙනඅයුරුමෙහි දක්වන්නෙමු.

"කච්චි පන වො අනුරුඩා සමග්ගා සම්මොදමනා."– අනුරුඩයෙනි! කිම යුෂ්මත්හු එකඟවූවාහු– සතොසවූවාහුද? යනු යි. මෙහි වො යනු පච්චත්ත (ප්‍රථමා) අර්ථයෙහි යෙදිණි.

"ගච්ඡථ භික්ඛවෙ පණාමෙමි වො"– මහණෙනි! යව් තොප මෙයින් නෙරපමි, යනු යි. මෙහි වො යනු උපයොගා (විතීයා) ර්ථ වාචක යි.

"න වො මම සන්තිකෙ වත්තබ්බං"– තොප මාගමුයෙහි නොවැසිය යුතු, යනු යි. මෙහි වො යනු කරණාර්ථ වාචක යි.

"වනපත්ථ පරියායං වො භික්ඛවෙ දෙසිස්සාමි" මහණෙනි! නුඹලාට වනප්‍රාන්ත ධර්මක්‍රමය දෙශනාකරමි යනු යි. මෙහි වො යනු සම්ප්‍රදානාර්ථ වාචක යි.

"සබ්බෙසං වො සාරිපුත්තා සුභාසිතං."– ශාරිපුත්‍රයෙනි! තොප සියල්ලන්ගේ භාෂිතය මනාය, යනු යි. මෙහි සාම්‍යර්ථ වාචක යි.

"යෙහි වො අරියා පරිසුඩ කම්මන්තා."– පිරිසුදුකර්මාන්තාඇති යම් ආයර්‍යකෙනෙක් වෙද්ද, යනු යි මෙහි වො යනු පදපූරණයෙහි යි. මෙසේ නොයෙක් අර්ථඇති වො යන පදය මේ සූත්‍රයේදී සම්ප්‍රදානාර්ථය ප්‍රකාශ කොරෙයි

**සාධුකං මනසි කරොථ:–** සාධුකං යනු ද සාධු යනු ද එකාර්ථ වාචක යි. සාධු ශබ්දය ආයාචන, සම්පටිච්ඡන, සම්පහංසන, සුන්දර, දළ්හිකම්ම යනාදි අර්ථයන්හි දක්නා ලැබේ.

"සාධු මෙ භන්තෙ! භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු."– භාග්‍යවතුන් වහන්සේ මට සැකෙවින් දහම්දෙසනසේක්නම් මැනවි, යනු යි. මෙහි සාධු ශබ්දය **ආයාචනාර්ථයෙහි** යෙදී තිබේ

"සාධු භන්තෙ'ති බො සො භික්ඛු භගවතො භාසිතං අනුමොදිත්වා"– යහපත ස්වාමිනි! කියා ඒභික්ෂුව භාග්‍යවතුන්ගේ භාෂිතය අනුමෝදන් ව, යනු යි. මෙහි සාධු ශබ්දය **සම්පටිච්ඡන** (=පිළිගැනීම් අර්ථයෙහි යෙදී තිබේ.

"සාධු සාධු **සාරිපුත්ත**."– ශාරිපුත්‍රය, යහපත! යහපත!! යනුයි. මෙහි සාධු ශබ්දය **සම්පහංසනාර්ථයෙහි** යෙදී තිබේ.

"සාධු ධම්මරුචි රාජා– සාධු පඤ්ඤාණවා නරො,
සාධු මිත්තානමද්දුබ්භො–පාපස්ස අකරණං සුඛං."

ධර්මයට රුචිකරණරජ මනවඩන්නේ ය. ප්‍රඥවත් මනුෂ්‍යයා ද එසේම මනවඩන්නේ ය, මිත්‍රයනට ද්‍රොහ නොකරන්නා ද එසේම මනවඩන්නේ ය, පව් නොකිරීම ද මනොඥ ය, යනු යි. මෙහි සාධු ශබ්දය **සුන්දරාර්ථයෙහි** යෙදී තිබේ

"තෙනහි හි බ්‍රාහමණ! සාධුකං සුණාහි".– එසේනම් බමුණ! මනාව අසව,– යනු යි මෙහි සාධු ශබ්දය **දෘඪකිරීම්අර්ථයෙහි** යෙදී තිබේ.

මේ සූත්‍රයේදී කියනලද සාධු ශබ්දය ද පසුව සඳහන් කැරුණු අර්ථය ගෙනදෙයි.

**මනසිකාරෙථ**:– නොවිසුරුණු සිතින් යුක්තව ශ්‍රවණය කරව් යනාර්ථ යි. "තං සුණාථ" යනුවෙන් ශ්‍රවණෙන්ද්‍රියයාගේ වික්ෂෙපය වළකා 'සාධුකං මනසි කරෙථ" යනුවෙන් මනෙන්ද්‍රියයාගේ වික්ෂෙපය වළකා. එසේම පළමුපදයෙන් ව්‍යඤ්ජනවිපර්‍ය්‍යාසග්‍රහණය ද, දෙවැන්නෙන් අර්ථවිපර්‍ය්‍යාසග්‍රහණය ද නිවාරණය කරනලදී. එසේම පළමුපදයෙන් ධර්මශ්‍රවණයෙහි යෙදවීම ද දෙවැන්නෙන් ශ්‍රැත ධර්මය මනාවදැරීමෙහි යෙදවීම ද කරනලදී.

තවද පළමුපදයෙන් මේ ධර්මය සව්‍යඤ්ජනය. එහෙයින් ශ්‍රවණීය යැ, යනු ද, දෙවැන්නෙන් මේධර්මය අර්ථසහිතය. එහෙයින් මෙනෙහිකළයුතු ය, යනු ද දක්වනලදී.

"සාධුකං" යනු "සුණාථ," "මනසිකාරෙථ" යන දෙපදය හා සම්බන්ධකොට ද අර්ථගතහැකි යැ. එකලැ යම්හෙයකින් මේධර්මය ධර්මගම්භීරත් වෙයි ද, දෙශනාගම්භීරත් වෙයි ද, එහෙයින් මනාව

අසව්. එසේම යම්හෙයකින් මේධම්ය අර්ථහෙයිනුත් ගැඹුරු වෙයි ද, ප්‍රතිවෙධකිරීම් වශයෙනුත් ගැඹුරු වෙයි ද, එහෙයින් මනාව මෙනෙහිකරව් යන අදහස ප්‍රකාශ කෙරෙයි.

**භාසිස්සාමි:**– "තං සුණාථ" යනුවෙන් ප්‍රතිඥතවූ ධම්ය විස්තර වශයෙන් දෙශනාකරම් යනු යි. "දෙසෙති" යන වචනය සංක්‍ෂෙප වාචක ද, "භාසති" යන වචනය විස්තර වාචක ද වෙති.

එහෙයින් කියනලදි **වංගීස** තෙරුන් විසින් "සංඛිත්තෙන පි දෙසෙති– විත්ථාරෙන පි භාසති." **සංක්‍ෂෙපවශයෙන් ද** දෙශනා කරයි, විස්තරවශයෙන් ද වදරයි, යනුයි.

මෙසේ වදාළකල්හි හටගත් උත්සාහඇති ඒ භික්‍ෂූහු ස්වාමීනි භාග්‍යවතුන්වහන්ස! එසේය යි කියා භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ හෙවත් ශාස්තෘන් වහන්සේගේ වචනය පිළිගත්හ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "කතමො ච භික්ඛවෙ! පටිච්චසමුප්පාදො" යනාදිවශයෙන් සියලුසූත්‍රය දෙසූසේක.

**කතමො ච භික්ඛවෙ පටිච්චසමුප්පාදො:**- මහණෙනි! පටිච්ච සමුප්පාදය නම් කවරේ ද? යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්න කළ සේක. මතුසඳහන්වන පරිදි පටිච්චසමුප්පාදය දෙශනාකරනු කැමැත්තෙන් මෙසේ ප්‍රශ්නකළහෙයින් මෙයට **කථෙතුකම්‍යතා පුච්ඡා** යැ යි කියනුලැබේ.

අදිට්ඨජෝතනාපුච්ඡා – දිට්ඨසංසන්දනාපුච්ඡා - විමතිච්ඡේදනා පුච්ඡා,– අනුමතිපුච්ඡා,– කථෙතුකම්‍යතාපුච්ඡා,– යනුවෙන් පුච්ඡාව (ප්‍රශ්නකිරීම) පස්අයුරකින් වේ.

ප්‍රකෘතියෙන්ම නොදන්නාලද නොදක්නාලද– ප්‍රමාණ නොකරනලද– තීරණය නොකරනලද– ප්‍රකටනොවූ– පුරුදු නොකරනලද යම්ස්වභාවයක් දැනීම්– දැකීම් ආදිය පිණිස ප්‍රශ්න කිරීම **අදිට්ඨජෝතනාපුච්ඡා** නමි.

ප්‍රකෘතියෙන්ම තමන් විසින් දන්නාලද– දක්නාලද– ප්‍රමාණ කරනලද– තීරණයකරනලද– ප්‍රකටවූ– පුරුදුකරනලද යම්කිසිවක් අන්‍යපණ්ඩිතයන්ගේ දැනීම් දැකීම් ආදිය හා සමානකර බැලනුවස් ප්‍රශ්නකිරීම **දිට්ඨසංසන්දනාපුච්ඡා** නමි.

තමන්හට සැකසහිත– ස්ථිරත්වයකට බැසගැනීමට නොහැකි යම්කිසිවක් සැකය දුරලනුවස් විචාරීම **විමතිච්ඡේදනාපුච්ඡා** නමි.

"තං කිං මඤ්ඤථ භික්ඛවෙ! රූපං නිච්චං වා අනිච්චං වා ති? අනිච්චං භන්තෙ; යං පන අනිච්චං දුක්ඛං වා තං සුඛං වා ති"? (මහණෙනි! මෙය කුමකැයි සිතන්නහුද රූපය නිත්‍ය ද? නැත

හොත් අනිත්‍ය ද? අනිත්‍යය සවාමීනි යමක් අනිත්‍යනම් එය දුක ද? නැතහොත් සැප ද?) යනාදි විසින් විචාරනුලබන්නහුගේ අනුමතිය ලබනුවස් විචාරීම **අනුමතිපුච්ඡා** නම්.

“චත්තාරො’මෙ භික්ඛවෙ සතිපට්ඨානා. කතමෙ චත්තාරො” (=මහණෙනි! මේ සතර සතිපට්ඨානයෝ වෙති කවර සතරෙක්ද? යත්)- යනාදි විසින් කියාදෙනු කැමැත්තෙන් ප්‍රශ්නකිරීම **කථෙතුකම්‍යතාපුච්ඡා** නම්.

මෙහි ප්‍රථමයෙන් කියනලද ත්‍රිවිධපුච්ඡාවෝ බුදුවරයනට නැත්තාහ.

බුදුවරයනට නොපැනෙන කාලත්‍රයවර්ත්ති කිසිවක් නොමැති හෙයින් අදිට්ඨජෝතනාපුච්ඡාවක් නැත.

යමක් භාග්‍යවතුන් වහන්සේ තමන්වහන්සේ විසින්ම ප්‍රතිවෙධකරනලද ද එයට අන්‍ය ශ්‍රමණ- බ්‍රාහ්මණ- දෙව- මාර- බ්‍රහ්ම යන මොවුන් විසින් අවබොධකරනලද්ද හා සංසන්දනයකර බැලීමක් උවමනානොකරනහෙයින් දිට්ඨසංසන්දනාපුච්ඡාවක් ද බුදුවරයනට නැත.

භාග්‍යවතුන් වහන්සේ නසනලද විචිකිච්ඡා ඇතිසේක. සියලු ධර්මයන්විෂයෙහි පවත්නා සංශය නසාලූ සෙයෙක. මෙසේ කිසිවක් කෙරෙහි විමතියක්- සැකයක් නොමැත එහෙයින් බුදුවරයනට විමතිච්ඡෙදනාපුච්ඡාවක් ද නොමැත. ඉතිරි දෙවැදෑරුම් පුච්ඡාවෝ බුදුවරයනට විද්‍යමාන වෙති.

**අවිජ්ජා පච්චයා භික්ඛවෙ! සංඛාරා:-** මහණෙනි! අවිද්‍යා ප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ සම්භවවන්නාහුය යනාර්ථ සි. පියා කියම් සි, පටනගෙන ‘තිස්සගේ පියා, සුමනගේ පියා” යනාදි ක්‍රමයෙන් පුත්‍රයාම යම්සේ පළමුකොට කියයි ද එසේම ප්‍රත්‍යය ධර්ම දෙශනාකිරීමට පටන්ගෙන “අවිජ්ජාපච්චයා සංඛාරා” යනාදි ක්‍රමයෙන් සංස්කාරයනට ප්‍රත්‍යවූ අවිද්‍යාදිධර්ම කියනසේක් සංස්කාරාදි ප්‍රත්‍යයොත්පන්නධර්ම දෙශනාකළසේක.

ආහාර වර්ගයාගේ කෙළවර “පටිච්චසමුප්පාදඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි, පටිච්චසමුප්පන්නෙ ච ධම්මෙ” යනුවෙන් ප්‍රත්‍යය, ප්‍රත්‍යයොත්පන්නය යන දෙකම පටන්ගෙන දෙකම වදාළ සෙයෙක. “අවිජ්ජාපච්චයා සංඛාරා” යනාදීන් දක්වනලද්දේ අනුලොම ක්‍රමය සි. මෙහි ද විස්තර මීළඟ සූත්‍රය බලා දතයුතු.

**අවිජ්ජායත්වෙව අසෙස විරාග නිරොධා සඞ්ඛාරනිරොධො:-** අවිද්‍යාවගේම විරාගසංඛ්‍යාත මාර්ගයෙන් අශෙෂනිරොධයෙන් සංස්කාරනිරොධය වේ යනාර්ථයි. මේ ආදි ක්‍රමයෙන් දක්වනලද්දේ ප්‍රතිලොමක්‍රමය යි. මෙහි විස්තර ද මතු සූත්‍රයේදී දතහැකිය.

**කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති:-** සියලුම හෙවත් සත්ත්ව පුද්ගල විරහිතහෙයින් සුද්ධවූ දුඃඛරාශියගේ අනුත්පාද නිරොධය වේ යනාර්ථ යි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ අනුලොමවශයෙන් දොළොස් පදයකින් වෘත්ත (=සත්ත්වයාගේ පැවැතීමට) කථාව වදාරා එම වෘත්තයම විනිවර්ත්තනයකොට ප්‍රතිලොමවශයෙන් ද දොළොස්පදය කින් සංසාරයාගේ නැවැත්ම වදාරණසේක් දෙශනාව අර්හත්වයෙන් කුළුගැන්වූ සේක.

දෙශනාවසානයෙහි ආරබ්ධවිදර්ශනාඇති උග්ඝටිතඥපුද්ගල වූ ඒ පන්සියයක්දෙනාවහන්සේ මූහුකළපියුම් හිරුරැසින් ප්‍රබොධවන්නාසේ දහම්රැසින් ප්‍රබොධ වූහ. හෙවත් උතුම්වූ අර්හත්වයට පැමිණියහ.

**භගවතො භාසිතං අභිනන්දුන්ති:** කරවීක (=කුරවිකෙවිලි) නාදයසේ මිහිරිවූ කර්ණයනට සුඛඵලවත පණ්ඩිතජනයන්ගේ හෘදයනට අමෘතාභිෂෙකයක් බඳුවූ බ්‍රහ්මස්වරයෙන් දෙශිත භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්හ, අනුමොදන් වූහ, යනුයි. එහෙයින් කියනලදී

සුභාසිතං සුලපිතං
සාධු සාධූති තාදිනො,
අනුමොදමානා සිරසා
සම්පටිච්ඡිංසු භික්ඛවො'ති.

තාදිගුණයෙන් යුක්තවූ භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශිත සුභාෂිතය ඒ භික්ෂූහු යහපත! යහපත!! ස්වාමීනි, යි කියා අනුමොදන් වෙමින් මස්තකයෙන් පිළිගත්හ

---

**ප්‍රථම ප්‍රතීත්‍යසමුත්පාද සූත්‍රවර්ණනාව
මෙතෙකින් සමාප්තයි.**

---

## පදවි:-

1 භික්ඛවෙ, මහණෙනි! ජරාමරණං; ජරාව හා මරණය; කතමඤ්ච, කවරේ ද? තමහිතමහි සත්තනිකායෙ, ඒ ඒ සත්වනොවර්ගයෙහි; තෙස තෙසං සත්තානං, ඒ ඒ සත්වයන් පිළිබඳ; යා ජරා, යම්බඳු ජරාවක් වන්නි ද; ජීරණතා, යම්බඳු දිරීම් සවභාවයක් වන්නේ ද; ඛණ්ඩිච්චං, යම්බඳු කැඩීම්සවභාවයක් වෙයි ද; පාලිච්චං, කෙශලොමයන්ගේ යම්බඳු පැසීම්බවක් වෙයි ද, වලිත්තචතා, මස් ආදිය ක්ෂයවීමෙන් සමෙහි යම්බඳු රැලිවැටීමක් වේ ද; ආයුනො, ආයුෂයාගේ; සංහානි, පිරිහීමක්වෙයි ද; ඉන්ද්‍රියානං, චක්ෂුරාදි ඉන්ද්‍රියයන්ගේ; පරිපාකො, යම්බඳු මුහුකිරීමක් හෙවත් දිරීම්සවභාවයක් වෙයි ද; අයං, මෝතොමෝ; ජරා, ජරායැයි; වුච්චති, කියනුලැබේ. (සෙස්ස පෙරමෙනි)

2 මරණං, මරණය; කතමඤ්ච, කවරේද? තෙසංතෙසං සත්තානං, ඒඒ සත්වයනට, තම්හාතම්හා සත්තනිකායා, ඒඒ සත්වනිකායයෙන්; චුති, යම්බඳු චුතියක් වන්නි ද; චවනතා, යම්බඳු චවන සවභාවයක් වන්නේ ද; භෙදො, ස්කන්ධයන්ගේ යම්බඳු බිඳීමක් වන්නේ ද; අන්තරධානං, යම්බඳු අතුරුදන්වීමක් වන්නේ ද; යං මච්චුමරණං, යම්බඳු මෘත්‍යුසඞ්ඛ්‍යාත මරණයක් වන්නේ ද; කාලකිරියා, යම්බඳු කාලක්‍රියාවක් වන්නේ ද; ඛන්ධානං භෙදො, ස්කන්ධයන්ගේ යම්බඳු බිඳීමක් වන්නේ ද; කළෙබරස්ස නික්ඛෙපො, යම්බඳු ශරීරයාගේ බහාතැබීමක් වන්නේ ද; ඉදං, මේ; මරණං, මරණයැයි; වුච්චති, කියනුලැබේ භික්ඛවෙ, මහණෙනි; ඉති, මෙසේ; අයඤ්චජරා, මේ ජරාව ද; ඉදඤ්චමරණං මේ මරණය ද යන; ඉදං, මෙය; ජරාමරණං, ජරාමරණයැයි; වුච්චති, කියනුලැබේ.

3 ජාති, ජාතිතොමෝ - යාජාති, ආයතනයන්ගේ අසම්පූර්ණබවයඇති යම්බඳු උත්පත්තියක් වන්නි ද; සංජාති, ආයතනයන්ගේ සම්පූර්ණබවයඇති යම්බඳුඋත්පත්තියක් වන්නී ද; ඔක්කන්ති, අණ්ඩජ- ජලාබුජ සත්වයන්ගේ යම්බඳු පිළිසිඳගැනීමක් වන්නේ ද; අභිනිබ්බත්ති, සංසෙදජ- ඔපපාතික සත්වයන්ගේ යම්බඳු උත්පත්තියක් වන්නේ ද; ඛන්ධානං ස්කන්ධයන්ගේ; පාතුභාවො, යම්බඳු පහලවීමක් වන්නේ ද; ආයතනානං, චක්ෂුරාදි ආයතනයන්ගේ; පටිලාභො, සන්තතියෙහිදී යම්පහලවීමක් වන්නේ ද; භික්ඛවෙ, මහණෙනි! අයං, මෝතොමෝ; ජාති, ජාතියැයි; වුච්චති, කියනුලැබේ

4 කාමභවො, කාමභවය; රූපභවො; රූපභවය අරූපභවො, අරූපභවය- යන ඉමෙ තයො භවා, මේ භව තුනක් වෙති. භික්ඛවෙ, මහණෙනි! අයං මේ; භවො, භවයැයි; වුච්චති, කියනුලැබේ.

5 උපාදානං, දැඩිග්‍රහණය - භික්ඛවෙ, මහණෙනි! කාමූපාදානං, කාමොපාදානය; දිට්ඨුපාදානං, දෘෂ්ට්‍යුපාදානය; සීලබ්බතූපාදානං, ශීලව්‍රතොපාදානය; අත්තවාදූපාදානං, ආත්මවාදොපාදානය යන, ඉමානි චත්තාරි උපාදානානි, මේ සතර උපාදානයෙනෙක් වෙත්. භික්ඛවෙ, මහණෙනි! ඉදං, මෙය; උපාදානං, උපාදානයැ යි; වුච්චති, කියනුලැබේ.

6 රූපතණ්හා, රූපතෘෂ්ණාවය; සද්දතණ්හා ශබ්දතෘෂ්ණාවය; ගන්ධතණ්හා, ගන්ධතෘෂ්ණාවය; රසතණ්හා, රසතෘෂ්ණාවය; ඵොට්ඨබ්බතණ්හා, ස්පර්ශතෘෂ්ණාවය; ධම්මතණ්හා ධර්මතෘෂ්ණාවය යන; ඉමෙඡ, මොව්හු සදෙන; තණ්හා, තෘෂ්ණා නම් වෙත්.

7 චක්ඛුසම්ඵස්සජා, චක්ෂුස්පර්ශ හෙතුවෙන් හටගත්; වෙදනා, වෙදනාවය; සොතසම්ඵස්සජා, ශ්‍රොතස්පර්ශහෙතුවෙන් හටගත්; ඝානසම්ඵස්සජා, ඝ්‍රාණස්පර්ශහෙතුවෙන් හටගත්; ජිව්හාසම්ඵස්සජා, ජිව්හාස්පර්ශ හෙතුවෙන් හටගත්; කායසම්ඵස්සජා, කායස්පර්ශ හෙතුවෙන් හටගත්; මනොසම්ඵස්සජා; මනඃසම්ප්‍රයුක්ත ස්පර්ශ හෙතුවෙන් හටගත්; වෙදනා වෙදනාවය යන ඉමෙඡ, මොව්හු සදෙන; වෙදනාකායා, වෙදනා සමූහයෝයි.

8 චක්ඛුසම්ඵස්සො, චක්ඛුසම්ඵස්සය; සොතසම්ඵස්සො, සොතසම්ඵස්සය; ඝාන-පෙ- මනොසම්ඵස්සො, මනඃසම්ප්‍රයුක්තවූ ස්පර්ශය යන ඉමෙඡ, මොව්හුසදෙන; ඵස්සකායා, ස්පර්ශසමූහයෝ යි.

9 චක්ඛායතනං, චක්ෂුරායතනය; සොතායතනං-පෙ- මනායතනං, මනායතනය යන; ඉදං, මෙය; සළායතනං, ෂඩායතනයැ යි වුච්චති, කියනුලැබේ.

10 නාමරූපං, නාමය හා රූපය- වෙදනා, වෙදනාස්කන්ධය; සඤ්ඤා, සංඥාස්කන්ධය; චෙතනා- ඵස්සො- මනසිකාරො, චෙතනාවය- ස්පර්ශය- මනසිකාරය හෙවත් සංස්කාරස්කන්ධය යන; ඉදං, මෙය; නාමං නාමයැයි; වුච්චති, කියනුලැබේ.

චත්තාරො මහාභූතා ච, සතරමහා භූතයෝද; චතුන්නං මහාභූතානං, සතරමහාභූතයන්; උපාදාය, ගෙන; නොහොත් සතර මහාභූතයන් නිසා පවත්නාවූ; රූපඤ්ච, රූපය ද යන; ඉදං, මෙය-

11 චක්ඛුවිඤ්ඤාණං, චක්ෂුසෙහි නොහොත් චක්ෂුසින් හටගත් විඥානය;-පෙ- මනොවිඤ්ඤාණං, මනොවිඥානය; හෙවත් දෙපස් විඥානයන් වර්ජිතකොට ඇති ත්‍රෛභූමික විපාකචිත්තය-

12 කායසඞ්ඛාරො, කායද්වාරයෙහි ව්‍යතික්‍රමණවශයෙන් හටගත් චෙතනාරාශිය; වචී-පෙ- චිත්තසඞ්ඛාරො, හුදුචිත්තයෙන් හටගත් චෙතනාරාශිය-

13 දුක්ඛ, දුඃඛාර්‍ය්‍යසත්‍යයෙහි; අඤ්ඤාණං, නොදැන්මය- දුක්ඛසමුදයෙ, දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍යයෙහි- දුක්ඛ නිරොධෙ දුඃඛ නිරොධාර්‍ය්‍යසත්‍යයෙහි දුක්ඛනිරොධගාමිනී පටිපදාය, දුඃඛනිරොධ ගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍යයෙහි-

14–15 යන කොටස් හා සෙස්ස සුගමයි.

2=විභඞ්ගසුත්තං දුතියං (දෙවැනි විභඞ්ගසූත්‍රය යි.)

---

## විස්තරය.

**පටිච්චසමුප්පාදං**:- මෙම "විභඞ්ග" සූත්‍රයෙන් ද ප්‍රකාශිතුයේ පටිච්චසමුප්පාදය ය. පළමු "පටිච්චසමුප්පාද" සූත්‍රය උග්ඝටිතඤ්ඤු පුද්ගලයන්ගේ වශයෙන් සංක්‍ෂෙපයෙන් දෙශිත ය. මෙම සූත්‍රය විපඤ්චිතඤ්ඤු පුද්ගලයන්ගේ වශයෙන් විස්තරහෙයින් දෙශිත යි. පටිච්චසමුප්පාද යන්නෙහි විස්තරය යට දක්වනලදී. ප්‍රතීත්‍යසමුත්පාද දෙශනාක්‍රමය දැනගනුවස් වල්ලහාරක (=වැල්අදින) පුරුෂයන් සතරදෙනාගේ උපමාව ඉගෙනගතයුතු

වැල්ඇදීමපිණිස වනයටවන් පුරුෂයන් සතරදෙනා අතුරෙන් එකෙක් වැලෙහි මුලම ප්‍රථමයෙන් දැක සිඳගෙනවිත් තමනට උව මනා කටයුත්තෙහි යොදයි. එසේම භාග්‍යවතුන්වහන්සේ විසින් "අවිජ්ජාපච්චයා සඞ්ඛාරා-පෙ- ජරාමරණං" යනාදීන් ඇතැම් තැනෙක මුලසිට අගදක්වා පටිච්චසමුප්පාදය දෙශනාකරනලදී

දෙවැන්නා වැලෙහි මැද දැක මැදින් සිඳ අගකොටස ගෙනවිත් උවමනා කටයුත්තෙහි යොදයි. එසේම භාග්‍යවතුන්වහන්සේවිසින් "තස්ස තං වෙදනං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨ තො උප්පජ්ජති නන්දි" යනාදිවශයෙන් ඇතැම්තැනෙක මැදසිට කෙළවර දක්වා දෙශිත යි.

තෙවැන්නා වැලඅග පළමුකොට දැක අගගෙන ඒ අනුසාරයෙන් ගොස් මුලසොයා සිඳගෙනවිත් කම්න්තයෙහි යොද යි. එසේම භාග්‍යවතුන්වහන්සේවිසින් "ජාතිපච්චයා ජරාමරණං භවපච්චයා ජාති" යනාදිනයින් ඇතැම්තැනෙක අගසිට මුලදක්වා දෙශිත යි.

සතරවැන්නා වැලෙහි මැදම පළමුකොට දැක මැදින් සිඳ අග කොටස අතහැර මුලදක්වා ගෙනැවිත් තමනට උවමනා කටයුත්තෙහි යොදයි එසේම භාග්‍යවතුන්වහන්සේ විසින් "ඉමෙ චත්තාරො ආහාරා කිංනිදානා-පෙ-තණ්හානිදානා" යනාදීන් ඇතැම් තැනෙක මැදසිට පටන්ගෙන මූලදක්වා දෙශනා කරනලදී.

මෙම "විභඞ්ග" සූත්‍රය දෙශනා කරනලද්දේ මෙහි කී තෙවැනි ක්‍රමය අනුව යැ. එනම් පටිච්චසමුප්පාදයාගේ අගවූ ජරාමරණයෙන් පටන්ගෙන මූලයවූ අවිද්‍යාවදක්වා වට්ටවිවට්ටය දෙශනාකරණසේක් නිමාවට පැමිණවූ සේක.

**යා තෙසං තෙසං**:-සාධාරණ වශයෙන් සියලු සත්වයන් මෙයින් අදහස් කරන ලදි. "යා දෙවදත්තස්ස ජරා, සොමදත්තස්ස ජරා" යනාදීන් එක එක පුද්ගලයාගේ නම්ගෙන කියනලද්දේ නම් සත්වයන් අනන්තහෙයින් කෙළවර කළ නොහැක්ක එහෙයින් "සියලුසත්වයන් පිළිබඳ ජරාව" දැක්වීමට මෙසේ සාධාරණ වශයෙන් ගන්නා ලදී.

**වලිත්තචතා**:- සිරුරෙහි මස් ක්ෂයවීමෙන් සමෙහි රැලිවැටීම ඇති බවය කැඩීම, පැසීම, රැලිවැටීම කල්යාමෙන් සිදු වේ. එකල්හි ජරාවෙන් වන විකාරයන් දක්නාලැබෙන හෙයින් ඊට ප්‍රකටජරාව යැ යි, කියනු ලැබේ. එහෙත් ජරාතොමෝ දක්නට නොහැක්කිය. දිය-ගිනි-සුලං කාරණකොටගෙන ගස් වැල් ආදියගේ සුණුවිසුණුවීම දැවීම ආදිය දක්නාලැබීමෙන් ඔවුන්ගේ ගතමාර්ගය යම්සේ ප්‍රකට වේ ද? එසේම ශරීරයාගේ කැඩීම, බිඳීම ආදියෙන් ජරාව ගිය මාර්ගය ප්‍රකට වේ. කැඩීම, බිඳීම ආදිය ජරා නොවේ.

**ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො**:-කල්ගතවූ කල්හි අතිශයින් ප්‍රකටව පැනෙන ආයුෂයාගේ ක්ෂයභාවය හා චක්ෂුරාදි ඉන්ද්‍රියයන්ගේ මුහුකුරීම් බව ද යන ජරාවගේ ප්‍රකෘතිස්වභාවයන් මෙයින් දක්වන ලදී.

ජරාවට පැමිණියහුගේ ආයුෂය පිරිහෙයි. එහෙයින් ඵලය අපෙක්ෂාකොට ජරාවට "ආයුනො සංහානි" යි, කියන ලදී. [සත්වයා ළදරුකල ඔහුගේ චක්ෂුරාදි ඉන්ද්‍රියයෝ අතිශයින් ප්‍රසන්න වෙති. එහෙයින් එම ඉඳුරනට විෂයවූ සියුම් වූ රූපාදිය පවා ගැනීමට සමත් වෙති. ජරාවට පැමිණියහුගේ එම ඉන්ද්‍රියයෝ මුහුකුරීමට ගියාහු කැළඹුනාහු නිර්මල නුවූවාහු වෙති. එහෙයින් තමන්ගේ විෂයට පැමිණි මහත්වූ ද රූපාදිය පවා ගැනීමට අපොහොසත් වෙති. එහෙයින් ඵලය අපෙක්ෂාකොට ජරාවට "ඉන්ද්‍රියානං පරිපාකො" යි ද, කියන ලදි.

මෙසේ දක්වනලද ජරාතොමෝ ප්‍රකට ජරාවය, ප්‍රතිච්ඡන්නා ජරාවයැ යි දෙපරිදි වන්නිය. රූපධර්මයන්හි පවත්නා ජරාව ප්‍රකටජරා නම්. දත්සැඩීම, ඇඟරැලිවැටීම ආදිය දක්නා ලැබෙන හෙයිනි.

අරූපධර්මයන්හි පවත්නා ජරාව **ප්‍රතිච්ඡන්නජරා** නම්. එබඳු විකාරයක් දක්නට නැති හෙයිනි.

නැවත අවීචි සවීචි වශයෙන් ද ජරාතොමෝ ද්විප්‍රකාර වන්නිය.

යමක අතරට වීචියැ යි, කියනු ලැබේ එබඳු අතරක් නැත්තේ අවීචි නම්. එහෙයින් **අවිචිජරා** නම් නිරන්තර ජරාව යි. මණි, කනක, රජත, ප්‍රවාල, චන්‍ද්‍ර, සූර්‍ය්‍යාදීන්ගේ මෙන් ද, මන්දදශකාදී යෙහි සත්වයන්ගේ මෙන් ද, පුෂ්ප. ඵල, පල්ලවාදී අප්‍රාණීන්ගේ මෙන් ද, අතරතුර ඇතිවන වර්ණවිශෙෂාදිය දක්නට නොහැකි හෙයින් ඕ අවීචිජරා නම් වන්නී ය.

එයින් අන්‍යවූ අතරතුර වර්ණවිශෙෂාදිය මනාව දර්ශනයකළ හැකි ජරාතොමෝ **සවීචිජරා** නම් වන්නී ය.

**කාලකිරියා**:-කාල යනු අන්තක ය. හෙවත් මරු ය. ඔහුගේ ක්‍රියාව හෙවත් මරණ **කාලකිරියා** නම්. මෙයින් ලොකසම්මත මරණය දක්වයි. "ඛන්ධානං භෙදො" යනාදීන් දක්වනලද්දේ පරමාර්ථ හෙයිනි. පරමාර්ථ හෙයින් සත්ව, පුද්ගල යනාදීන්ගේ මරණය කියා දෙයක් නැත. පවත්නේ ස්කන්ධයන්ගේ භෙදය යි. ස්කන්ධයන් බිඳුණු කල්හි සත්වයා මළේය. යන ව්‍යවහාරය වෙයි.

මෙහි පඤ්චවොකාර (=ස්කන්ධ) චතුවොකාර වශයෙන් "ඛන්ධානං භෙදො" යි කියන ලදී. එකවොකාර වශයෙන් "කළෙබරස්ස නික්ඛෙපො" යි කියන ලදී. එසේ නැතහොත් චතුවොකාර වශයෙන්ද "ඛන්ධානං භෙදො" යනු ද, පඤ්චවොකාර එකවොකාර වශයෙන් "කළෙබරස්ස නික්ඛෙපො" යනු ද කියන ලදී. කුමක් හෙයින්ද? යත්-- භව දෙකෙහි ද රූපකාය සඞ්ඛ්‍යාත කළෙබරය ලැබෙන හෙයිනි. නොහොත් චාතුර්මහාරාජිකාදි දිව්‍යලෝකයන්හි ස්කන්ධයන්ගේ බිඳීම පවතියි. නමුත් බැහැරකළයුතු කිසිවක් නොපවතී යි. එහෙයින් ඔවුන්ගේ වශයෙන් ස්කන්ධභෙදය වෙයි. මනුෂ්‍යාදීන් කෙරෙහි කළෙබරය නික්ෂෙපය ද වෙයි. මෙහි "කළෙබරස්සනික්ඛෙපො" යනුවෙන් මරණය දක්වන ලදී. මෙසේ ජරාව හා මරණය එක්කොට **ජරාමරණං** යි කියනු ලැබී.

**ජාති සඤ්ජාති**-පෙ අසං වුච්චති භික්ඛවෙ ජාති:-මෙයින් සත්වයාගේ උත්පත්තිය ප්‍රකාශිත යි. අසම්පූර්ණවූ චක්ෂුරාදි ආයතන ඇතිව වන්නාවූ ඉපදීම **ජාති** නම්. සම්පූර්ණවූ ආයතනයන්ගෙන් යුක්තව වන්නාවූ ඉපදීම **සංජාති** නම්.

අණ්ඩජ, ජලාබුජ, සංසෙදජ, ඕපපාතික වශයෙන් සත්වයන්ගේ උත්පත්තිය සතර ආකාරයකින් වෙයි

බිජුවටින් උපදනා පක්ෂි සර්පාදීහු **අණ්ඩජ** නම් වෙති දලබු (=වස්තිකොෂ යෙහි උපදනා මනුෂ්‍යයාදීහු **ජලාබුජ** නම් වෙති ඔහ ආදියෙහි උපදනා උකුණු මකුණු ආදීහු **සංසෙදජ** නම් වෙති සොලොස් ඇවිරිදි පමණ වූවන්මෙන් පහළවන දෙවාදීහු **ඕපපාතිකා** නම් වෙති.

මෙහි "ඔක්කන්ති" යනුවෙන් අණ්ඩජ ජලාබුජ සත්වයන්ගේ පහළවීම අපෙක්ෂිත ය, පළමුකොට අණ්ඩකොෂ වස්තිකොෂයන්හි පිළිසඳ ලබා පහළවන හෙයිනි.

"අභිනිබ්බත්ති" යනුවෙන් සංසෙදජ ඕපපාතික සත්වයන්ගේ පහළවීම අපෙක්ෂිත ය ඔවුන්ගේ උත්පත්තිය ප්‍රකටව ම පවත්නා හෙයිනි.

ජාති යනාදි මෙතෙක් පදයන්ගෙන් ලොකව්‍යවහාරය අනුව සත්වයන්ගේ පහළවීම දෙශනා කරන ලදී. "ඛන්ධානං පාතුභාවො" යනාදින් අනතුරුව දෙශනාකරන ලද්දේ පරමාර්ථ වශයෙනි

පරමාර්ථ වශයෙන් පවත්නේ ස්කන්ධයන්ගේ පහළවීම් මාත්‍ර යෙක. ස්කන්ධයනට "වොකාර" යනු ද නමෙකි. අසඤ්ඤතලයන්හි සත්වයනට ඇත්තේ රූපස්කන්ධය පමණෙක. එහෙයින් ඔව්හු එක වොකාර භවිකයෝ ය. අරූපස්ථලයන්හි සත්වයනට රූපස්කන්ධය නැත. ඔව්හු චතුවොකාර භවිකයෝ ය. කාමාවචර රූපාවචර යන්හි සත්වයනට පඤ්චස්කන්ධය ම පවත්නා හෙයින් ඔව්හු පඤ්ච වොකාර භවිකයෝ ය.

මෙසේ ඒ ඒ භවයනට නියමිත පරිදි ස්කන්ධයන්ගේ පහළවීම "ඛන්ධානං පාතුභාවො" යනුවෙන් දෙශිත ය.

චක්ඛු, සොත, ඝාන, ජිව්හා, කාය, මන යන මොව්හු ආයතන යෝ යි මොවුන්ගේ ප්‍රතිලාභය ද ඒ ඒ භවයනට නියමිත පරිදි වන්නේ ය. මෙහි ආයතන ප්‍රතිලාභය නම් සන්තතියෙහි දී ආයතනයන්ගේ පහළවීම යි. මෙසේ "වොහාර", "පරමත්ථ" නය වශයෙන් ජාතිතොමෝ දෙශනාකරන ලද්දී ය.

**තයො'මෙ භික්ඛවෙ භවා- කාමභවො, රූපභවො, අරූපභවො:-** "සහොකාසො ඛන්ධා භවො" යනුහෙයින් අවකාශ (=උත්පත්තිස්ථාන)ය සහිත ස්ඛන්ධයෝ මෙහි භවයනුවෙන් අපෙක්ෂිතය හ.

"භවන්ති සත්තා එත්ථා'ති භවො"- **සත්වයන්ගේ** පැවැත්මට ස්ථානවූයේ භවය යි. මෙයින් **ඔකාස භවය** කියන ලදී.

එනම්:- එකොළොස් වැදෑරුම් කාමාවචර භූමිය, සොළොස් වැදෑරුම් රූපාවචර භූමිය; සිව්වැදෑරුම් අරූපාවචර භූමිය යන මොව්හු වෙති.

අවිජ්ජා, තෘෂ්ණා ප්‍රත්‍යයයෙන් තිරතුරු පහළවන හෙයින් රූප, වෙදනා. සඤ්ඤා, සඞ්ඛාර, විඤ්ඤාණ යන පඤ්චස්ඛන්ධයනට ද "භව" යනු නම් මෙසේ යථොක්ත භූමිසහිත ස්ඛන්ධසමූහය භව නාමයෙන් හඳුන්වන ලදී.

**කාමභවය** නම් කර්මභවය හා උත්පත්තිභවය යි කාමභවයට පමුණුවන්නාවූ කර්මය **කම්මභව** නම්. කාමභවයෙහි උත්පත්තියට හේතුවන හෙයිනි. "සුඛො බුද්ධානං උප්පාදො"- "දුක්ඛො පාපස්ස උච්චයො" යනාදීතන්හි මෙන් මෙහි ඵලය අපෙක්ෂාකොට භව යැ යි කියනලදී.

**උත්පත්තිභවය** නම් එම කර්මයෙන් නිපන් උපාදින්නස්ඛන්ධ පඤ්චකය යි. මෙසේ කර්මය ද, උත්පත්තිය ද යන මේ දෙක මෙහි භවනාමයෙන් කියනලදහ. රූපභව අරූපභවයන් ද මේ නයින් දතයුතු.

**උපාදන:-** උපාදන සතරෙක් වෙති. කාමූපාදන, දිට්ඨූපාදන, සීලබ්බතූපාදන, අත්තවාදූපාදන වශයෙනි. උපාදනය නම් දැඩි කොට ගැනීම යි. "කාමො යෙව උපාදනං කාමූපාදනං" යනු හෙයින් කැමතිවීම් වශයෙන් දැඩිව ගන්නා හෙයින් කාමයම **කාමූපාදන** නම්. එනම්- පඤ්චකාමගුණික රාගය යි. මේ මෙහි සංක්ෂෙපාර්ථ යි. විස්තර විසුද්ධිමාර්ගය බලා දතයුතු.

දෘෂ්ටිවශයෙන් දැඩිකොට ගැන්ම **දිට්ඨූපාදන** නම්. එනම් - ශාශ්වත, උච්ඡෙද දෘෂ්ටිහු ය. "දිට්ඨියෙව උපාදනං. දිට්ඨූපාදනං" යනු හෙයින් දෘෂ්ටිය ම **දිට්ඨූපාදන** නම්.

"ඉමිනා මෙ සීලෙන වතෙන වා සංසාර සුද්'ධීති එවං සීලවතාදීනං ගහණං සීලබ්බතූපාදනං"- ශීලයෙන් හෝ ව්‍රතයෙන් සංසාර ශුද්ධිය වේනු යි. මෙසේ ශීලව්‍රතාදීන් ග්‍රහණය **සීලබ්බතූපාදන** නම් වේ. එනම්- ශාසනයෙන් බැහැර ගවශීල ගවව්‍රතාදියෙන් සංසාර සුද්ධිය වන්නේයැ යි සිතා එබඳු ශීල-ව්‍රත සමාදනය යි.

විංශතිවස්තුක සත්කාය දෘෂ්ටිය අනුව තමන් කියා ගනිත්තු යි **අත්තවාදුපාදාන** නම්. එනම්:- රූපය ආත්මය වශයෙන් දැකීම ආත්මය රූපය කොට දැකීම, ආත්මය කෙරෙහි රූපය දැකීම රූපය කෙරෙහි ආත්මය දැකීම යන සතර ආකාරයකින් වරදවා රූපය ගැනීම යි. එසේ ම වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන ඉතිරි ස්කන්ධයන් ද සතර සතර ආකාරයෙන් ගත් කල්හි සියල්ල විස්සකි. මෙසේ විසිආකාරයකින් ආත්මය වරදවා සිතීම අත්තවාදුපාදාන ය යි විස්තර විශුද්ධිමාර්ගය බලා දතයුතු.

**රූපතණ්හා -පෙ- ධම්මතණ්හා**'ති:- රූපාදි ආරම්මණයන්ගේ වශයෙන් තෘෂ්ණාතොමෝ සයාකාර වන්නී ය. රූපය අරමුණු කොට හෝ රූපයෙහි පවත්නා තෘෂ්ණාතොමෝ **රූපතණ්හා** නම්, **සද්දතණ්හා, ගන්ධතණ්හා, රසතණ්හා, ඵොට්ඨබ්බතණ්හා, ධම්මතණ්හා** යන පස්වනය ද මේ නයින් දතයුතු

කාමරාගස්වභාවයෙන් රූපය ආස්වාදනයකරමින් පවත්නා රූපතෘෂ්ණාතොමෝ **කාමතණ්හා** නම් වන්නී ය ඕතොමෝ මැ රූපය නිත්‍යය; සදාකාලිකය; යනාදීන් සාශ්වතදෘෂ්ටි වශයෙන් සලකමින් ගනුලබන්නී **භවතණ්හා** නම් වන්නී ය මේ ආත්මයෙන් රූපය කෙළවර වන්නේ ය. මතු උපතක් නැත. යනාදීන් උච්ඡෙද දෘෂ්ටිවශයෙන් සලකමින් ගනුලබන්නී **විභවතණ්හා** නම් වන්නී ය.

මෙසේ රූප තෘෂ්ණාතොමෝ කාමතණ්හා. භවතණ්හා. විභවතණ්හා වශයෙන් ත්‍රිවිධ වන්නී ය. එසේ ම සද්දතණ්හා ආදීහු ද කාමතණ්හාදීන්ගේ වශයෙන් තුන්තුන් ප්‍රභෙද ඇත්තාහු සියල්ල අටළොසෙ (18) ක් වෙති. මොව්හු **අට්ඨාරස තෘෂ්ණාවිචරිතයෝ** යි.

මේ අටළොස අජ්ඣත්තික, බාහිර භෙදයෙන් ගුණවූකල්හි සතිසෙ (=36) ක් වෙති. ඒ සතිස අතීත, අනාගත, වර්තමාන යන කාලත්‍රයෙන් ගුණවූකල්හි එකසියඅටක් (108) වෙති. මොව්හු **අෂ්ටශත තෘෂ්ණාවිචරිතයෝ** යි.

**චක්ඛුසම්ඵස්සජා වේදනා -පෙ- මනොසම්ඵස්සජා වේදනා**'ති – "වේදයති ආරම්මණරසං අනුභවතී'ති වේදනා"– අරමුණු රසය අනුභවකරන්නී නුයි, වේදනා නම් චක්ෂුස්පර්ශහේතුවෙන් හටගත් වේදනාතොමෝ **චක්ඛුසම්ඵස්සජා වේදනා** නම් වන්නී ය. "සොතසම්ඵස්සජා වේදනා" යනාදිය ද මේ නයින් දතයුතු. චක්ෂුර්ද්වාරාදීන්හි ප්‍රවෘත්ත කුශල, අකුශල, අව්‍යාකෘත වේදනාවෝ මෙයින් ගනුලබන්නාහු වෙති. විපාකවශයෙන් වනාහි චක්ෂුර්ද්වාර

යෙහි චක්ෂුර්විඥානසිත් දෙකය; මනොධාතු දෙකය; මනොවිඥානධාතු ත්‍රිකය; යන මොවුන් හා සම්ප්‍රයුක්ත වශයෙන් වෙදනා තොමෝ දතයුත්තී ය; සොතද්වාරාදියෙහි දී සොතවිඥානාදි සිත් හා මනොධාතු මනොවිඥානධාතුන්ගේ ග්‍රහණයවේ.

**චක්ඛුසම්ඵස්සො:** ඇසෙහි රූපය ගැටීමෙන් හටගත් ස්පර්ශය **චක්ඛුසම්ඵස්ස** නම් වේ. **සොත සම්ඵස්ස** යනාදිය ද මේ නයින් දතයුතු මෙතෙකින් කුශල අකුශල විපාකවශයෙන් පවත්නා පඤ්චවස්තුක දශස්පර්ශයෝ කියන ලද්දාහ. 'මනොසම්ඵස්ස" යනුවෙන් සෙසු දෙවිසිවැදෑරුම් ලෞකිකවිපාක මනඃසම්ප්‍රයුක්ත ස්පර්ශයෝ ගන්නා ලැබෙති.

**නාමරූපං:** වෙදනා, සඤ්ඤා, චෙතනා, ඵස්ස, මනසිකාර යන අරූපධර්ම නාම නම්. මෙහි වෙදනා යනුවෙන් "වෙදනාස්කන්ධය" ද සඤ්ඤා යනුවෙන් "සංඥස්කන්ධය"ද චෙතනා, ඵස්ස, මනසිකාර යන තුනින් "සංස්කාරස්කන්ධය"ද අපෙක්ෂිතය හ. සංස්කාරස්කන්ධයට අයත් සෙසු චෛතසිකඇතත් මෙහි සංස්කාරස්කන්ධය අපෙක්ෂාකොට චෙතනාදි තුන පමණක් ගන්නාලද්දේ සර්වදුර්වල සිත්හි පවා චෙතනාදිතුන ලැබෙන හෙයිනි.

පඨවි, ආපො, තෙජො වායො යන මොව්හු **සතරමහා භූතයෝ** යි. මේ සතරමහා භූතයන් ගෙන හෝ ඔවුන්නිසා පවත්නා චක්ඛායතනාදිහු **උපාදායරූපයෝ** යි යථොක්ත භූතරූප හා උපාදායරූප මෙහි **රූප** යනුවෙන් අපෙක්ෂිතය හ මෙසේ නාම හා රූප යන දෙකොටස "නාමරූපං" යනුවෙන් දෙශිත යි.

**චක්ඛුවිඤ්ඤාණං:** ඇස ඇසුරුකොට පවත්නා හෝ ඇසින් උපන් විඥානය **චක්ඛුවිඤ්ඤාණ** නම්. **සොතවිඤ්ඤාණ, ඝාණවිඤ්ඤාණ, ජිව්හාවිඤ්ඤාණ, කායවිඤ්ඤාණයෝ** ද මේ නයින් දතයුත්තාහ. මනසම විඤ්ඤාණවූයේ මනොවිඤ්ඤාණ නම්. විපඤ්චවිඥානවර්ජිත ත්‍රෛභූමක විපාකසිතට **මනොවිඤ්ඤාණය** යි, කියනු ලැබේ.

**සඞ්ඛාරා:**– කායසඞ්ඛාර වචීසඞ්ඛාර මනොසඞ්ඛාර යන මොහු සඞ්ඛාරනාමයෙන් ගන්නා ලද්දාහ. අභිසංස්කරණය මෙහි ලක්ෂණය යි.

මෙහෙයීම් වශයෙන් කායද්වාරයෙහි පැවැති කාමාවචරකුසල් අටය අකුසල්දොළොසය, යන විංශතිවිධ සංචෙතනාවෝ **කායසඞ්ඛාරයෝ** යි වචනභෙද වශයෙන් වාග්ද්වාරයෙහි පැවති විංශතිවිධ වාක්සංචෙතනාවෝ **වචීසඞ්ඛාරයෝ** යි කාය වාක් ද්වාරයන්ගේ මෙහෙයීමක් නොමැතිව එකීභූතව සිට සිතන්නාහුට පැවැති ලෞකික කුශලා'කුශලවශයෙන් එකුන්තිස් වැදෑරුම් වූ මනඃසංචෙතනාවෝ **මනොසඞ්ඛාරයෝ** යි

**දුක්ඛෙ අඤ්ඤාණං:-** දුඃඛසත්‍යයෙහි නොදැනීම යි. හෙවත් මෝහය යි. "සමුදයෙ අඤ්ඤාණං" යනාදිය ද මේ නයින් දතයුතු.

දුඃඛසත්‍යයෙහි නොදැනීම අන්තෝගධ, වත්ථු, ආරම්මණ, පටිච්ඡාදන යන සතර අයුරකින් වන්නේ ය. ඇතුළත්වීම **අන්තෝගධ** නම්. ඒ නොදැනීම දුඃඛසත්‍යවශයෙන් පවත්නා හෙයින් දුකෙහි ඇතුළත් වේ. දුඃඛසත්‍යය නොදැනීමට නිඃශ්‍රය ප්‍රත්‍යය හෙයින් **වත්ථුවශයෙන්** පවත්නේ වේ ආරම්මණප්‍රත්‍යය භාවයෙන් නොදැනීම **ආරම්මණවශයෙන්** පවත්නේ වේ. දුඃඛ සත්‍යය ආවරණය කරනහෙයින් ඔහුගේ යථාස්වභාව ප්‍රතිවේධය නිවාරණය කරණ හෙයින් එහි ඥානය පැවැත්මට ඉඩ නොදෙන හෙයින් **පටිච්ඡාදනවශයෙන්** පවත්නේ වේ

සමුදයසත්‍යයෙහි නොදැන්ම වත්ථු, ආරම්මණ, පටිච්ඡාදන වශයෙන් තුන්ආකාරයකින් වන්නේ ය නිරෝධසත්‍ය පටිපදා සත්‍යයන්හි නොදැන්ම පටිච්ඡාදන වශයෙන් මැ වන්නේ ය. නිරෝධ පටිපදා සත්‍යයන්ගේ යථාස්වභාව ප්‍රතිවේධය වැළැක්වීමෙන් හා ඔවුන්විෂයයෙහි ඥානයාගේ පැවැත්මට ඉඩ නොදීම් වශයෙනි.

නොදැනීම නිරෝධසත්‍ය, මාර්ගසත්‍යයනට ඇතුළත් නොවන හෙයින් එහි අන්තෝගධ වශයෙන් නොපවත්නේ වේ. නොදැනීමට එම සත්‍යද්වය වස්තුහු ද නොවෙති සහජාත නොවන හෙයිනි; අරමුණු ද නොවෙති. තදාරම්මණාදි වශයෙන් නොපවත්නා හෙයිනි. එසේ ම නිරෝධසත්‍ය මාර්ගසත්‍යයෝ ගැඹුරු වෙති, එහෙයින් අවබෝධයට දුෂ්කරයහ. එහෙයින් ම අන්ධභූතවූ අඤ්ඤාණය (=නොදැනීම) එතන්හි නොපවත්නේ යි. දුඃඛසත්‍යය වනාහි අඥාතත්වයෙන් ස්වභාවලක්ෂණය දැකීමට දුෂ්කර හෙයින් ගැඹුරුය. මෝහය එය දුක්වශයෙන් දැකීමට ඉඩ නොදෙයි.

තවද "දුක්ඛෙ" යන මෙපමණකින් සඞ්ගහ, වත්ථු, ආරම්මණ, කිච්ච වශයෙන් අවිද්‍යාතොමෝ දක්වන ලද්දීය "දුක්ඛසමුදයෙ" යන මෙපමණකින් වත්ථු, ආරම්මණ, කිච්ච වශයෙන් අවිද්‍යාතොමෝ දක්වන ලද්දී ය. "දුක්ඛනිරොධගාමිනී පටිපදාය" යන මෙපමණකින් කෘත්‍යවශයෙන් දක්වන ලද්දිය. "අඤ්ඤාණං" යන මෙයින් ස්වභාව වශයෙන් දක්වනලද්දියැ යි දතයුතු.

**නිරොධො හොති:-** නිරෝධය වන්නේය. මෙහි සියලු ම "නිරෝධ" යන පදයන්ගෙන් නිර්වාණය දෙශිත යි. නිර්වාණයට පැමිණ ඒ ඒ ධර්මයන්ගේ නිරෝධය වන හෙයිනි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රයෙහි දේශිත ද්වාදශ පදයෙන් වට්ටවිවට්ටය වදාරනසේක් අර්හත්වය කුළුගන්වා දේශනාව නිමාවට පැමිණවූ සේක. දේශනාවසානයෙහි පන්සියයක් භික්ෂූහු අර්හත්වයෙහි පිහිටියාහුය

(2) විභඞ්ග සූත්‍රය යි.

---

**පදව:-**

1 භික්ඛවෙ, මහණෙනි! වො, තොපට; මිච්ඡාපටිපදඤ්ච, අයහපත් පිළිවෙත ද; සම්මාපටිපදඤ්ච, යහපත් පිළිවෙත ද; දෙසිස්සාමි, දෙශනා කරන්නෙමි සෙස්ස පෙරමෙති

2 මිච්ඡාපටිපදා, වැරදි පිළිවෙත; කතමා, කවරිද සෙස්ස පෙරමෙති

3 සම්මාපටිපදා, මනා පිළිවෙත; කතමා, කවරිද?- සෙස්ස පෙරමෙති.

---

පටිපදාසුත්තං, පිළිවෙත් සූත්‍රය යි. (3)

---

විස්තර. -

**මිච්ඡාපටිපදං:** අවිද්‍යාදියගේ ප්‍රත්‍යයයෙන් සංස්කාරාදිය ලැබීම හෙවත් ප්‍රතීත්‍ය සමුත්පාදයාගේ අනුලොම ක්‍රමය මිථ්‍යාප්‍රතිපත්තිය යනු මෙයින් ප්‍රකාශිත යි

අපුඤ්ඤාභිසඞ්ඛාරය (=අකුශලචේතනාවල)ට මෙන් ම පුඤ්ඤාභිසඞ්ඛාරය (=කාමාවචර රූපාවචර කුශලචේතනාවල) ට හා ආනෙඤ්ජාභිසඞ්ඛාරය (=අරූපාවචර කුශලචේතනා වල) ට ද අවිද්‍යාව ම ප්‍රත්‍යය වන්නී ය. එකල එයට **මිච්ඡාපටිපදා** යනු කෙසේ යෙදේ ද? භවය මුල්කොට ඇති හෙයිනි. භවයෙහි සැපවශයෙන් පැනෙන සියල්ල දුකට කාරණ ය. එහෙයින් මිච්ඡාපටිපදා යනු යෙදේ.

යටත්පිරිසෙන් භවත්‍රය සඞ්ඛ්‍යාත වට්ටය ප්‍රාර්ථනය කොට වඩනලද පඤ්චාභිඥ- අෂ්ටසමාපත්තිහු පවා භවය මුල්කොට පවත්නාහෙයින් **මිච්ඡාපටිපදා** නම් වෙත්.

එසේම විවට්ට සඞ්ඛ්‍යාත නිර්වාණය පතා කරනලද කැඳසුහක් පලාමිටක් පමණවූ හෝ දීම්මාත්‍රයෙක් වෙයි ද, එය නිර්වාණය මුල් කොට ඇතිහෙයින් **සම්මාපටිපදා** නම් වේ. අර්හත්වයට නොපමුණුවා එහි අනුසස් කෙළවර නොවන්නේ ය. මෙසේ අනුලොම හෙයින් මිථ්‍යාප්‍රතිපත්තිය හා ප්‍රතිලොම හෙයින් සම්‍යක්ප්‍රතිපත්තිය ද දෙශනාකරන ලදී.

"කතමා ච භික්ඛවෙ සම්මා පටිපදා"- යනුවෙන් පටිපදාව විචාරා 'කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරෝධො හොති" යනුවෙන් නිර්වාණය විභාග කොට දක්වන ලදී. එහෙත් "අයං වුච්චති භික්ඛවෙ පටිපදා" යනුවෙන් නිගමනයෙහි ද පටිපදාව ම දක්වා සූත්‍රය අවසන් කළසේක. මෙහි දෙතැනෙක පටිපදා නාමය හා විභජනයේදී නිර්වාණය දක්වූ නමුත් පටිපදා නාමයෙන් නිර්වාණය නොකියැවෙන හෙයින් එය නොයෙදෙන්නේ නොවේද? නොයෙදෙන්නේ නොවේ ඵලය අපෙක්‍ෂා කොට පටිපදා යනු දක්වූ හෙයින් විදර්ශනාවනට හා චතුර්විධ මාර්ගයනට පටිපදා යනු නමෙකි. නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය එම පටිපදාවන්ගේ ඵලය යි එහෙයින් ඵලය (=නිර්වාණය) අපෙක්‍ෂා කොට පටිපදා යි, වදාරන ලදී.

**අසෙසවිරාගනිරොධො**:-විරාග යනු නිරෝධ යන්නට ම පර්‍යාය වචනය කි. අශේෂ විරාගයෙන් හා අශේෂනිරෝධයෙන් යනු අදහස යි යම් විරාග සඞ්ඛ්‍යාත මාර්ගයකින් හෝ අශේෂනිරෝධය වන්නේ ද, එය දක්වීමට මෙම්පදභාජනය කියන ලදි. එසේකලැ අනුභාව සහිත පටිපදානොමෝ විභාගකරන ලද්දීය. මෙසේ මේ සූත්‍රයෙහි ද වට්ටය ම දෙශිතයි

## (3) සම්පදා සූත්‍රය යි.

පදාර්:-

භික්ඛවෙ, මහණෙනි! සම්බොධා, බුදුවීමෙන්; පුබ්බෙ, පෙර; අනභිසම්බුද්ධස්ස, අනභිසම්බොධියට නොපැමිණි; බොධිසත්තස්සඑව සතො, බෝසත්බැව්හි සිටියාවූ ම; භගවතො, භගවත්වූ; අරහතො, අර්හත්වූ; විපස්සිස්ස සම්මාසම්බුද්ධස්ස, විදර්ශි සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට එතං, මෙබඳු සිතෙක්; අහොසි, වීය.

වත, එකාන්තයෙන්; අයංලොකො, මේලොකයතෙම; කිච්ඡං දුකට; ආපන්නො, පැමිණියේය. ජායතිච, උපදනේ ද වෙයි ජීයතිච, දිරීමට යන්නේ ද වෙයි මීයතිච, මැරෙන්නේ ද වෙයි. චවතිච, නැවත නැවත චුතවන්නේ ද වෙයි. උපපජ්ජතිච, නැවත, නැවත උපදනේ ද වෙයි

අථ ච පන, තවද වනාහි; ජරාමරණස්ස, ජරාමරණසඞ්ඛ්‍යාත; ඉමස්ස දුක්ඛස්ස, මේදුඃඛයාගේ; නිස්සරණං, නික්මීමෙක්; නප්පජානාති, නොදක්නේ වෙයි. කුදාස්සුනාම, කවරනම්කාලෙකැ; ජරාමරණස්ස, ජරාමරණසඞ්ඛ්‍යාත; ඉමස්සදුක්ඛස්ස, මේ දුඃඛයාගේ; නිස්සරණං, නිඃසරණයෙක්; පඤ්ඤායිස්සති ඉති, පෙනෙන්නේ ද යනු යි.

භික්ඛවෙ, මහණෙනි! අථ ඛො, එකල්හි වනාහි; විපස්සිස්ස බොධිසත්තස්ස, විදර්ශිබොධිසත්ත්වයන්හට; එතං, මෙබඳු සිතෙක්;

අහොසි, වී; කිම්හිනුඛො, කුමක් නම්; සති, ඇතිකල්හි; ජරාමරණං, ජරාමරණය; හොති, වන්නේ ද? කිම්පච්චයා, කවරප්‍රත්‍යයකින්; ජරාමරණං, ජරාමරණය වන්නේ ද කියා යි.

යොනිසො මනසිකාරා, උපායමනසිකාරයෙන්; පඤ්ඤාය, ප්‍රඥාවගේ; අභිසමයො, අවබොධය; අහු, වී. කෙසේද-යත්? "ජාතියා, ජාතිය; සති ඛො, ඇතිකල්හිවනාහි; ජරාමරණං, ජරාමරණය; හොති, වේ. ජාතිපච්චයා, ජාතිප්‍රත්‍යයයෙන්; ජරාමරණං, ජරාමරණය වන්නේය" කියායි. ජාතිහොති, ජාතිය වේ ද; කිම්පච්චයා, කවර ප්‍රත්‍යයකින් ජාති ඉති, ජාතිය වේ ද; කියායි

භවෙ, භවය, සති ඛො, ඇතිකල්හිවනාහි, - උපාදානෙ, උපාදානය-තණ්හාය තෘෂ්ණාව-වෙදනාය, වෙදනාව-ඵස්සෙ, ස්පර්ශය-සළායතනෙ, ෂඩායතනය - නාමරූපෙ - නාමරූපය - විඤ්ඤාණෙ විඥානය-සඞ්ඛාරෙ-සංස්කාරය-අවිජ්ජාය, අවිද්‍යාව-ඉතිහි මෙසේ වනාහි, ඉදං, මේ; කෙවලස්ස, සියලු, දුක්ඛක්ඛන්ධස්ස, දුඃඛ රාශියගේ සමුදයො, හටගැනීම; හොති, වන්නේය. "සමුදයො සමුදයොඉති," සමුදයො සමුදයොකියා, පුබ්බෙ, පෙර; අනනුස්සුතෙසු ධම්මෙසු, අනධිගතධර්මයන්හි හෝ චතුරාර්‍ය්‍යසත්‍යධර්මයන්හි, චක්ඛුං, (දැකීම් අර්ථයෙන් චක්ඛුයැයි කියනලද) ඥානය; උදපාදි, පහළවිය. පඤ්ඤා වෙසෙසා දැනීම් සඞ්ඛ්‍යාත ප්‍රඥාතොමෝ; විජ්ජා, (ප්‍රතිවෙධ කිරීම්අර්ථයෙන් විජ්ජානම්වූ) ඥානය-ආලොකො, (බැබලීම්අර්ථයෙන් ආලොකනම්වූ)-

(2) ජරාමරණං, ජරාමරණය; නහොති නොවන්නේ ද? කිස්ස, කවරකගේ; නිරොධා, අනුත්පාදනිරොධයෙන්, ජරාමරණ නිරොධොඉති, ජරාමරණ නිරොධය වන්නේද කියායි -ජාතියා, ජාතිය; අසති ඛො, නැතිකල්හි වනාහි; -

(3) ඉතිහි, මෙසේ වනාහි; ඉදං, මේ; අවිජ්ජානිරොධා, අවිද්‍යාවගේ අනුත්පාදනිරොධයෙන්; සඞ්ඛාර නිරොධො, සංස්කාරයන්ගේ නිරොධය; සඞ්ඛාර-පෙ-එවං, මෙසේ; එතස්ස කෙවලස්ස, මේ සියලුම, දුක්ඛක්ඛන්ධස්ස, දුඃඛරාශියගේ; නිරොධො, අනුත්පාද නිරොධය; හොති, වන්නේය.-

"නිරොධො නිරොධොති ඛො" නිරොධො, නිරොධො කියා; (අර්ථ නොදැක්වුණු පදයන්ගේ අර්ථ පළමු කියනලද පරිදි දතයුතු)

---

**චතුත්ථං සතරවැනි, සිඛීසුත්තං "සිඛී" සූත්‍රය යි.**

---

සත්තන්නම්පි බුද්ධානං, සත් බුදුවරයන් පිළිබඳවමැ; එවං, මෙ පරිච්ඡෙදෙන්; විත්ථාරෙතබ්බා, විස්තර කළයුතු.

---

## විස්තර-

**විපස්සී:**-මෙහි අර්ථය ලැබෙන අයුරු කිපආකාරයකින් දක්වා තිබේ. යම්කිසිවක්දෙස මඳවේලාවක් බලාසිටිනවිට සාමාන්‍ය මනුෂ්‍යයන්ගේ ඇස් සැලෙයි. එසේ වන්නේ ඔවුන් පිළිබඳ චක්ෂුරාදී ඉන්ද්‍රියයන්ගේ කර්මජප්‍රසාදගුණය දුර්වල බැවිනි.

පශ්චිමභවික බොධිසත්ත්වවරයන්ගේ සම්පූර්ණ වූ බලවත්කම්යෙන් නිපන් ප්‍රසාදගුණය ඉතා බලවත් ය. එහෙයින් සාමාන්‍ය මනුෂ්‍යයන්ගේ සෙයින් ඇස්පිය සැලීමෙක් නොවෙයි.

විදර්ශි බොධිසත්වයන්ගේ අක්ෂිහු ඉතා නිර්මල වෙති. පිය නොසැලෙති එසේ හෙයින් තව්තිසාවැසි දෙවියන් මෙන් ඇසිපිය සැලීමක් නොමැතිව බැලිය හැක්ක. ' විපස්සි" යන නාමය ලැබීමට මෙය ද හේතුවකි. 'අනිමිසනෙත්තා කුමාරො පෙක්ඛතීති ඛො භික්ඛවෙ විපස්සීත්වෙව සමඤ්ඤා උදපාදි" යි, එහෙයින් වදාරන ලදී.

නිතර නිතර පිළිසෙලකරනලද ඉතා පිරිසිදු වූ මනාව විවෘත කරනලද ඇස්වලින් බලානු යි හෝ "විපස්සී" නම් වේ.

මනාව පරීක්ෂා කොට දකිනු යි හෝ "විපස්සී" නම් වේ දිනක් බෝසතුන්ගේ පියරජ විනිශ්චය ශාලාවෙහි යුක්ති (=නඩු) විසඳන තැන අනුශාසනය කරයි. ඇමතියෝ නඩු විසඳති ඒ වේලාවෙහි කුමරුන් මනාව පිළියෙළ කොට ගෙනවුත් රජුගේ ඇකයෙහි තැබී.

මේ අවස්ථායෙහි අමාත්‍යයෝ නිවරදකරු වරදකරු ලෙස ද වරදකරු නිවරදකරු ලෙස ද නඩුව විසඳූහ. මෙය බලාහුන් ළදරු කුමරතෙම නොසතුටුහඬක් පහළ කෙළේය. රජු ඊට හේතුව සොයා දැන නැවත වරදකරුට ම වරද පවරා නඩුව විසඳන ලදී. කුමාරතෙම එවිට සතුටු බවක් හැඟවී.

කුමරුන් එය දැන හෝ නොදැන කරනලද බව දැනගනුවස් පෙරසේ නැවත ද වරද කරු නිවරද කරු කොට නඩුව විසඳන ලදී. එවිට ද කුමාරතෙම නොසතුටු හඬ ම පහළ කෙළ්ය. එකල කුමරුන් එය දැනගන ම එසේ කළබව දැනගන්නා ලදී. එතැන් සිට රජතෙම බෝසතුන් කෙරෙහි මනාව පිළිපන්නේය. "විචෙය්‍ය විචෙය්‍ය කුමාරො අත්ථෙ පස්සතී'ති ඛො භික්ඛවෙ භීයොසොමත්තාය විපස්සීත්වෙව සමඤ්ඤා උදපාදි" යනු එහෙයින් වදාරන ලදී.

**භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස:**- මේ පද පළමු විස්තාර කොට ඇත.

**බොධිසත්තස්සේ'ව සතො:**-මෙහි අර්ථය දෙයාකාරයකින් දක්වති.

"බොධියං සත්තො ආසත්තො'ති බොධිසත්තො"-බොධියෙහි ඇලුනේ බොධිසත්ත නම් බොධිය නම් සිව්මඟින් ලබන නුවණ යි. ඒ බොධි සඞ්ඛ්‍යාත චතුර්මාර්ගඥානය ප්‍රාර්ථනය කරමින් වසන්නේ බොධිසත්ව නම්. නුවණැතිතැනැත්තේ ය, පණ්ඩිත තෙමේ ය. යනාර්ථයි.

"බුජ්ඣනක සත්තො'ති'පි බොධිසත්තො" ප්‍රබොධවත සත්ව තෙමේ හෝ බෝධිසත්ව නම්. යම්සේ දියමතුයෙහි සිටි මුහුකිරීමට පත් පියුම් කැකුල සූර්යරශ්මිය ස්පර්ශකිරීමෙන් ඒකාන්තයෙන් ප්‍රබුද්ධ හෙයින් "බුජ්ඣනකපද්මයැ" යි කියනු ලැබේ ද, එසේම බුදුන් හමුයෙහි ලද විවරණ ඇතිහෙයින් ඒකාන්තයෙන් පාරමීපුරා බුදුවේනු යි. "ප්‍රබොධවත සත්වය" යනාර්ථයෙන් බොධිසත්ව නම් වේ.

**යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය**-නුවණින් මෙනෙහි කිරීමෙන් ද ප්‍රඥාවෙන් ද "ජාතිය ඇතිකල්හි වනාහි ජරාමරණය වන්නේයැ යි මෙසේ අවබොධය ඇතිවිය". යනාර්ථයි.

**පුබ්බෙ අනනුස්සුතෙසු:**-අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයන්ගේ සමුදයය වන්නේයැ යි මෙසේ මින් පෙර අවබොධ නොවූ ධර්මයන්හි හෝ ආර්‍යසත්‍ය ධර්මයන්හි යනාර්ථයි.

---

විදර්ශි සූත්‍රය යි.

---

5, 6, 7, 8, 9, 10, සූත්‍ර.

පදාර්ථ-

(5) සිඛිස්ස සම්මාසම්බුද්ධස්ස, "සිඛී" සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට-

(6) වෙස්සභුස්ස සම්මාසම්බුද්ධස්ස, "වෙස්සභූ" සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට-

(7) කකුසන්ධස්ස සම්මාසම්බුද්ධස්ස, "කකුසඳ" සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට-

(8) කොණාගමනස්ස සම්මාසම්බුද්ධස්ස, "කොණාගමන" සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට -

(9) කස්සපස්ස සම්මා සම්බුද්ධස්ස, "කාශ්‍යප" සම්‍යක් සම්බුද්ධ යන් වහන්සේට-

(10) පුබ්බෙ එව, පූර්වයෙහිම මෙ, මට-තස්සමයහං, එ මට-

---

පඨමො, පළමුවැනි, බුද්ධවග්ගො, බුද්ධවර්ගය යි.

---

## විස්තර-

සිඛිස්ස ගිකඛමෙ:- මේ සූත්‍ර සියල්ල දෙව්රම්හි දී දෙශනා කරන ලදී. එහෙත් එකවරෙක්හි මැ දෙශනා කරනලද්දේ නොවේ. එහෙයින් "සිඛිස්සපි" කියා නොයෙදිය යුතු සූත්‍ර හා අර්ථ බොහෝ සෙයින් සමාන යි.

බොධිපර්‍යඞ්කයෙහි වැඩසිටි සියලු බොධිසත්ත්වයන් වහන්සේලාට "අතීතයේ බුදුවරු ප්‍රත්‍යාකාරය මෙනෙහි කොට බුදුවූහ"යි කියන මහණෙක් හෝ බමුණෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ නොවෙති.

යම්සේ කල්පයාගේ මුල්කාලයෙහි වටවැස්සෙහි ජලය ගියමාර්‍ග යන්නෙත් මැ පසුපසු වසින ජලය යන්නේ ද එසේ ම පළමු බුදුවර යන් බුද්ධත්වයට පැමිණියේ යම් මාර්‍ගයකින් නම් පසුපසු බුදුව රයෝ ද ඒ මාර්‍ගයෙන් ම යන්නාහු වෙති.

සියලු බෝසත්හු ම ආනාපාණ චතුර්‍ථධ්‍යානයෙන් නැඟී ප්‍රත්‍යාකාරයෙහි ඥනය එළවා එය අනුලොම ප්‍රතිලොම වශයෙන් මෙනෙහි කොට බුද්ධත්වයට පැමිනෙන්නාහුය එහෙයින් පිළිවෙළින් මේ සූත්‍ර සතින් මැ දෙශනාකරන ලද්දේ "බුද්ධවිපස්සනා" නම්.

---

පළමුවැනි බුද්ධවර්ගය යි.

---

ඒ වර්ගයාගේ උද්දන (=බන්ධන) ය යි.

දෙශනා සූත්‍රය ද, විභඞ්ග සූත්‍රය ද, පටිපදා සූත්‍රය ද, විපස්සි සිඛි, වෙස්සභූ, කකුසඳ, කොණාගමණ, කාශ්‍යප මහායසස් ඇති ශාක්‍යමුනි වූ ගෞතම ද යන මුනිවහන්සේලා පිළිබඳ වූ සූත්‍රයෝ ද වෙති.

—o—

# නිදානවග්ගය.

සංයුත්ත නිකාය ධර්ම ග්‍රන්ථයෙහි **නිදානවග්ගයට** අයත් දහම් කොටස් පදාර්ථ, විස්තරාර්ථ සහිතව පිළිවෙළින් දැන් මුද්‍රණය කර ගෙන යනු ලැබේ. මේ එහි ප්‍රථම කලාපයයි. දෙමසකට වරක් මෙවැනි ධර්ම පුස්තකයක් බැගින් නිකුත්වේ. මෙය පිළිවෙළින් ලබාගැණීමට දායක භවතුන්ගේ සංඛ්‍යාවට ඇතුලත්විය යුතුයි. **ග්‍රාහක මිල රු. 2-00 කි.** (දෙවරකට හෝ දායක මුදල් භාරගනු ලැබේ.) මෙබඳු ධර්ම පුස්තක (10) ක් පිළිවෙළින් ග්‍රාහක භවතුන් වෙත එවන්නෙමු. දෙවන කලාපය ලබන සැප්තැම්බර් මස 20 වෙනිදා ප්‍රසිද්ධවේ.

**ශ්‍රී. පී. ඥානෝදය සහ සමාගමේ පොත් වෙළඳ ශාලාවෙන්ද** මෙහි පිටපත් ලබාගතහැක.

පිටපතක් ශත 25 යි.

මීට,

ඩී. ඇස්. වීරවික්‍රම,

පොල්ගස්ඕවිට.

# ii ආහාර වග්ගො.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

1 සාවත්ථි-පෙ- චත්තාරො මෙ භික්ඛවෙ ආහාරා භූතානං වා සත්තානං ඨිතියා සම්භවෙසීනං වා අනුග්ගහාය, කතමෙ චත්තාරො? කබලිඞ්කාරාහාරො ඔළාරිකො වා සුඛුමො වා, ඵස්සො දුතියො, මනොසඤ්චෙතනා තතියා, විඤ්ඤාණං චතුත්ථං. ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො ආහාරා භූතානං වා සත්තානං ඨිතියා සම්භවෙසීනං වා අනුග්ගහාය. ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො ආහාරා කිං නිදානා, කිං සමුදයා, කිං ජාතිකා, කිං පභවා?

2 ඉමෙ චත්තාරො ආහාරා තණ්හා නිදානා, තණ්හා සමුදයා, තණ්හා ජාතිකා, තණ්හාප්පභවා, තණ්හා චායං භික්ඛවෙ කිං නිදානා, කිං සමුදයා, කිං ජාතිකා, කිං පභවා? තණ්හා වෙදනානිදානා, වෙදනා සමුදයා, වෙදනා ජාතිකා, වෙදනාප්පභවා වෙදනා චායං භික්ඛවෙ කිං නිදානා, කිං සමුදයා, කිං ජාතිකා, කිං පභවා? වෙදනා ඵස්ස නිදානා, ඵස්ස සමුදයා, ඵස්ස ජාතිකා, ඵස්සප්පභවා, ඵස්සො චායං භික්ඛවෙකිං නිදානො, කිං සමුදයො, කිං ජාතිකො, කිංපභවො? ඵස්සො සළායතන නිදානො, සළායතන සමුදයො, සළායතන ජාතිකො, සළායතනප්පභවො. සළායතනඤ්චිදං භික්ඛවෙ කිං නිදානං, කිංසමුදයං, කිං ජාතිකං, කිං පභවං? සළායතනං නාම රූප නිදානං, නාමරූප සමුදයං, නාමරූප ජාතිකං, නාමරූපප්පභවං. නාමරූපඤ්චිදං භික්ඛවෙ කිං නිදානං, කිං සමුදයං, කිං ජාතිකං, කිං පභවං? නාමරූපං විඤ්ඤාණ නිදානං, විඤ්ඤාණ සමුදයං, විඤ්ඤාණ ජාතිකං විඤ්ඤාණප්පභවං. විඤ්ඤාණඤ්චිදං භික්ඛවෙ කිං නිදානං, කිං සමුදයං, කිං ජාතිකං, කිං පභවං? විඤ්ඤාණං සංඛාර නිදානං, සඞ්ඛාර සමුදයං, සඞ්ඛාර ජාතිකං, සඞ්ඛාරප්පගවං. සංඛාරාචිමෙ භික්ඛවෙ කිං නිදානා කිං සමුදයා, කිං ජාතිකා, කිං පභවා? සඞ්ඛාරා අවිජ්ජා නිදානා, අවිජ්ජා සමුදයා, අවිජ්ජා ජාතිකා, අවිජ්ජාප්පභවා. ඉති ඛො භික්ඛවෙ අවිජ්ජා පච්චයා සංඛාරා, සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති

3 අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සංඛාර නිරොධො සංඛාරනිරොධා විඤ්ඤාණනිරොධො-පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති.

( 1 )

---

1 සාවත්ථි-පෙ- චත්තාරො මෙ භික්ඛවෙ ආහාරා භූතානං වා සත්තානං ඨිතියා සම්භවෙසීනං වා අනුග්ගහාය, කතමෙ චත්තාරො? කබලිඞ්කාරො ආහාරො ඔළාරිකො වා සුඛුමො වා, ඵස්සො දුතියො, මනොසඤ්චෙතනා තතියා, විඤ්ඤාණං චතුත්ථං, ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො ආහාරා භූතානං වා සත්තානං ඨිතියා සම්භවෙසීනං වා අනුග්ගහායා'ති. එවං වුත්තෙ ආයස්මා මොළියඵග්ගුනො භගවන්තං එතදවොච. "කො නු ඛො භන්තෙ විඤ්ඤාණාහාරං ආහාරෙතීති." නො කල්ලො පඤ්හො'ති භගවා අවොච. ආහාරෙතීති අහං න වදාමි. ආහාරෙතීති චා'හං වදෙය්‍යං තත්‍රස්ස කල්ලො පඤ්හො, කො නු ඛො භන්තෙ ආහාරෙතීති? එවඤ්චාහං නවදාමි. එවං මං අවදන්තං යො එවං පුච්ඡෙය්‍ය. කිස්ස නු ඛො භන්තෙ විඤ්ඤාණාහාරොති? එස කල්ලො පඤ්හො තත්‍ර කල්ලං වෙය්‍යාකරණං විඤ්ඤාණාහාරො ආයතිං පුනබ්භවාභිනිබ්බත්තියා පච්චයො. තස්මිං භූතෙ සති සළායතනං සළායතන පච්චයා ඵස්සො'ති

2 කො නු ඛො භන්තෙ ඵුසතී'ති? නො කල්ලො පඤ්හො'ති භගවා අවොච. ඵුසතීති අහං න වදාමි. ඵුසතීති චා'හං වදෙය්‍යං; තත්‍රස්ස කල්ලො පඤ්හො. කො නු ඛො භන්තෙ ඵුසතීති? එවඤ්චා'හං න වදාමි. එවං මං අවදන්තං යො එවං පුච්ඡෙය්‍ය; කිං පච්චයා නු ඛො භන්තෙ ඵස්සොති? එස කල්ලො පඤ්හො තත්‍ර කල්ලං වෙය්‍යාකරණං සළායතනපච්චයා ඵස්සො ඵස්සපච්චයා වෙදනාති. කො නු ඛො භන්තෙ වෙදියතීති? නො කල්ලො පඤ්හො'ති භගවා අවොච. වෙදියතීති අහං න වදාමි. වෙදියතීති චාහං වදෙය්‍යං; තත්‍ර'ස්ස කල්ලො පඤ්හො. කො නු ඛො භන්තෙ වෙදියතීති. එවඤ්චා'හං න වදාමි. එවං මං අවදන්තං යො එවං පුච්ඡෙය්‍ය; කිං පච්චයා නු ඛො භන්තෙ වෙදනාති? එස කල්ලො පඤ්හො. තත්‍ර කල්ලං වෙය්‍යාකරණං. ඵස්ස පච්චයා වෙදනා, වෙදනා පච්චයා තණ්හාති. කො නු ඛො භන්තෙ තණ්හියතීති? නො කල්ලො පඤ්හොති භගවා අවොච. තණ්හියතීති අහං න වදාමි. තණ්හියතී'ති චාහං වදෙය්‍යං; තත්‍රස්ස කල්ලො පඤ්හො. කො නු ඛො භන්තෙ තණ්හියතීති? එවඤ්චාහං න වදාමි. එවං මං අවදන්තං යො එවං පුච්ඡෙය්‍ය; කිම්පච්චයා නු ඛො භන්තෙ තණ්හාති එස කල්ලො පඤ්හො. තත්‍ර කල්ලං වෙය්‍යාකරණං. වෙදනාපච

ච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානන්ති. කො නු ඛො භන්තෙ උපාදියතීති? නො කල්ලො පඤ්හොති, භගවා අවොච උපාදියතීති අහං න වදාමි. උපාදියතීති චාහං වදෙය්‍යං; තත්‍රස්ස කල්ලො පඤ්හො. කො නු ඛො භන්තෙ උපාදියතීති. එවඤ්චාහං න වදාමි. එවං මං අවදන්තං යො එවං පුච්ඡෙය්‍ය; කිම්පච්චයා නු ඛො භන්තෙ උපාදානන්ති. එස කල්ලො පඤ්හො තත්‍ර කල්ලං වෙය්‍යාකරණං. තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො-පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

3 ඡන්නං ත්වෙව ඵස්සායතනානං අසෙස විරාග නිරොධා ඵස්ස නිරොධො, ඵස්සනිරොධා වෙදනා නිරොධො, වෙදනා නිරොධා තණ්හා නිරොධො, තණ්හා නිරොධා උපාදාන නිරොධො, උපාදාන නිරොධා භව නිරොධො, භව නිරොධා ජාති නිරොධො, ජාති නිරොධා ජරාමරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති'ති.

( 2 )

1 සාවත්ථි-පෙ- යෙහි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා ජරාමරණං නප්පජානන්ති, ජරාමරණසමුදයං නප්පජානන්ති, ජරාමරණනිරොධං නප්පජානන්ති, ජරාමරණනිරොධගාමිනිං පටිපදං නප්පජානන්ති, ජාතිං-පෙ- භවං, උපාදානං, තණ්හං, වෙදනං, ඵස්සං, සළායතනං, නාමරූපං, විඤ්ඤාණං, සඞ්ඛාරෙ නප්පජානන්ති. සඞ්ඛාරසමුදයං නප්පජානන්ති. සඞ්ඛාරනිරොධං නප්පජානන්ති. සඞ්ඛාරනිරොධගාමිනිං පටිපදං නප්පජානන්ති. න මෙ තෙ භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු වා සමණසම්මතා බ්‍රාහ්මණෙසු වා බ්‍රාහ්මණ සම්මතා. න ච පන තෙ ආයස්මන්තො සාමඤ්ඤත්ථං වා බ්‍රහ්මඤ්ඤත්ථං වා දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති.

2 යෙ ච ඛො කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා ජරාමරණං පජානන්ති, ජරාමරණසමුදයං පජානන්ති, ජරාමරණනිරොධං, පජානන්ති, ජරාමරණනිරොධගාමිනිං පටිපදං පජානන්ති, ජාතිං-පෙ- භවං, උපාදානං, තණ්හා, වෙදනං, ඵස්සං, සළායතනං, නාමරූපං, විඤ්ඤාණං, සඞ්ඛාරෙ, පජානන්ති. සඞ්ඛාරසමුදයං පජානන්ති. සඞ්ඛාරනිරොධං පජානන්ති. සඞ්ඛාරනිරොධගාමිනිං පටිපදං පජානන්ති, තෙ ඛො මෙ භික්ඛවෙ සමණා

වා බ්‍රාහ්මණා වා සමණෙසු චෙව සමණසම්මතා, බ්‍රාහ්මණෙසු ච බ්‍රාහ්මණසම්මතා. තෙ ච පනායස්මන්තො සාමඤ්ඤත්ථං ච බ්‍රහ්මඤ්ඤත්ථඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

( 3 )

1 සාවත්ථි-පෙ- යෙහි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා ඉමෙ ධම්මෙ නප්පජානන්ති, ඉමෙසං ධම්මානං සමුදයං නප්පජානන්ති, ඉමෙසං ධම්මානං නිරොධං නප්පජානන්ති, ඉමෙසං ධම්මානං නිරොධගාමිනිං පටිපදං නප්පජානන්ති. කතමෙ ධම්මෙ නප්පජානන්ති? කතමෙසං ධම්මානං සමුදයං නප්පජානන්ති? කතමෙසං ධම්මානං නිරොධං නප්පජානන්ති? කතමෙසං ධම්මානං නිරොධගාමිනිං පටිපදං නප්පජානන්ති? ජරාමරණං නප්පජානන්ති? ජරාමරණසමුදයං නප්පජානන්ති? ජරාමරණනිරොධං නප්පජානන්ති? ජරාමරණනිරොධගාමිනිං පටිපදං නප්පජානන්ති? ජාතිං-පෙ- භවං- උපාදානං- වෙදනං- ඵස්සං- සළායතනං- නාමරූපං විඤ්ඤාණං- සඞ්ඛාරෙ නප්පජානන්ති? සඞ්ඛාර සමුදයං නප්පජානන්ති? සඞ්ඛාරනිරොධං නප්පජානන්ති? සඞ්ඛාර නිරොධගාමිනිං පටිපදං නප්පජානන්ති? ඉමෙධම්මෙ නප්පජානන්ති? ඉමෙසං ධම්මානං සමුදයං නප්පජානන්ති? ඉමෙසං ධම්මානං නිරොධං නප්පජානන්ති? ඉමෙසං ධම්මානං නිරොධගාමිනිං පටිපදං නප්පජානන්ති? න මෙ තෙ භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු වා සමණසම්මතා, බ්‍රාහ්මණෙසු වා බ්‍රාහ්මණසම්මතා. න ච පන තෙ ආයස්මන්තො සාමඤ්ඤත්ථං වා බ්‍රහ්මඤ්ඤත්ථං වා දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති.

2 යෙ ච ඛො කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා ඉමෙ ධම්මෙ පජානන්ති, ඉමෙසං ධම්මානං සමුදයං පජානන්ති, ඉමෙසං ධම්මානං නිරොධං පජානන්ති, ඉමෙසං ධම්මානං නිරොධගාමිනිං පටිපදං පජානන්ති? කතමෙ ධම්මෙ පජානන්ති? කතමෙසං ධම්මානං සමුදයං පජානන්ති? කතමෙසං ධම්මානං නිරොධං පජානන්ති? කතමෙසං ධම්මානං නිරොධගාමිනිං පටිපදං පජානන්ති? ජරාමරණං පජානන්ති? ජරාමරණසමුදයං පජානන්ති? ජරාමරණනිරොධං පජානන්ති? ජරාමරණනිරොධගාමිනිං පටිපදං පජානන්ති? ජාතිං -පෙ- භවං, උපාදානං, තණ්හං, වෙදනං, ඵස්සං සළායතනං, නාමරූපං, විඤ්ඤාණං, සඞ්ඛාරෙ පජානන්ති? සඞ්ඛාරසමුදයං පජානන්ති? සඞ්ඛාරනිරොධං පජානන්ති? සඞ්ඛාරනිරොධගාමිනිං පටිපදං පජානන්ති? ඉමෙ ධම්මෙ පජානන්ති? ඉමෙසං ධම්මානං සමුදයං පජා

නන්ති? ඉමෙසං ධම්මානං නිරොධං පජානන්ති? ඉමෙසං ධම්මානං නිරොධගාමිනිං පටිපදං පජානන්ති? තෙ ඛො මෙ භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු චෙව සමණසම්මතා, බ්‍රාහ්මණෙසු ච බ්‍රාහ්මණසම්මතා තෙ ච පනායස්මන්තො සාමඤ්ඤත්ථඤ්ච බ්‍රහ්මඤ්ඤත්ථඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තී ති.

( 4 )

1 සාවත්ථි -පෙ- අථ ඛො ආයස්මා කච්චානගොත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා කච්චාන ගොත්තො භගවන්තං එතදවොච. "සම්මාදිට්ඨි සම්මාදිට්ඨීති භන්තෙ වුච්චති. කිත්තාවතා නු ඛො භන්තෙ සම්මාදිට්ඨි හොතී'ති? ද්වය නිස්සිතො ඛො යං කච්චාන ලොකො යෙභුය්‍යෙන "අත්ථිතඤ්චෙව නත්ථිතඤ්ච" ලොකසමුදයඤ්ච ඛො කච්චාන යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො යා ලොකෙ නත්ථිතා, සා න හොති. ලොකනිරොධං ඛො කච්චාන යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො යා ලොකෙ අත්ථිතා, සා න හොති. උපයුපාදානාභිනිවෙසවිනිබන්ධො ඛ්වායං කච්චාන ලොකො යෙභුය්‍යෙන. තඤ්චායං උපයුපාදාන චෙතසො අධිට්ඨානං අභිනිවෙසානුසයං න උපෙති, න උපාදියති, න අධිට්ඨාති. "අත්තා මෙති දුක්ඛමෙව උප්පජ්ජමානං උප්පජ්ජති· දුක්ඛං නිරුජ්ඣමානං නිරුජ්ඣතී"ති න කඞ්ඛති, න විචිකිච්ඡති, අපරප යා ඤාණ මෙවස්ස එත්ථ හොති. එත්තාවතා ඛො කච්චාන සම්මාදිට්ඨි හොති.

'සබ්බමත්ථීති ඛො කච්චාන අයමෙකො අන්තො." "සබ්බං නත්ථීති අයං දුතියො අන්තො." එතෙ තෙ කච්චාන උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති. "අවිජ්ජා පච්චයා සඞ්ඛාරා සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං -පෙ එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. අවිජ්ජාය ත්වෙව අසෙස විරාග නිරොධා සඞ්ඛාරනිරොධො සඞ්ඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතී"ති.

( 5 )

1 සාවත්ථි -පෙ- අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච. ධම්මකථිකො ධම්මකථිකොති භන්තෙ වුච්චති. කිත්තාවතා නු ඛො

භන්තෙ ධම්මකථිකො හොති"ති? ජරාමරණස්ස චෙ භික්ඛු නිබ්බිදාය විරාගාය නිරොධාය ධම්මං දෙසෙති. "ධම්මකථිකො භික්ඛූති අලං වචනාය." ජරාමරණස්ස චෙ භික්ඛු නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති. "ධම්මානුධම්මපටිපන්නො භික්ඛූ"ති අලං වචනාය. ජරාමරණස්ස චෙ භික්ඛු නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තො හොති. "දිට්ඨධම්ම නිබ්බාණප්පත්තො භික්ඛූ"ති අලං වචනාය. ජාතියා චෙ භික්ඛු -පෙ- භවස්ස චෙ භික්ඛු, උපාදානස්ස චෙ භික්ඛු, තණ්හාය චෙ භික්ඛු, වෙදනාය චෙ භික්ඛු, ඵස්සස්ස චෙ භික්ඛු, සළායතනස්ස චෙ භික්ඛු, නාමරූපස්ස චෙ භික්ඛු, විඤ්ඤාණස්ස චෙ භික්ඛු, සංඛාරානං චෙ භික්ඛු, අවිජ්ජාය චෙ භික්ඛු, නිබ්බිදාය විරාගාය නිරොධාය ධම්මං දෙසෙති "ධම්මකථිකො භික්ඛූ"ති අලං වචනාය, අවිජ්ජාය චෙ භික්ඛු නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති "ධම්මානුධම්මපටිපන්නො භික්ඛූ"ති අලං වචනාය, අවිජ්ජාය චෙ භික්ඛු නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තො හොති "දිට්ඨධම්මනිබ්බාණප්පත්තො භික්ඛූ"ති අලං වචනායාති.

( 6 )

1 එවං මෙ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ, අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය රාජගහං පිණ්ඩාය පාවිසි. අද්දසා ඛො අචෙලකස්සපො භගවන්තං දූරතොව ආගච්ඡන්තං දිස්වාන යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො අචෙලකස්සපො භගවන්තං එතදවොච. "පුච්ඡෙය්‍යාම මයං භගවන්තං ගොතමං කඤ්චිදෙව දෙසං, සචෙ නො භවඞ්ගොතමො ඔකාසං කරොති, පඤ්හස්ස වෙය්‍යාකරණායාති " අකාලො ඛො තාව කස්සප පඤ්හස්ස. අන්තරඝරං පවිට්ඨම්හාති දුතියම්පි ඛො අචෙල කස්සපො භගවන්තං එතදවොච. "පුච්ඡෙය්‍යාම මයං භවන්තං ගොතමං කඤ්චිදෙව දෙසං, සචෙ නො භවඞ්ගොතමො ඔකාසං කරොති පඤ්හස්ස වෙය්‍යාකරණායා"ති. අකාලො ඛො තාව කස්සප පඤ්හස්ස. අන්තරඝරං පවිට්ඨම්හාති. තතියම්පි ඛො අචෙලකස්සපො භගවන්තං එතදවොච. "පුච්ඡෙය්‍යාම මයං භවන්තං ගොතමං කඤ්චිදෙව දෙසං, සචෙ නො භවඞ්ගොතමො ඔකාසං කරොති පඤ්හස්ස වෙය්‍යාකරණායා"ති. අකාලො ඛො තාව කස්සප පඤ්හස්ස. අන්තරඝරං පවිට්ඨම්හා"ති.

එවං වුත්තෙ අචෙලකස්සපො භගවන්තං එතදවොච. න ඛො පන මයං භවන්තං ගොතමං බහුදෙව පුච්ඡිතුකාමාති, පුච්ඡ කස්සප යද'ාකඞ්ඛසීති. කින්නු ඛො භො ගොතම සයං කතං දුක්ඛන්ති? මා හවං කස්සපා'ති භගවා අවොච. කිම්පන භො ගොතම පරං කතං දුක්ඛන්ති? මා හෙවං කස්සපා'ති භගවා අවොච කින්නු ඛො භො ගොතම සයං කතඤ්ච පරං කතඤ්ච දුක්ඛන්ති? මා හෙවං කස්සපා'ති භගවා අවොච. කිම්පන භො ගොතම අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං දුක්ඛන්ති? මා හෙවං කස්සපාති භගවා අවොච. කින්නු ඛො භො ගොතම නත්ථි දුක්ඛන්ති? න ඛො කස්සප නත්ථි දුක්ඛං, අත්ථි ඛො කස්සප දුක්ඛන්ති.

3 තෙන හි භවං ගොතමො දුක්ඛං න ජානාති, න පස්සතීති. න ඛො'හං කස්සප දුක්ඛං න ජානාමි, න පස්සාමි. ජානාමි ඛො'හං කස්සප දුක්ඛං, පස්සාමි ඛොහං කස්සප දුක්ඛන්ති. කින්නු ඛො භො ගොතම සයං කතං දුක්ඛන්ති? ඉති පුට්ඨො සමානො මාහෙවං කස්සපාති වදෙසි. කිම්පන භො ගොතම පරං කතං දුක්ඛන්ති? ඉති පුට්ඨො සමානො මා හෙවං කස්සපාති වදෙසි. කින්නු ඛො භො ගොතම සයං කතඤ්ච පරං කතඤ්ච දුක්ඛන්ති? ඉති පුට්ඨො සමානො මා හෙවං කස්සපාති වදෙසි. කිම්පන භො ගොතම අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං දුක්ඛන්ති? ඉති පුට්ඨො සමානො මා හෙවං කස්සපාති වදෙසි. කින්නු ඛො භො ගොතම නත්ථි දුක්ඛන්ති? ඉති පුට්ඨො සමානො න ඛො කස්සප නත්ථි දුක්ඛං අත්ථි ඛො කස්සප දුක්ඛන්ති වදෙසි. තෙන හි භවං ගොතමො දුක්ඛං න ජානාති, න පස්සතීති; ඉති පුට්ඨො සමානො න ඛො අහං කස්සප දුක්ඛං න ජානාමි. න පස්සාමි. ජානාමි ඛො අහං කස්සප දුක්ඛං, පස්සාමි ඛො අහං කස්සප දුක්ඛන්ති, වදෙසි. ආචික්ඛතු මෙ භන්තෙ භගවා දුක්ඛං, දෙසෙතු මෙ භන්තෙ භගවා දුක්ඛන්ති.

4 "සො කරොති සො පටිසංවෙදියතී'ති ඛො කස්සප ආදිතො සතො සයං කතං දුක්ඛන්ති" ඉති වදං සස්සතං එතං පරෙති. "අඤ්ඤො කරොති, අඤ්ඤො පටිසංවෙදියතීති, ඛො කස්සප වෙදනාභිතුන්නස්ස සතො පරංකතං දුක්ඛන්ති" ඉති වදං උච්ඡෙදං එතං පරෙති. එතෙ තෙ කස්සප උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති. අවිජ්ජා පච්චයා සඞ්ඛාරා සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති, අවිජ්ජායත්වෙව අසෙස විරාග නිරොධා සඞ්ඛාර නිරොධො, සඞ්ඛාරනිරොධා විඤ්ඤාණ නිරොධො, -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතී"ති.

5 එවං වුත්තෙ අචෙලකස්සපො භගවන්තං එතදවොච. අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ, සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය -පෙ- චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙව භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො, එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි, ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච, ලභෙය්‍යාහං භන්තෙ භගවතො සන්තිකෙ පබ්බජ්ජං, ලභෙය්‍යං උපසම්පදන්ති.

6 යො ඛො කස්සප අඤ්ඤතිත්ථියපුබ්බො ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛති පබ්බජ්ජං, ආකඞ්ඛති උපසම්පදං, සො චත්තාරො මාසෙ පරිවසති. චතුන්නං මාසානං අච්චයෙන පරිවුත්ථ පරිවාසං ආරද්ධචිත්තා භික්ඛූ ආකඞ්ඛමානා පබ්බාජෙන්ති උපසම්පාදෙන්ති, භික්ඛුභාවාය. අපි ච මයා පුග්ගලවෙමත්තතා විදිතාති.

7 සචෙ භන්තෙ අඤ්ඤතිත්ථියපුබ්බා ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛන්තා පබ්බජ්ජං, ආකඞ්ඛන්තා උපසම්පදං චත්තාරො මාසෙ පරිවසන්ති. චතුන්නං මාසානං අච්චයෙන පරිවුත්ථපරිවාසෙ ආරද්ධචිත්තා භික්ඛූ ආකඞ්ඛමානා පබ්බාජෙන්ති, උපසම්පාදෙන්ති භික්ඛුභාවාය. අහං චත්තාරි වස්සානි පරිවසිස්සාමි චතුන්නං ච වස්සානං අච්චයෙන පරිවුත්ථපරිවාසං ආරද්ධචිත්තා භික්ඛූ පබ්බාජෙන්තු, උපසම්පාදෙන්තු භික්ඛුභාවායා'ති.

අලත්ථ ඛො අචෙලකස්සපො භගවතො සන්තිකෙ පබ්බජ්ජං, අලත්ථ උපසම්පදං, අචිරූප සම්පන්නො ච පනායස්මා අචෙලකස්සපො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි, ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච පනායස්මා කස්සපො අරහතං අහොසී'ති.

( 7 )

---

1 සාවත්ථි -පෙ- අථ ඛො තිම්බරුකො පරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො තිම්බරුකො පරිබ්බාජකො භගවන්තං එතදවොච 'කින්නු ඛො භො ගොතම සයං කතං සුඛදුක්ඛන්ති. මා හෙවං තිම්බරුකාති භගවා අවොච. 'කිම්පන භො ගොතම පරකතං සුඛදුක්ඛ"න්ති? මා හෙවං තිම්බරුකාති භගවා අවොච.

**(ආහාර 2 වග්ගෝ.) 50**

"කින්නු බො භො ගොතම සයං කතඤ්ච පරකතඤ්ච සුඛ දුක්ඛ"න්ති? මා හෙවං තිම්බරුකාති භගවා අවොච. "කිම්පන භො ගොතම අසයංකාරං අපරකාරං අධිච්චසමුප්පන්නං සුඛදුක්ඛ"න්ති? මා හෙවං තිම්බරුකාති භගවා අවොච. "කින්නු බො භො ගොතම නත්ථි සුඛදුක්ඛ"න්ති? න බො තිම්බරුක නත්ථි සුඛදුක්ඛං අත්ථි බො තිම්බරුක සුඛදුක්ඛන්ති. තෙන හි භවඞ්ගොතමො සුඛදුක්ඛං න ජානාති, නපස්සති, න බො අහං තිම්බරුක සුඛදුක්ඛං න ජානාමි. න පස්සාමි, ජානාමි බො අහං තිම්බරුක සුඛදුක්ඛං, පස්සාමි බො අහං තිම්බරුක සුඛදුක්ඛන්ති. කින්නු බො භො ගොතම සයංකතං සුඛදුක්ඛන්ති. ඉති පුට්ඨො සමානො මා හෙවං තිම්බරුකාති වදෙසි.

කිම්පන භො ගොතම පරකතං සුඛදුක්ඛන්ති. ඉති පුට්ඨො සමානො මා හෙවං තිම්බරුකාති වදෙසි. කින්නු බො භො ගොතම සය කතඤ්ච පරකතඤ්ච සුඛදුක්ඛන්ති ඉති පුට්ඨො සමානො මා හෙවං තිම්බරුකාති වදෙසි. කිම්පන භො ගොතම අසයංකාරං අපරකාරං අධිච්චසමුප්පන්නං සුඛදුක්ඛන්ති. ඉති පුට්ඨො සමානො මා හෙවං තිම්බරුකාති වදෙසි. කින්නු බො භො ගොතම නත්ථි සුඛදුක්ඛන්ති. ඉති පුට්ඨොසමානො න බො තිම්බරුක නත්ථි සුඛදුක්ඛං, අත්ථි බො තිම්බරුක සුඛදුක්ඛන්ති වදෙසි.

තෙන හි භවං ගොතමො සුඛදුක්ඛං න ජානාති. න පස්සතීති. ඉති පුට්ඨො සමානො න බො අහං තිම්බරුක, සුඛදුක්ඛං න ජානාමි. න පස්සාමි. ජානාමි බො අහං තිම්බරුක, සුඛදුක්ඛං, පස්සාමි බො අහං තිම්බරුක සුඛදුක්ඛන්ති, වදෙසි. ආචික්ඛතු මෙ භවඞ්ගොතමො සුඛ දුක්ඛං දෙසෙතු මෙ භවඞ්ගොතමො සුඛ දුක්ඛන්ති.

2 සා වෙදනාසො වෙදියතීති බො තිම්බරුක ආදිතො සතො සයංකතං සුඛදුක්ඛන්ති, එවම්පාහං න වදාමි. අඤ්ඤා වෙදනා අඤ්ඤො වෙදියතීති බො තිම්බරුක වෙදනාභිතුන්නස්ස සතො පරකතං සුඛදුක්ඛන්ති. එවම්පාහං න වදාමි, එතෙ තෙ තිම්බරුක උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති. "අවිජ්ජා පච්චයා සඞ්ඛාරා සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති, අවිජ්ජාය ත්වෙව අසේස විරාග නිරොධා සඞ්ඛාර නිරොධො සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති"ති.

එවං වුත්තෙ තිම්බරුකො පරිබ්බාජකො භගවන්තං එතදවොච අභික්කන්තං භො ගොතම -පෙ- එසාහං භන්තෙ භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි, ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච උපාසකං මං භවං ගොතමො ධාරෙතු, අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

( 8 )

1 සාවත්ථි-පෙ-එතදවොච. අවිජ්ජානීවරණස්ස භික්ඛවෙ බාලස්ස තණ්හාය සම්පයුත්තස්ස එවමයං කායො සමුදාගතො, ඉති අයඤ්චෙව කායො බහිද්ධා ච නාමරූපං, ඉත්ථෙතං ද්වයං ද්වයං පටිච්ච ඵස්සො සළෙවායතනානි, යෙහි ඵුට්ඨො බාලො සුඛදුක්ඛං පටිසංවෙදියති, එතෙසං වා අඤ්ඤතරෙන. අවිජ්ජානීවරණස්ස භික්ඛවෙ පණ්ඩිතස්ස තණ්හාය සම්පයුත්තස්ස එවමයං කායො සමුදාගතො ඉති අයඤ්චෙව කායො බහිද්ධා ච නාමරූපං ඉත්ථෙතං ද්වයං ද්වයං පටිච්ච ඵස්සො සළෙවායතනානි, යෙහි ඵුට්ඨො පණ්ඩිතො සුඛදුක්ඛං පටිසංවෙදියති. එතෙසං වා අඤ්ඤතරෙන තත්‍ර භික්ඛවෙ කො විසෙසො, කො අධිප්පායො කිං නානාකරණං පණ්ඩිතස්ස බාලෙනාති ?

භගවංමූලකා නො භන්තෙ ධම්මා, භගවංනෙත්තිකා, භගවංපටිසරණා සාධු වත භන්තෙ භගවන්තඤ්ඤෙව පටිභාතු. එතස්ස භාසිතස්ස අත්ථො. භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති. තෙන හි භික්ඛවෙ සුණාථ සාධුකං මනසි කරොථ භාසිස්සාමීති, එවම්භන්තෙ'ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච, යාය ච භික්ඛවෙ අවිජ්ජාය නිවුතස්ස බාලස්ස යාය ච තණ්හාය සම්පයුත්තස්ස අයං කායො සමුදාගතො, සා චෙව අවිජ්ජා බාලස්ස අප්පහීනා, සා ච තණ්හා අපරික්ඛීණා, තං කිස්ස හෙතු? න හි භික්ඛවෙ බාලො අචරි බ්‍රහ්මචරියං සම්මා දුක්ඛක්ඛයාය. තස්මා බාලො කායස්ස භෙදා කායූපගො හොති. සො කායූපගො සමානො න පරිමුච්චති දුක්ඛස්මා ති, වදාමි. යාය ච භික්ඛවෙ අවිජ්ජාය නිවුතස්ස පණ්ඩිතස්ස යාය ච තණ්හාය සංයුත්තස්ස අයං කායො සමුදාගතො, සා චෙව අවිජ්ජා පණ්ඩිතස්ස පහීනා. සා ච තණ්හා පරික්ඛීණා තං කිස්ස හෙතු? අචරි භික්ඛවෙ පණ්ඩිතො බ්‍රහ්මචරියං සම්මා දුක්ඛක්ඛයාය, තස්මා පණ්ඩිතො කායස්ස භෙදා න කායූපගො හොති සො අකායූපගො සමානො පරිමුච්චති ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, පරිමුච්චති දුක්ඛස්මාති වදාමි. අයං ඛො භික්ඛවෙ විසෙසො, අයං අධිප්පායො, ඉදං නානාකරණං පණ්ඩිතස්ස බාලෙන යදිදං බ්‍රහ්මචරියවාසොති

( 9 )

(ආහාර 2 වග්ගො.) 52

1 සාවත්ථි-පෙ-පටිච්චසමුප්පාදඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි, පටිච්චසමුප්පන්නෙ ච ධම්මෙ තං සුණාථ. සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති. එවංභන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච, කතමො ච භික්ඛවෙ පටිච්චසමුප්පාදො? ජාති පච්චයා භික්ඛවෙ ජරමරණං උප්පාදෙ වා තථාගතානං අනුප්පාදෙ වා තථාගතානං ඨිතා ච සා ධාතු ධම්මට්ඨිතතා ධම්මනියාමතා ඉදප්පච්චයතා, තං තථාගතො අභිසම්බුජ්ඣති, අභිසමෙති. අභිසම්බුජ්ඣිත්වා අභිසමෙත්වා ආචික්ඛති, දෙසෙති පඤ්ඤපෙති පට්ඨපෙති, විවරති, විභජති, උත්තානී කරොති, පස්සථා'ති චාහ.

2 ජාතිපච්චයා භික්ඛවෙ ජරාමරණං -පෙ- භවපච්චයා භික්ඛවෙ ජාති. උපාදානපච්චයා භික්ඛවෙ භවො, තණ්හාපච්චයා භික්ඛවෙ උපාදානං, වෙදනාපච්චයා භික්ඛවෙ තණ්හා, ඵස්සපච්චයා භික්ඛවෙ වෙදනා, සළායතනපච්චයා භික්ඛවෙ ඵස්සො, නාමරූපපච්චයා භික්ඛවෙ සළායතනං, විඤ්ඤාණපච්චයා භික්ඛවෙ නාමරූපං, සඞ්ඛාරපච්චයා භික්ඛවෙ විඤ්ඤාණං, අවිජ්ජාපච්චයා භික්ඛවෙ සඞ්ඛාරා උප්පාදෙ වා තථාගතානං අනුප්පාදෙ වා තථාගතානං ඨිතාව සා ධාතු ධම්මට්ඨිතතා ධම්මනියාමතා ඉදප්පච්චයතා තං තථාගතො අභිසම්බුජ්ඣති. අභිසමෙති. අභිසම්බුජ්ඣිත්වා අභිසමෙත්වා ආචික්ඛති, දෙසෙති, පඤ්ඤපෙති, පට්ඨපෙති, විවරති, විභජති උත්තානී කරොති, පස්සථා'ති චාහ. අවිජ්ජාපච්චයා භික්ඛවෙ සඞ්ඛාරා ඉති ඛො භික්ඛවෙ යා තත්‍ර තථතා අවිතථතා අනඤ්ඤථතා ඉදප්පච්චයතා? අයං වුච්චති භික්ඛවෙ පටිච්චසමුප්පාදො.

3 කතමෙ ච භික්ඛවෙ පටිච්චසමුප්පන්නා ධම්මා ජරාමරණං භික්ඛවෙ අනිච්චං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මං. ජාති භික්ඛවෙ අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධ ධම්මා. භවො භික්ඛවෙ අනිච්චො සඞ්ඛතො පටිච්චසමුප්පන්නො ඛය ධම්මො වය ධම්මො විරාගධම්මො නිරොධ ධම්මො.

4 උපාදානං භික්ඛවෙ -පෙ- තණ්හා භික්ඛවෙ වෙදනා භික්ඛවෙ ඵස්සො භික්ඛවෙ සළායතනං භික්ඛවෙ නාමරූපං භික්ඛවෙ විඤ්ඤාණං භික්ඛවෙ සඞ්ඛාරා භික්ඛවෙ අවිජ්ජා භික්ඛවෙ අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධ ධම්මා. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ පටිච්චසමුප්පන්නා ධම්මා.

5 යතො ඛො භික්ඛවෙ අරියසාවකස්ස අයඤ්ච පටිච්චසමුප්පාදො ඉමෙ ච පටිච්චසමුප්පන්නා ධම්මා යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා හොන්ති, සො වත පුබ්බන්තං වා පටිධා

විස්සති, "අහොසිං නු ඛො අහං අතීතමද්ධානං, න නු ඛො අහොසිං අතීතමද්ධානං, කින්නු ඛො අහොසිං අතීතමද්ධානං, කථන්නු ඛො අහොසිං අතීතමද්ධානං කිං හුත්වා කිං අහොසිං නු ඛො අහං අතීත මද්ධානන්ති. අපරන්තං වා උපධාවිස්සති, භවිස්සාමි නු ඛො අනාගත මද්ධානං න නු ඛො භවිස්සාමි අනාගතමද්ධානං කින්නු ඛො භවිස්සාමි අනාගත මද්ධානං කථන්නු ඛො භවිස්සාමි අනාගතමද්ධානං, කිං හුත්වා කිං භවිස්සාමි නු ඛො අහං අනාගත මද්ධානන්ති.

එතරහි වා පච්චුප්පන්නං අද්ධානං අජ්ඣත්තං කථඞ්කථී භවිස්සති, අහන්නු ඛො ස්මි, නො නු ඛො ස්මි, කින්නු ඛො ස්මි, කථන්නු ඛො ස්මි, අයන්නු ඛො සත්තො කුතො නු ඛො ආගතො, සො කුහිං ගාමී භවිස්සතී'ති. නෙතං ඨානං විජ්ජති. තඞ්කිස්ස හෙතු? තථා හි භික්ඛවෙ අරියසාවකස්ස අයඤ්ච පටිච්චසමුප්පාදො ඉමෙ ච පටිච්චසමුප්පන්නා ධම්මා යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා'ති.

( 10 )

—||—

## ආහාරවග්ගො දුතියො.

—)(—

තස්සුද්දානං.

ආහාර ඵග්ගුනො චෙව-ද්වෙ ච සමණබ්‍රාහ්මණා,
කච්චාන ගොත්තො ධම්මකථී-අචෙල තිම්බරුකෙන ච,
බාලපණ්ඩිතතො චෙව-දසමො පච්චයෙන වා'ති

# ආහාර ii වර්ගය.

--||--

## පදාර්ථ:-

1 භික්ඛවෙ, මහණෙනි, භූතානං වා, උපන්නා වූ; සත්තාන, සත්වයන්ගේ; ඨිතියා, අවිච්ඡේදය පිණිස, සම්භවෙසීනං වා, ඉපදීම සොයන්නාවූ ද; සත්තානං, සත්වයන්ගේ; අනුග්ගහාය; උත්පත්තිය පිණිස; ආහාරා, ප්‍රත්‍යයයෝ; ඉමෙ චත්තාරො, මොහු සතර දෙනෙක් වෙත්.

2 කතමෙ චත්තාරො, කවර සතරදෙනෙක් ද? යත්- ඔළාරිකො වා, මහත්වූ හෝ; සුඛුමො වා, සියුම්වූ හෝ; කබලීකාරො, කබලිඞ්කාරාහාරය; දුතියො, දෙවැනිවූ; ඵස්සො, ඵස්සාහාරය; තතියො, තුන්වැනිවූ; මනොසඤ්චෙතනා, මනොසඤ්චෙතනාහාරය; චතුත්ථ, සතරවැනිවූ; විඤ්ඤාණං, විඤ්ඤාණාහාරය යන-

කිං නිදානං, කුමක් නිදාන කොට ඇත්තාහු ද?; කිං සමුදයා,

කුමක් සමුදය කොට ඇත්තාහු ද?; කිං ජාතිකා, කුමක් උත්පත්තිය කොට ඇත්තාහු ද?; කිං පභවා, කුමක් ප්‍රභව කොට ඇත්තාහුද?-

තණ්හා නිදානා, තෘෂ්ණාව නිදාන කොට ඇත්තාහුය;- අයං තණ්හා ච, මේ තෘෂ්ණා තොමෝ ද කිං නිදානා, කුමක් නිදාන කොට ඇත්තී ද?- තණ්හා, තෘෂ්ණා තොමෝ; වෙදනා, වෙදනාව නිදානකොට ඇත්තීය.- ඉමෙ සඞ්ඛාරා ච, මේ සංස්කාරයෝද- (සෙස්ස සුබොධ යි)

### 1= ආහාර සූත්‍රය.

---

## විස්තර—

**ආහාරා:-** ආහාර නම් ප්‍රත්‍යය යෝයි. "අත්තනො ඵලං ආහරන්ති'ති ආහාරා" ප්‍රත්‍යය ධර්මයෝ තම තමන්ගේ ඵලය එළවන්නාහු වෙති. එහෙයින් "ආහාරයෑ" යි කියන ලද්දාහු ය. කබලිඞ්කාරාදි සතරදෙන මෙහි ආහාර නමින් ගැනෙන්නාහු වෙති.

**සම්භවෙසීනං:-** "සම්භවං එසන්ති යෙ තෙ සම්භවෙසිනො." සම්භවය නම් හටගැනීම යි. සම්භවය සොයන්නාහු "සම්භවෙසී" නම් වෙති.

අණ්ඩජ, ජලාබුජ සත්ත්වයෝ අණ්ඩකෝශ, වස්තිකෝශයන්ගෙන් නික්මීමට පෙර "සම්භවෙසී" නම් වෙති. නික්මීමෙන් පසු "භූත" නම් වෙති. ඕපපාතිකයෝ ප්‍රථමචිත්තක්ෂණයෙහි "සම්භවෙසී" නම් වෙති විතියචිත්තක්ෂණයෙහි පටන් "භූත" නාමයට අයත් වෙති. යම්කිසි ඉරියව්වකින් උපන්නාහු හෝ ඒ ඉරියව්වෙන් වෙනස්නොවන තෙක් "සම්භවෙසී" නම් වෙති. වෙනස් වූ තැන් සිට "භූත" නාමයට අයත් වෙති.

තවද "භූත" යනුවෙන් ක්ෂයකරනලද කාමාදි ආශ්‍රවයන් ඇති රහත්හු කියැවෙති. භූත යන්නෙහි අර්ථය උපන් යනු යි. උපන් කෙනකුන්ගේ නැවත ඉපැදිය යුත්තෙක් නොවෙයි. නැවත නූප දනාහු රහත්හු යැ. එහෙයිනි "භූත" නාමයෙන් රහතුන් ගැනෙන බව කියන ලද්දේ.

එකලැ "සම්භවෙසී" යනුවෙන් සෙඛ, පුථුජ්ජන දෙකොටස ගැනෙන්නාහු වෙති. සම්භවය හෙවත් මත්තෙහි උත්පත්තිය සොයන්නාහු ස ම්භවෙසී හුය. යථොක්ත දෙකොටසට අයත්වූවෝ මතු සසර පැවැත්ම ඇත්තාහු වෙති. එහෙයිනි සම්භවෙසී යනු සෙඛ, පුථුජ්ජන දෙකොටස ගැනෙන බව කියන ලද්දේ.

**ඨිතියා:-** ඒ ඒ සත්ත්වයනට උපන් ධර්මයන්ගේ අනුප්‍රබන්ධ වශයෙන් වෙන් නොවී පැවැත්ම "ඨිති" නම් වේ.

**අනුග්ගහාය:-** නූපන් ධර්මයන්ගේ උත්පත්තිය 'අනුග්ගහ"නම්.

**කබලිඞ්කාරාහාරෝ:-** "කබලං කත්වා අජ්ඣොහරිතබ්බතො ආහාරො කබලිංකාරාහාරො" පිඩු කොට අනුභව කළයුතු ආහාරය "කබලිඞ්කාරාහාර" නම්. ඔදන, කුම්මාස (=බත්, කොමු) ආදියෙහි පවත්නා ශරීරය යාපනය කරන "රසඕජස" මේ නාමයෙන් කියන ලදී.

**ඔළාරිකො වා සුඛුමො වා:-** ස්වභාවයෙන් සූක්ෂ්මරූප පර්‍යාපන්න හෙයින් කබලිඞ්කාරාහාරය සියුම්වූයේ මැ වෙයි. එහෙත් ආහාරයප්‍රතිබද්ධ වස්තුවගේ ඖළාරිකත්වය සලකා "ඖළාරිකයැ" යි ද, සියුම්බව සලකා "සුඛුමය" යි ද කියන ලදී. ආහාරය ප්‍රතිබද්ධ වස්තූන්ගේ ද, ඖළාරික සුඛුමතාවන් එකකට වඩා අනෙකෙහි සියුම්බව සැළකීමෙන් දතයුතු.

කිඹුලන්ගේ ආහාරයට වඩා මුවරුන්ගේ ආහාරය සියුම් යැ. කිඹුල්ලු ගල්කැට අහරකොට ගනිති. මුවරු සර්ප ගෝනුසු ආදි සතුන් අහරකොට ගනිති. මුවරුන්ගේ ආහාරයට වඩා වලසුන්ගේ ආහාර සියුම් යැ. ඔව්හු තෙවසක් ඉක්මුණු අං, සත්ත්වයන්ගේ ඇටවගී ආදිය

අනුභව කෙරෙති. අං හා ඇටවගී ඔවුන්ගේ සොලවල තැවරුණු කාලෑ අල මෙන් මෘදු වෙයි. වලසුන්ගේ ආහාරයට වඩා ඇතුන්ගේ ආහාරය සියුම් යැ. ඇතුන්ගේ ආහාරයට වඩා ගවර, ගොණ, මුව ආදීන්ගේ ආහාර සියුම් වෙයි. ඔව්හු නිසරු සොල ආදිය බුදිති. ඔවුන්ගේ අහරට වඩා ගවයන්ගේ අහර සියුම් වෙයි. ඔව්හු තණ ආදිය බුදිති. ඔවුන්ගේ අහරයට වඩා සාවුන්ගේ අහර සියුම් යැ. ඔවුන්ගේ අහරයට වඩා පක්ෂීන්ගේ ආහාරය සියුම් යැ. ඔවුන්ගේ ආහාරයට වඩා ප්‍රත්‍යන්තවාසි මනුෂ්‍යයන්ගේ ද, ඔවුන්ගේ ආහාරයට වඩා ගම්මුදලිවරුන්ගේ ආහාරය ද, ඔවුන්ගේ ආහාරයට වඩා රාජ රාජ මහාමාත්‍යයන්ගේ ආහාරය ද, ඔවුන්ගේ ආහාරයට වඩා සක්විති රජුන්ගේ ආහාරය ද, සක්විතිරජුන්ගේ ආහාරයට වඩා භූම්‍යස්ථ දෙවියන්ගේ ආහාරය ද, ඔවුන්ගේ ආහාරයට වඩා සිව් මහරාජිකයෙහි දෙවියන්ගේ ආහාරය ද, යනාදි නයින් පරනිම්මිත වසවත්ති දෙවියන්ගේ ආහාරය දක්වා එකකට එකක් සියුම් වෙයි. පරනිම්මිතවසවත්ති දෙවියන්ගේ ආහාරය ඉතා මැ සියුම් යැ එයට වඩා සියුම් ආහාරයෙක් නොවෙයි. තවද වඩ වඩා ඖළාරිකවස්තූන්හි ඕජාව මඳ වෙයි. එසේ මැ දුර්වල යැ. සියුම් වස්තූන්හි ඕජාව අධික යැ. එසේ මැ බලවත් යැ. කැඳ බොහෝ පිව ද මඳ වේලාවකින් බඩයා ඇත්තේ වෙයි. ගිතෙල් ටිකක් පිව ද බොහෝ වේලාවක් අහරක් නැතිව සිටිය හැක්ක.

ඕජාව ප්‍රතිබද්ධ වස්තුව කම්ජතේජසය යි කියනලද ජඨරාග්නිය (=බඩගින්න) දුරලයි. ශරීරය පාලනය කිරීමෙහි ශක්තියක් එහි නැත. ඕජාතොමෝ ශරීරය පාලනය කරන්නී වෙයි. බඩගින්න නිවීමෙහි බලය එයට අයත් නොවේ. වස්තුව හා ඕජාව එක්ව පරිශ්‍රය විනෝදනය (බඩගින්න නිවීම) ද, ශරීර පාලනය ද යන දෙක සිඞ කෙරෙති.

**ඵස්සො දුතියො:-** ඵස්සාහාරය නම් ඵස්ස චෛතන්‍යව යි. චක්ඛුසම්ඵස්ස, සොතසම්ඵස්ස යනාදි විසින් එය සවැදෑරුම් වන්නේ යැ. තත් සම්ප්‍රයුක්තයනට හා තත් සමුත්ථානරූපයනට ද උපස්තම්භකව පවත්නේ වෙයි. "දුතියො" යනු දේශනා ක්‍රමය යි. අසුවල් කරුණින් දෙවැනි වේයැ යි කියයුත්තෙක් නැත. 'තතියො' යනාදිය ද එසේ මැ යි.

**මනොසඤ්චෙතනා:-** එනම් චේතනා චෛතසිකය යි. එද තත්සම්ප්‍රයුක්තායනට හා තත්සමුත්ථාන රූපයනට ද උපස්තම්භක ව පවත්නේ වෙයි.

විඤ්ඤාණං:- විඤ්ඤාණය නම් චිත්තය යි. එද තත් සම්ප්‍රයුක්ත යනට හා තත්සමුට්ඨාන රූපයනට උපස්තම්භකව පවත්නේ වෙයි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රයෙහිදී 'උපාදිණ්ණක, අනුපාදිණ්ණක' වශයෙන් එක්රැස් කොට චතුර්විධ ආහාරයන් දක්වූ සෙයෙක.

කබලීකාරාහාරය වනාහි උපාදින්නක අනුපාදින්නක වශයෙන් දෙයාකාරයකින් පවත්නේ වෙයි. ඵස්සාහාරාදිය ද එසේ මැ යි

සර්පාදීන් විසින් ගිලිනලද මණ්ඩූක (=මැඩි) ආදීන්ගේ වශයෙන් "උපාදිණ්ණක කබලීකාරාහාරය" දතයුතු. සර්පාදීන් විසින් ගිලින ලද මණ්ඩූකාදිහු කුසතුළැ ද මඳකලක් ජීවත් වන්නාහු යැ. ජීවත් වන තාක් ආහාරකෘත්‍යය සිද්ධ නොකෙරෙති. උපාදිණ්ණක නමුදු වෙති. දිවි තුරන් වීමෙන් අනුපාදිණ්ණක පක්ෂයෙහි සිටියාහු මැ ආහාරකෘත්‍යය සිදු කෙරෙති. එකල්හි ද උපාදිණ්ණකාහාරයැ යි ඇතැම්හු කියත්. උපාදිණ්ණක ආහාරය පිළිබඳ ව දක්වූ මේ මතය අටුවාචාරීන් විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

සත්වයන්ගේ ප්‍රතිසන්ධි චිත්තය හා උපන් කර්මජ ඕජාවෙක් වෙයි. මෙය ආහාර අනුභව කරනලද්දූ වූ ද, නොකරනලද්දූ වූ ද සත්වයන් සත්වැනි දවස දක්වා පාලනය කිරීමෙහි බලයෙන් යුක්ත යැ. උපාදින්නකකබලීකාරාහාරය යනු මෙයැ යි දත යුතු. කාම, රූප, අරූප යන ත්‍රෛභූමක විපාකයන්ගේ වශයෙන් උපාදින්නක ඵස්සාදිය දතයුතු. එසේම ත්‍රෛභූමක කුශලාකුශල ක්‍රියාවන්ගේ වශයෙන් අනුපාදින්නක ඵස්සාදිය දතයුතු. ලොකොත්තර කුශල විපාකයෝ රූඪිවශයෙන් මෙසේ කියනලද්දාහු යැ.

ප්‍රත්‍යය ධර්ම ආහාර යන්නෙන් ගැනෙන බව යට කියන ලදී. එසේ වුවහොත් සත්වයනට අන්‍යවූ ද ප්‍රත්‍යයන් ඇතිකල්හි කබලීකාරාදි සතර පමණක් ආහාරයැ යි කුමක් හෙයින් කියන ලද්දාහු ද? අජ්ඣත්තික සන්තතියට විශෙෂ ප්‍රත්‍යය වන හෙයිනි. කබලීකාරාහාරය අනුභව කරන්නාවූ සත්වයන්ගේ රූපකායට විශෙෂප්‍රත්‍යයව වන්නේ යැ.

නාමකායයෙහි වෙදනාවට ස්පර්ශය විශෙෂප්‍රත්‍යය වන්නේ යැ. එසේම නාමකායයෙහි විඥානයට මනොසඤ්චෙතනාතොමෙ විශෙෂ ප්‍රත්‍යය වන්නේ යැ. නාමකායයෙහි නාමරූපයට විඥානය විශෙෂ ප්‍රත්‍යය. වන්නේ යැ "සෙය්‍යථාපි භික්ඛවෙ අයං කායො ආහාරට්ඨිතිකො ආහාරං පටිච්ච තිට්ඨති. අනාහාරො නො තිට්ඨති. තථා ඵස්සපච්චයා වෙදනා- සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං- විඤ්ඤාණපච්චයා නාමරූපං" යනු එහෙයින් වදාරණ ලදී

(ආහාර 2 වගෙගා.) 58

ගනී නු සි ආහාර නම් වේ- යනු යට කියන ලදී. කුමක් ගන්නා හෙයින් ආහාර නම් වන්නේ ද? යත්- කබලිඞ්කාරාහාරය, ඕජට්ඨමක (=ඕජාව අටවැනි කොට ඇති) රූපය ඉපදවීම කරන්නේ යැ. පඨවී- ආපො- තෙජො- වායො- වණ්ණ- ගන්ධ- රස- ඕජා යන මොව්හු ඕජට්ඨමක රූපයෝ යි. කිසියම් ආහාර යක් මුවෙහි තුබූ කෙණෙහි යථොක්ත රූප අට උපදනාහු වෙති. එසේම සපා අනුභව කරනලද එක එක බත්තුලක් ද රූප අට අට බැගින් ඉපදවීමට සමර්ථ යැ. මෙසේ හෙයින් කබලිඞ්කාරාහාරය ඕජට්ඨමක රූපය උපදවන්නේයැ යි කියන ලදී.

ඵස්සාහාරය, සුඛ- දුඃඛ- අදුක්ඛමසුඛ සංඛ්‍යාත ත්‍රිවිධ වෙද නාවන් උපදවන්නේ යැ. සුඛවෙදනීය ස්පර්ශයක් ලැබෙන කලැ සුඛ වෙදනාව ද, දුඃඛවෙදනීය ස්පර්ශයක් ලැබෙන කලැ දුඃඛ වෙද නාව ද, උපෙක්ෂාවෙදනීය ස්පර්ශයක් ලැබෙන කලැ උපෙක්ෂා හෙවත් අදුක්ඛමසුඛ වෙදනාව ද උපදනේ වෙයි. මෙසේ ඵස්සා හාරය සර්වප්‍රකාරයෙන් මැ ත්‍රිවිධ වෙදනාවන් උපදවන්නේයැ යි කියන ලදී.

මනොසඤ්චෙතනාහාරය, ත්‍රිවිධ භවයන් ගන්නේ යැ. කාමභවූපග (=කාමභවයෙහි උත්පත්තිය ලැබීමට සුදුසු) කර්මබල යෙන් සත්ත්වයා කාමභවයට අදනේ යැ. එසේම රූප- අරූප භවූපග කර්මයෝ ද සත්ත්වයා රූප- අරූප භවයන්හි උපදවන්නාහු වෙති. මෙසේ මනොසඤ්චෙතනාහාරය සර්වප්‍රකාරයෙන් මැ ත්‍රිවිධ භව යන් ගන්නේයැ යි කියන ලදී.

විඤ්ඤාණාහාරය, ප්‍රතිසන්ධි- නාමරූපයන් ගන්නේ යැ. විඥාන ය සමග මැ තත් සම්ප්‍රයුක්ත වූ වෙදනාදි ත්‍රිවිධ ස්කන්ධයෝ ද, ප්‍රති සන්ධික්ෂණයෙහි උපදනාහු වෙති. එසේම කායදසක- භාවදසක- වත්ථුදසක සංඛ්‍යාත සමතිස් රූපයෝ ද උපදනාහු යැ. මෙසේ විඥානාහාරය සහජාතාදි ප්‍රත්‍යය වශයෙන් නාමරූපයන් ගන්නේ යැ යි දතයුතු.

මෙහි මනොසඤ්චෙතනා යනුවෙන් කුශලාකුශල චෙතනා ද, විඤ්ඤාණ යනුවෙන් ප්‍රතිසන්ධි විඥානය ද කියන ලද්දුහ. මෙසේ තත් සම්ප්‍රයුක්ත වූද, තත් සමුට්ඨාන වූ ද ධර්මයන් ගන්නා හෙයින් අවිශෙෂයෙන් කබලිඞ්කාරාදි සතරදෙන ආහාර නාමයෙන් කියන ලද්දුහ.

මේ චතුර්විධාහාරයන් අතුරෙන් කබළීඞ්කාරාහාරය උපස්තම්භනය කිරීම් වශයෙන් ආහාර කෘත්‍යය සිද්ධ කරන්නේ යැ. එසේම ඵස්සාහාරය ස්පර්ශ කිරීම් වශයෙන් ද, මනොසඤ්චෙතනාහාරය රැස්කිරීම් වශයෙන් ද, විඤ්ඤාණාහාරය විජානනය කිරීම් වශයෙන් ද ආහාර කෘත්‍යය සිද්ධ කරන්නාහු වෙති.

කෙසේ ද? යත්- කබළීඞ්කාරාහාරය වනාහි ශරීරය නොසිඳ හෙවත් ස්ථිර වැ පැවැත්වීමෙන් සත්ත්වයාගේ ස්ථිතියට උපකාරවූයේ වෙයි. කර්මබලයෙන් උපදනා ලබන හෙයින් කර්මජ වූ සත්ත්වශරීරය කබළීඞ්කාරාහාරයෙන් ලබනලද උපස්තම්භනය ඇති ව මැ දශවර්ෂයක් සියක්වර්ෂයක් ආදි වශයෙන් පවත්නේ යැ.

ළදරුවාගේ උත්පත්තිය වනුයේ මවගෙනි. එසේ වුවද කිරිදීම් ආදියෙන් මනාව කරනු ලබන කිරිමවගේ උපස්ථාන බලයෙන් බොහෝ කලක් ජීවත් වන්නේ යැ.

තවද දිරීමෙන් ඇදවැටීමට ආසන්න වූ ගෘහය උපස්තම්භනය (=රුකුල) ක් ලැබීමෙන් නොවැටී පවත්නේ යැ. "යථා මහාරාජ! ගෙහෙ පතමානෙ අඤ්ඤෙන දාරුනා උපත්ථම්භිතං සන්තං එවං තං ගෙහං න පතති. එවමෙව ඛො මහාරාජ! අයං කායො ආහාරට්ඨිතිකො ආහාරං පටිච්ච තිට්ඨති" යනු එහෙයින් වදාරන ලදි. එමෙන් මැ ශරීරය ද ආහාරයෙන් උපස්තම්භනය කරන ලදුයේ මැ පවත්නේ වෙයි. කබළීඞ්කාරාහාරය උපස්තම්භනය කිරීම් වශයෙන් ආහාර කෘත්‍යයසිද්ධකරන්නේයැ යි කියන ලදුයේ එහෙයිනි.

මෙසේ කෙරෙමින් ආහාරසමුට්ඨානක, උපාදින්නකසඞ්ඛ්‍යාත දෙවැදෑරුම් රූපසන්තතියට ප්‍රත්‍යය ද වන්නේ යැ. අනුපාලනය කරන්නෙක් වැ කර්මජ රූපයනට ප්‍රත්‍යය වෙයි. ඔජට්ඨමකරූප උපදවන්නෙක් වැ ආහාරසමුට්ඨාන රූපයනට ප්‍රත්‍යය වන්නේ යැ.

ඵස්සාහාරය වනාහි සුඛාදි වේදනාවනට වස්තුභූත වූ අරමුණු ස්පර්ශ කරමින් මැ සුඛාදි වේදනා පැවැත්වීම හේතුකොටගෙන සත්ත්වයන්ගේ ස්ථිතියට ප්‍රත්‍යය වන්නේ යැ.

මනොසඤ්චෙතනාහාරයතෙම කුශලාකුශලකර්මවශයෙන් ආයූහනය කරමින් මැ භවමූලය නිපදවන හෙයින් සත්ත්වයන්ගේ ස්ථිතියට ප්‍රත්‍යය වන්නේ යැ.

විඥානාහාරයතෙම විජානනය කරමින් මැ නාමරූප ප්‍රවර්තනය හේතුකොටගෙන සත්ත්වයන්ගේ ස්ථිතියට ප්‍රත්‍යය වෙයි.

මෙසේ උපස්තම්භනාදි වශයෙන් ආහාර කෘත්‍යය සිද්ධකරන්නා වූ මොවුහු කෙරෙහි භය සතරෙක් විද්‍යමාන වෙති.

ඔව්හු නම්- කබලිඞ්කාරාහාරයෙහි නිකන්ති සඞ්ඛ්‍යාත තෘෂ්ණාව ද, ඵස්සාහාරයෙහි උපගමනය ද, මනොසඤ්චෙතනාහාරයෙහි රැස්කිරීම ද, විඥනාහාරයෙහි අභිනිපාතය හෙවත් ඒ ඒ භවයෙහි පහලවීම ද යන මොව්හු යැ.

කවර හේතුවකින් මෙසේ පවත්නාහු ද? යත්- ලොකයෙහි සත්ත්වයෝ කබලිඞ්කාරාහාරයෙහි තෘෂ්ණාව උපදවා ශීතොෂ්ණාදීයෙන් මැඩෙමින් අහාර සෙවීම පිණිස නොයෙක් කම්කටොලු වල පවා යෙදෙමින් දුකට භාජන වෙති.

සර්වඥයන් වහන්සේ විසින් පැවිද්දන්හට තහනම් කොට වදාළ වෙදකම්කිරීම් නැකැත්කීම් ආදි එක්විසි අනෙසන (=පැවිද්දන් විසින් නොසෙවිය යුතු ධර්ම) කෙනෙක් වෙති. ආහාරපාන සෙවීම පිණිස තහනම් කොට වදාළ මේ ධර්මයන්හි යෙදෙමින් ඇතැම් දුසිල් මහණහු මෙලොව අපකීර්තියට භාජන වෙති.

“තස්ස සඞ්ඝාටි'පි ආදිත්තා සම්පජ්ජලිතා” යනාදීන් ලක්ඛණ සංයුත්තයෙහි කියනලද ක්‍රමයෙන් මතු ආත්මභාවයන්හි ද ප්‍රෙතයොනි ආදියෙහි ඉපිද ගිනිගෙන දිලියෙන ලෝස්වුරු ආදිය දැරීමෙන් නොයෙක් දුඃඛයනට භාජන වෙති. මේ හේතුවෙන් කබලිඞ්කාරාහාරයෙහි තෘෂ්ණාව කියවශයෙන් පවත්නී යැ යි දතයුතු.

ස්පර්ශය කෙරෙහි ලොල්භාවයට පැමිණියාහු පරදාරාව (=පර ස්ත්‍රී)න් කෙරෙහි වරදවා හැසිරෙති. සැමියන්හට අසුවූ කලැ එබදු වූ දරුවන් සහිත ඔව්හු නොයෙක් අයුරින් තලා පෙළා කසළ ගොඩට හෝ ඇද දමනු ලබති. රජ පුරුෂයනට හෝ භාරදෙනු ලබති. එකලැ රජදරුවන් විසින් නියම කරනු ලබන නානාප්‍රකාර දණ්ඩනවලට ද භාජන වෙති පරලෙව්හි දුගතියෙහි උත්පත්තිය ලබා බොහෝකලක් දුක් විඳින්නාහු මැ වෙති. මෙසේ ආස්වාදනය කිරීම් විසින් ස්පර්ශය කෙරෙහි උපගමනය මෙලෝ පරලෝ දෙක්හි භයට මැ කාරණා වන්නේ යැ. මෙසේ හෙයින් ස්පර්ශයෙහි උපගමනය මැ භයවශයෙන් පවත්නේය යි දතයුතු.

භවයෙහි උපදිනු ලබන්නාහු භවමූලික සකල දුඃඛයනට මැ භාජන වෙති. නැවත නැවත භවයෙහි උත්පත්තිය ගෙනදෙනුයේ කුශලාකුශල කර්ම රැස්කිරීම ඇතිකල්හි යැ. එහෙයින් මනොසඤ්චෙතනාහාරයෙහි ආයූහනය (=කුශලාකුශල කර්ම රැස්කිරීම)මැ භයවශයෙන් පවත්නේය යි දතයුතු

යම් යම් තැනෙක්හි ප්‍රතිසන්ධි විඥනය පහල වන්නේ ද, හෙවත් සත්ත්වයාගේ උත්පත්තිය ඇතිවන්නේ ද ඒ ඒ තන්හි ප්‍රතිසන්ධි නාමරූපයෙන් යුක්ත ව මැ පහලවන්නේ යැ. එසේ උපන්

කල්හි මැ සියලු භය නිපදනාහු වෙති. එහෙයින් ප්‍රතිසන්ධි විඥානය භයොත්පත්තියට මූලික වෙයි. මෙසේ විඥානය කෙරෙහි අභිනිපාතය (=ඒ ඒ භවයන්හි පහළවීම) භය වශයෙන් පවත්නේයැ යි දතයුතු.

**ඉමෙ චත්තාරො ආහාරා තණ්හා නිදානා**:- කබලීඞ්කාරාදි මේ චතුර්විධ ආහාරයෝ තෘෂ්ණාව නිදානකොට ඇත්තාහු යැ. ප්‍රතිසන්ධිය මුල්කොට ඇති ආත්මභාව සඞ්ඛ්‍යාත ආහාරයනට පූර්ව තෘෂ්ණාතොමෝ මුල් වන්නී යැ. ඒ කෙසේ ද? යත්- ප්‍රතිසන්ධි ක්‍ෂණයෙහි පිරිපුන් ආයතන ඇති සත්ත්වයනට උඩත් පිරිසෙන් රූප සන්තති (=කලාප) සතක් පහළ වෙති. චක්ඛුදසක, සොතදසක, ඝානදසක, ජිව්හාදසක, කායදසක, භාවදසක, වත්ථුදසක වශයෙනි. අෂ්ටවිධ අවිනිර්භොග රූපය, (=පඨවි, ආපො, තෙජො, වායො, වණ්ණ, ගන්ධ, රස, ඔජා යන අට යි.) ජීවිතෙන්ද්‍රිය හා චක්ඛායතනය "චක්ඛුදසක" නම් වේ. මෙසේම අවිනිර්භොගරූප, ජීවිතෙන්ද්‍රිය යන් හා පවත්නා සොතායතනාදිය ද "සොතදසක" 'ඝානදසකා"දි නාම ලබන්නාහු වෙති.

ඇතැම් කෙනකුන්හට ප්‍රතිසන්ධික්‍ෂණයෙහි යථොක්ත සප්ත සන්තතීන්ගේ හෙවත් සප්ත දශකයන්ගේ මැ සම්පූර්ණත්වයෙක් නොලැබේ එකලැ පිරිහුණු ආයතන අනුව ඒ ඒ දශකයන්ගේ හෙවත් රූපසන්තතීන්ගේ ද ඌනත්වය වන්නේ යැ

මෙසේ ප්‍රතිසන්ධියෙහි දී ලබනලද රූපයනට අයත් ඔජාව **උපාදින්නක කබලිඞ්කාරාහාරය** යි කියනු ලැබේ එය තෘෂ්ණාව නිදානකොට ඇත්තේ වෙයි.

ප්‍රතිසන්ධි චිත්තය හා යෙදුණු ඵස්සය, චෙතනාය යන මොව්හු ක්‍රමයෙන් **උපාදින්නක ඵස්සාහාර, උපාදින්නක මනොසඤ්චෙතනාහාර** නම් වන්නාහු යැ. ප්‍රතිසන්ධි චිත්තයතෙම **උපාදින්නක විඤ්ඤාණාහාර** නම්. ප්‍රතිසන්ධික වූ මේ ජ විධ ආහාරයෝ ද පූර්ව තෘෂ්ණාව මැ නිදාන කොට ඇත්තාහු යැ.

යම්සේ ප්‍රතිසන්ධික වූ ආහාරයෝ පූර්ව තෘෂ්ණාව නිදාන කොට ඇත්තාහු ද, එසේම එයින් පසු භවාඞ්ගාදි චිත්තක්‍ෂණයන්හි උපදනා වූ ආහාරයෝ ද තෘෂ්ණාව මැ නිදාන කොට ඇත්තාහු යැ යි දතයුත්තාහ.

භාග්‍යවතුන් වහන්සේ හුදෙක් ආහාරයාගේ මැ නිදානය දෙශනාකළාහු නොවෙති. ආහාරයට නිදාන වූ තෘෂ්ණාවගේ නිදානය ද එසේම වෙදනාදීන්ගේ නිදානයන් ද දෙශනාකළ සේක.

මෙසේ 'තණ්හාචායං භික්ඛවෙ කිං නිදානා' යනාදීන් සංසාර ප්‍රවෘත්තිය (=පැවැත්ම) දක්වා පසුව සංසාරයාගේ නිවෘත්තිය (=නැවැත්ම) දක්වා වදාළ සේක. මේ සූත්‍රයේ දී අතීතාභිමුඛ කොට දෙශනය පැවැත්වූ හෙයින් අතීතයෙන් සංසාරයාගේ පැවැත්ම ප්‍රකාශිත යැ.

කෙසේද? යත්– ආහාර වශයෙන් මේ ආත්මභාවය ප්‍රතිලබ්ධ යැ. තෘෂ්ණාතොමෝ එයට ජනකකර්ම වන්නී යැ. යම් ආත්මභාවයකට ගොස් කම් රැස්කරන ලද ද? එය දැක්වීමට වෙදනා, ඵස්ස සළායතන, නාමරූප, විඥන යන මොහු කියනලද්දහු වෙති. අවිද්‍යා, සංස්කාරයෝ ඒ ආත්මභාවයාගේ ජනකකර්මයෝ යැ.

මෙසේ දෙතැනෙක්හි ඒ ආත්මභාවය ද, දෙතැනෙක්හි ඒ ආත්මභාවයාගේ ජනකකර්මය ද ප්‍රකාශිත හෙයින් සංක්ෂෙපයෙන් අතීත වූ කර්මය ද, විපාකය ද දර්ශිතයහ. මෙසේ අතීතාභිමුඛකොට අතීතයෙන් වට්ටය =සංසාරයාගේ ප්‍රවෘත්තිය) දක්වනලද බව දතයුතු.

එකල්හි අනාගත වශයෙන් පැවැත්ම නොදක්වන ලද හෙයින් මේ දෙශනය සම්පූර්ණ නොවන්නේයැ යි නොසිතිය යුතු. නය(යුක්ති) වශයෙන් සම්පූර්ණ හෙයිනි.

ඇස් ඇති පුරුෂයෙක් දිය මතුයෙහි සිටි කිඹුලකු එකවිට මැ දැක පසුව ඔහුගේ වාලධිය දක්වා පරීක්ෂාවෙන් බලන්නේය යි සිතම්හ. එකලැ ග්‍රීවය ද, අනතුරු ව පිට ද, අවසානයෙහි වාලධිමූල ද ඔහුට දක්නට ලැබෙන්නේ යැ. දිය යට පවත්නා වාලධිය අග හෝ බඩෙහි යටභාගය සතර අත්පා හෝ දක්නට නොලැබෙන්නේ යැ. එසේ වුවත් ඒ පුරුෂතෙම ජලයෙහි පවත්නේ කිඹුලාගේ කොටස නැ යි නොසිතන්නේ යැ. යුක්තිය අනුව සම්පූර්ණ කිඹුලකු බව මැ සලකන්නේ යැ. මේ දෙශනය ද එසේම සැලැකිය යුතු.

ත්‍රෛභූමක වෘත්තය දිය මතුයෙහි උන් කිඹුලාට සමාන යැ. යොගාවචරතෙම ඔහු දුටු ඇස් ඇති පුරුෂයා මෙනි. යොගීහු විසින් ආහාර වශයෙන් මේ ආත්මභාවය දක්නාලද කාලය පුරුෂයා විසින් කිඹුලා දක්නාලද කාලයට සමාන යැ. එසේම මේ ආත්මභාවයට ජනක වූ තෘෂ්ණාවගේ දර්ශිත කාලය කිඹුලාගේ ග්‍රීවය දක්නාලද කාලය මෙනි. යම් ආත්මභාවයෙක්හි තෘෂ්ණා සඞ්ඛ්‍යාත කර්මය කරන ලද ද? වෙදනාදි වශයෙන් ඒ තෘෂ්ණාවගේ දර්ශිත කාලය කිඹුලාගේ පිට දක්නා කාලයට සමාන යැ. ඒ ආත්මභාවයට ජනක වූ අවිද්‍යා සංස්කාරයන්ගේ දර්ශිත කාලය වාලධිය දක්නාලද කාලය බඳු

වෙයි. යම් තැනෙක්හි ප්‍රත්‍යය ධර්මයන්ගේ ප්‍රවෘත්තිය දෙශනායෙහි නොපැමිණියේ ද, ඒ ඒ තන්හි දෙශනය අපරිපූර්ණය යි නොගෙන නය වශයෙන් සම්පූර්ණත්වය දැනීම සම්පූර්ණ කිඹුලකු බව සිතීම මෙනැ යි දතයුතු.

මෙහි ආහාර + තෘෂ්ණාවන්ගේ අතර එක් සන්ධියකි. තෘෂ්ණා + වෙදනාවන්ගේ අතර එක් සන්ධියකි. විඥාන + සංස්කාරයන්ගේ අතර එක් සන්ධියකි. මෙසේ ත්‍රිසන්ධිය ද, එයට අයත් සංක්ෂෙප සතර ද ඇති වට්ට (=සංසාර) ය දෙශනා කරන ලදි.

**ප්‍රථම ඵග්ගුන සූත්‍රයාගේ විස්තරය මෙතෙකින් සමාප්තයි.**

(2)

## පදාර්ථ—

1 එවං, මෙසේ; වුත්තෙ, වදාළකල්හි; ආයස්මා මොළියඵග්ගුනො, ආයුෂ්මත් වූ මොළියඵග්ගුන ස්ථවිරතෙම; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; ‘භන්තෙ, ස්වාමිනි! කො නු ඛො, කවරෙක් වනාහි විඤ්ඤාණාහාරං විඥානාහාරය; ආහාරෙති ඉති, ගන්නේද’? යන; එතං, මෙය; අවොච, කීයේ යැ

නො කල්ලො, නුසුදුසු වූ; පඤ්හො ඉති, ප්‍රශ්න යැ යි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; අවොච, වදාළසේක. ආහාරෙති ඉති. ගන්නේයැ යි; අහං, මම; න වදාමි, නො කියමි; යදි ච, යම්හෙයකිනුදු; අහං, මම; ආහාරෙති ඉති, ගන්නේයැ යි; වදෙය්‍යං කියන්නෙම් නම්; තත්‍ර, (මා විසින් දෙශිත) ඒ කාරණයෙහිලා; පඤ්හො, ‘කො නු ඛො භන්තෙ! ආහාරෙති’ යන ප්‍රශ්නය කල්ලො අස්ස, සුදුසු වන්නේ යැ; අහං, මම; එවං, මෙසේ; නවදාමි, නො කියමි.

යො, යමෙක් තෙම; එවං අවදන්තං. මෙසේ නො දෙසන්නාවූ; මං, මා; ‘භන්තෙ, ස්වාමිනි! විඤ්ඤාණාහාරො ඛො, විඥානාහාරය වනාහි; කිස්ස, කුමකට; පච්චයො නු, ප්‍රත්‍යය වන්නේ ද? යන; එවං මෙසේ; පුච්ඡෙය්‍ය, විචාරන්නේ නම්; එසො මේතෙම; කල්ලො පඤ්හො, සුදුසු ප්‍රශ්නයකි.

තත්‍ර, මෙසේ විචාරණලද්දෙහි ලා; විඤ්ඤාණාහාරො, විඥානාහාරය හෙවත් ප්‍රතිසන්ධි චිත්තය තෙම; ආයතිං, මත්තෙහි; පුනබ්භවාභිනිබ්බත්තියා, පුනර්භවයාගේ අභිනිෂ්පත්තියට හෙවත් යථොක්ත විඥාන සහජාත නාමරූපයට; පච්චයො ඉති, ප්‍රත්‍යය වන්නේය යනු; කල්ලං, සුදුසුවූ; වෙය්‍යාකරණං විසඳීමෙක්

වෙයි; තස්මිං භූතෙ සති, ඒ පුනර්භවාභිනිෂ්පත්තිසඞ්ඛ්‍යාත නාම රූපය උපන්කල්හි; සළායතනං ෂඩායතනය වන්නේය; සළායතන පච්චයා, ෂඩායතනප්‍රත්‍යය යෙන්; ඵස්සො ඉති, ස්පර්ශය වන්නේය යනුයි.

2 ඵුසති, ස්පර්ශ කන්නේ ද? ඵස්සො, ස්පර්ශය තෙම; කිම්පච්චයා, කවර ප්‍රත්‍යයකින් වන්නේ ද?-

වෙදියති, විඳිනු ලබන්නේ ද?- වෙදනා, වෙදනා තොමෝ; කිම්පච්චයා, කවර ප්‍රත්‍යයකින් වන්නේද ?-

තණ්හියති, තෘෂ්ණාකරනු ලබන්නේ ද?- තණ්හා, තෘෂ්ණා තොමෝ; උපාදියති, ගන්නා ලැබේ ද?-

3 ඵග්ගුන, ඵග්ගුනය; තු, තවද; ඡන්නං ඵස්සායතනානං, ෂට් ස්පර්ශායතනයන්ගේ (සෙසුතන්හි අර්ථ යට කියනලද අයුරු දතයුතු.)

2 ඵග්ගුන සූත්‍රය යි.

විස්තරාර්ථ—

සමනවෙඛිනං වා අනුශාසනාය:- මෙතැන්හි දී භාග්‍යවතුන් වහන්සේ මෙම සූත්‍රය නිමාවට පැමිණ වූහු. කවර හෙයින් ද? යත්- දෘෂ්ටිගතිකයකු සිටි බැවිනි. මොළියඵග්ගුන නම් වූ දෘෂ්ටිගතික භික්ෂුවක් මේ පිරිසෙහි වී යැ. එහෙයින් තථාගතයන් වහන්සේ මෙසේ සිතූහු. මේ තෙම එළඹ පැන පිළිවිසින්නේ යැ. එකලැ මම විසඳන්නෙමි. එයට අවකාශ දෙනු පිණිස දෙශනාව මෙයින් අවසන් කළහ.

මොළි යනු සංයත කරනලද හෙවත් බඳනා ලද කෙශයට නමි. මොහු ගිහිගෙහි වසන කලැ බද්ධකෙශය (=කොණ්ඩය) මහත් ව පැවැතිණ. එහෙයින් ඔහුට 'මොළියඵග්ගුන'ය යි කියන ලදී. පැවිදි වූ කල්හි ද ඒ නමින් මැ හැඳින් විණ.

ඵනාදමොච:- දෙශනාවගේ පූර්වාපර සන්ධි සම්බන්ධ කරනුයේ "ස්වාමිනි! කවරෙක් විඤ්ඤාණාහාර ගන්නහු ද" යන වචනය කියේ යැ. යමෙක් මේ විඥානාහාරය වළඳන්නේ නම් ඔහු කවරෙක් ද? යනු මෙයින් ඇසූ අර්ථය යි.

මේ භික්ෂුතෙම කබලිඞ්කාරාදි අවශෙෂ ත්‍රිවිධ ආහාරයන් හැර විඥානාහාරය මැ කුමක් හෙයින් විචාළේ ද? යත්--එම ආහාර දනිමි, යන හැඟීම ඇති හෙයිනි.

ගේ පිඩු පිඩු කොට කබලිඞ්කාරාහාරය වළඳන්නවුන් දක්නේ යැ. එහෙයින් එය දනිමි, යන හැඟීම ඇත්තේ යැ.

වටු, මොනර, කුකුළු ආදි බිජුවටින් උපදනා සත්වයන් එහි දී ජීවත් වන්නේ මවගේ සපර්ශයෙනි. මොවුන් ඵස්සාහාරයෙන් යැපෙන සේ සිතා. එහෙයින් එය දනිමි, යන හැඟීම ඇත්තේ යැ.

කැසුබුවෝ තමන්ගේ ඍතු සමයයෙහි මුහුදෙන් ගොඩට විත් වැලියට බිජු ලා මුහුදට මැ යෙති. මවගේ සිහිකිරීම් බලයෙන් එම බීජගත සත්වයන්ගේ වැඩීම වන්නේ යැ. ඔව්හු මනොසඤ්චෙතනා ආහාරයෙන් යැපෙති. යනු ඔහුගේ හැඟීම යි. එහෙයින් එය ද දනිමි, යන හැඟීම ඇත්තේ යැ.

හුදෙක් මෙම ලද්ධියෙන් මැ මේ භික්ෂුව පැන පිළිවිසියේ නො වෙයි. දෘෂ්ටිගතිකා වූයේ උමතු වූවකු සමාන යැ. පැසක් ගෙන වීථි මධ්‍යයට වන් උමතු වූවකු විසින් ගොම, ගල්, අසුචි, කිදීමෙන් ඉවත ලූ අහර කැබලි යනාදි මනාපවූ ද, අමනාපවූ ද නොයෙක් දෑ ගෙන පැස පුරාගන්නේ-යම්සේ ද? එමෙන් දෘෂ්ටිගතිකා තෙම සුදුසු දෑය ද, නුසුදුසු දෑය ද විචාරන්නේ යැ. හෙතෙම කුමක් හෙයින් මෙසේ විචාරන්නේ දෑ යි නිගැනිය යුත්තේ නො වෙයි විචාළ විචාළ තන්හි ඔහුගේ එම ගැඟීම මැ වැළැක්විය යුත්තේ යැ. එහෙයින් මැ භාග්‍ය වතුන් වහන්සේ කුමක් හෙයින් මෙසේ විචාරන්නේ දෑ යි නොවදාරා ඔහුගේ 'එසේ ග්‍රහණයමැ"වළක්වනු පිණිස "නො කල්ලො පඤ්හො" යනාදිය වදාළ සේක.

**ආහාරෙතී'ති අහං න වදාමි:-** පරමාර්ථ වශයෙන් සත්වයෙක, පුද්ගලයෙක කියා ගතයුත්තෙක් නැත්තේ යැ. එහෙයින් මැ කිසි සත්වයෙක් හෝ පුද්ගලයෙක් ගන්නේයැ යි මම නො දෙසන්නෙමි' යි බුදුහු වදාළහ.

**තත්‍ර සාලලං වෙය්‍යාකරණං:-** සවාමිනි කුමකට විඥානාහාරය ප්‍රත්‍යය වන්නේ ද? යනුවෙන් විචාළ කල්හි විඥානාහාරය ඒ විඥානය හා ආයති පුනර්භවයාගේ නිස්පත්තියට ප්‍රත්‍යය වන්නේයැ යි ප්‍රකාශ කිරීම වටනේ යැ, යනු යි. මෙහි විඥානාහාරය නම් ප්‍රතිසන්ධි චිත්තය යි. "ආයති පුනබ්භවාභි නිබ්බත්ති" යනුවෙන් ඒ විඥානය හා උපන් නාමරූපය ගන්නා ලැබේ. ඒ නාමරූපයාගේ ඉපදීම ඇතිකල්හි ෂඩායතන වන හෙයින් 'තස්මිං භූතෙ සති සළායතනං' යි වදාරන ලදී.

**සළායතන පච්චයා ඵස්සො:-** ෂඩායතන ප්‍රත්‍යයෙන් සපර්ශය වන්නේ ය. මෙහිදී ද භාග්‍යවතුන් වහන්සේ මත්තෙහි පැන විසඳීමට ඉඩ තබා දේශනාව නිමාවට පැමිණි වූ සේක. දෘෂ්ටිගතිකයා විසින් දක්වන දක්වන කරුණ මැ ගෙන නැවත නැවත වෙන වෙන ප්‍රශ්න ඇසිය හැකි ය. එහෙයින් මෙසේ අවකාශ දුන්සේක.

මෙතැන්හි දී ස්වාමීනි! 'කවරනම් සත්වයෙක් වන්නේදැ' යි මේ භික්ෂුව විසින් විචාළ යුත්තේ යැ. එහෙත් සත්වයෙක් පුද්ගලයෙක් ඇත යන ලබ්ධිය ඇත්තාහු විසින් එසේ පිළිවිසීම සමය (=ඇදහීම) යට විරුඬ වූවකි. එහෙයින් එසේ නොකියා විචාළ දූය මැ නැවත නැවත විචාරන්නට විය. එකලැ භාග්‍යවතුන් වහන්සේ මොහුගේ පැනයෙහි හරයක් නැතිබව සලකා දේශනාව සම්බන්ධ කොට නිමාවට පැමිණ වූ සේක.

**ඡන්නං ත්වෙව:-** යම් තැනෙක්හි සිට දේශනය පටන්ගත් සේක් ද එය මැ ගෙන දේශනය නිවනට අභිමුඛ කරන සේක් "ඡන්නං ත්වෙව' යනාදිය වදාළහ. මේ සූත්‍රයෙහි දී ප්‍රත්‍යය ධර්මයන්ගේ ත්‍රිසන්ධිය මෙසේ දතයුතු. විඥාන × නාමරූප දෙක අතර එක් සන්ධියකි. වේදනා × තණ්හා දෙක අතර එක් සන්ධියකි. භව × ජාති දෙක අතර එක් සන්ධියකි.

---

**දෙවැනි ඵග්ගුන සූත්‍ර වර්ණනාව මෙතෙකින් සමාප්ත යි.**

( 3 )

## පදවි:

1 යෙහි කෙචි, යම් කිසි; සමණා වා, (චතුස්සත්‍යාවබෝධයට අසමර්ථ වූ බාහිරක) ශ්‍රමණකෙණෙක් හෝ, බ්‍රාහ්මණා වා, (එබඳු වූ) බ්‍රාහ්මණ කෙණෙක් හෝ; ජරාමරණං, ජරාව හා මරණය; නප්පජානන්ති, දුඃඛසත්‍යය වශයෙන් නොදන්නාහු ද; ජරාමරණ සමුදයං, ජරාමරණ සමුදය; නප්පජානන්ති, සමුදය සත්‍යය වශයෙන් නොදන්නාහු ද, ජරාමරණ නිරෝධං, ජරාමරණයන්ගේ නිරෝධය; නප්පජානන්ති, නිරෝධ සත්‍යය වශයෙන් නොදන්නාහු ද; ජරාමරණ නිරෝධගාමිනිං පටිපදං, ජරාමරණයන්ගේ නිරෝධගාමිනීවූ ප්‍රතිපත්තිය; නප්පජානන්ති, මාර්ගසත්‍ය වශයෙන් නොදන්නාහු ද; ජාතිං, උත්පත්තිය; නප්පජානන්ති, දුඃඛසත්‍යය වශයෙන් නොදන්නාහු ද; තෙ සමණා වා, ඒ ශ්‍රමණයෝ හෝ; බ්‍රාහ්මණා වා, ඒ බ්‍රාහ්මණයෝ හෝ; මෙ, මාගේ; සමණෙසු ශ්‍රමණයන් අතුරෙහි; සමණසම්මතා වා, සමණසම්මත වූවාහු හෝ; බ්‍රාහ්මණෙසු, බමුණන් අතුරෙහි; බ්‍රාහ්මණසම්මතා වා, බ්‍රාහ්මණසම්මත වූවාහු හෝ; න, නොවෙත්.

තෙ ආයස්මන්තො, ඒ ආයුෂ්මත්හු; සාමඤ්ඤත්ථං වා, ශ්‍රාමණ්‍යාර්ථය යි කියනලද ආර්ය මාර්ගඵලය හෝ; බ්‍රහ්මඤ්ඤත්ථං වා, එනමින්වූ යථෝක්ත මාර්ගඵලය හෝ; දිට්ඨෙව ධම්මෙ, ඉහාත්ම

යෙහි ම; සයං, තෙමේ; අභිඤ්ඤා, විශිෂ්ට ඥානයෙන් දැන; සච්ඡිකත්වා, අවබෝධකොට; උපසම්පජ්ජ, එයට පැමිණ; න විහරන්ති, වාසය නොකරන්නාහු ය.

2 යෙ ච, යම්බඳුවූත්;- පජානන්ති, දුඃඛසත්‍යය වශයෙන් දන්නාහු ද;- (සෙස්ස පෙරමෙනි.)

( 3 )

## විස්තර—

**සමණා වා බ්‍රාහ්මණා වා:-** මෙහි සමණ බ්‍රාහ්මණ යනුවෙන් සම්බුද්ධශාසනයෙන් බැහැර අන්‍යදෘෂ්ටික වූ මහණ බමුණෝ ගනු ලැබෙති. ඔවුහු චතුස්සත්‍යාවබෝධයට අසමර්ථයහ.

**නප්පජානන්ති:-** මෙහි නොදැනීම මෙසේ යැ. "ජරාමරණං" යනතන්හි දුඃඛසත්‍යය වශයෙන් තෘෂ්ණාසහිත වූ ජාතිතොමෝ ජරාමරණයාගේ සමුදය නම් වන්නී යැ. එම සමුදය සත්‍යය වශයෙන් නොදැනීම "ජරාමරණසමුදයං නප්පජානන්ති" යනුවෙන් දක්වන ලදී. ජරාමරණයන්ගේ නිරෝධය යි කියනලද නිර්වාණය නොදැනීම "ජරාමරණනිරොධං නප්පජානන්ති" යනුවෙන් දක්වන ලදී. ජරාමරණය නිරුද්ධ කරන ප්‍රතිපත්තිය යි කියනලද මාර්ගසත්‍යයාගේ නොදැනීම "ජරාමරණ නිරොධ ගාමිනිං පටිපදං නප්පජානන්ති" යනුවෙන් දක්වන ලදී.

එසේම "ජාතිං" යනාදි තන්හි දුඃඛසත්‍යය වශයෙන් ද "ජාති සමුදයං" යනාදි තන්හි සමුදය සත්‍යාදි වශයෙන් ද නොදැනීම අනුක්‍රමයෙන් චතුස්සත්‍යවශයෙන් දතයුතු. මෙහි තෘෂ්ණා සහිත වූ භවය ජාතිසමුදය නම් වන්නේ යැ.

**සාමඤ්ඤත්ථං වා බ්‍රහ්මඤ්ඤත්ථං වා:-** මෙහි සාමඤ්ඤ බ්‍රහ්මඤ්ඤ යන පදයන්ගෙන් ආර්‍ය්‍යමාර්ගය ද දෙතන්හි මැ අත්ථ යනුවෙන් ආර්‍ය්‍යඵලය ද අපෙක්ෂිත බව දතයුතු. මෙසේ භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රයෙහි දී එකොළොස් තැනෙක්හි මැ චතුස්සත්‍යය දේශනා කළසේක.

(3= ශ්‍රමණබ්‍රාහ්මණ සූත්‍රවර්ණනාව යි.)

( 4 )

## පදාර්ථ—

1-2 ඉමෙ ධම්මෙ, මේ ධර්මයන්; නප්පජානන්ති, දුඃඛසත්‍ය වශයෙන් නොදනිත් ද; ඉමෙසං ධම්මානං, මේ ධර්මයන්ගේ; සමුදයං සමුදය-නිරොධං, නිරෝධය- කතමෙ ධම්මෙ, කවරනම් ධර්ම කෙනෙකු; කතමෙසං ධම්මානං, කවර ධර්මකෙණෙකුන්ගේ- (සෙස්ස පෙරමෙනි.)

(4= ශ්‍රමණ බ්‍රාහ්මණ සූත්‍රය යි.)

විස්තර–

ඉමෙ ධම්මෙ ඤාතමෙ ධම්මෙ:- මෙපමණක් මැ විස්තරකොට දෙශිත යි. මෙසේ දෙශනා කරනලද්දේ අවබොධයට සමර්ථ පුද්ගලයන්ගේ වශයෙනි. (සෙස්ස පෙරමෙනි.)

---

(4= ශ්‍රමණබ්‍රාහ්මණ සූත්‍රවර්ණනාව යි.)

---

( 5 )

පදාර්ථ:-

– ආයස්මා කච්චානගොත්තො, ආයුෂ්මත් කාත්‍යායන ගොත්‍ර ස්ථවිරතෙම-- භන්තෙ, ස්වාමීනි! සම්මාදිට්ඨි සම්මාදිට්ඨී ති, සම්මාදිට්ඨි සම්මාදිට්ඨිය යි; වුච්චති, කියනු ලැබේ.-- කිත්තාවතා නු ඛො, කොපමණකින්වනාහි; සම්මාදිට්ඨි, සම්‍යග්දෘෂ්ටි ඇත්තේ; හොති ඉති, වන්නේ ද යනුයි.

කච්චාන, කාත්‍යායනය; අයං ලොකො, මේ ලොකයතෙම; යෙභුය්‍යෙන, බොහෝසෙයින්; අත්ථිතඤ්ච, ශාශ්වතදෘෂ්ටිය ද; නත්ථිතඤ්ච, උච්ඡෙදදෘෂ්ටිය ද යන; ද්වයනිස්සිතො, දෙකොටසෙහි ඇලුනේ වෙයි. ලොකසමුදයඤ්ච ඛො, ලොකසමුදය ද වනාහි; යථාභූතං, තත්වූපරිදි; සම්මප්පඤ්ඤාය, විදර්ශනාසහගත මාර්ගප්‍රඥාවෙන්; පස්සතො, දක්නාහට; ලොකෙ, සංස්කාර ලොකයෙහි; යා නත්ථිතා යම් උච්ඡෙදයක්වන්නී ද; සා, ඕතොමෝ; න හොති, නොවන්නීය; ලොකනිරොධං ඛො, සංස්කාරයන්ගේ භඞ්ගය වනාහි;--යා අත්ථිතා, යම් ශාශ්වතදෘෂ්ටියක්වන්නී ද–

අයං ලොකො, මේ සංස්කාරලොකයතෙම; උපායුපාදානාභිනිවෙස විනිබන්ධො, උපායයන්ගෙන්ද; උපාදානයන්ගෙන්ද,- විනිවෙශයන්ගෙන්ද බැඳුනේවෙයි– අයං, මේ ආර්යශ්‍රාවකතෙම; චෙතසො, චිත්තයාගේ; අධිට්ඨානං, පිහිටීම ඇති, අභිනිවෙසානුසයං, නිවෙශවූ ද අනුශයවූ ද; තඤ්ච උපායුපාදානං, ඒ උපායුපාදානයද; මෙ, මාගේ; අත්තා ඉති, ආත්මයැයි; න උපෙති, නොපැමිණෙයි; න උපාදියති, නොගනියි; න අධිට්ඨාති, නොපිහිටයි;- උප්පජ්ජමානං, උපදිනුලබන්නේ; දුක්ඛමෙව, පඤ්චඋපාදානස්කන්ධ මාත්‍රයක්ම; උප්පජ්ජති, උපදියි. නිරුජ්ඣමානං, නිරුද්ධවනුලබන්නේ; දුක්ඛං, පඤ්චොපාදානස්කන්ධයම; නිරුජ්ඣතීති, නිරුද්ධවන්නේයැයි; න කඞ්ඛති, සැකනොකරන්නේය; න විචිකිච්ඡති, විචිකිච්ඡා

නොඋපදවන්නේය; අස්ස, ඔහට; එත්‍ථ, මෙහි; අපරප්පච්චයා, පර ප්‍රත්‍යයෙන් තොරව; ඤාණංඑව, ඥානයම; හොති, වෙයි. කච්චාන, කාත්‍යායනය; එත්තාවතා, මේ සඬයනසඥවප්‍රහිතවූ පමණෙකින්; සම්මාදිට්ඨිහොති, සම්‍යග්දෘෂ්ටිඇත්තේනම්වන්නේයැ.

2 සබ්බං, සියල්ල; අත්‍ථීතිඛො, ඇත්තේයැ යන; අයං, මේ;- එකොඅන්තො, එක්ලාමක අන්තයෙක; සබ්බං, සියල්ල; නත්‍ථීති, නැත්තේය යන; අයං, මේ; දුතියො අන්තො, දෙවැනි අන්තයයි; එතෙඋභොඅන්තෙ,මේ ලාමකඅන්තදෙකට;අනුපගම්ම, නොපැමිණ; මජ්ඣෙන, මධ්‍යමප්‍රතිපත්තියෙහි පිහිටීමෙන්; තථාගතො, තථාගත යන්වහන්සේ; ධම්මං, ධර්මය; දෙසෙති, දෙශනාකරනසේක. (සෙස්ස පෙරමෙනි.)

( 5 )

---

## විස්තර.-

**සම්මාදිට්ඨි** - "සම්මාදස්සනං සම්මාදිට්ඨි," යහපත් දැකීම ස්වභාව කොට ඇත්තේ සම්‍යක් දෘෂ්ටිය යි. ලෞකික ලොකොත්තර වශයෙන් එය දෙයාකාර වෙයි. ශීලවිශුද්ධි ආදි ෂඩ්විශුද්ධීන්ගේ ප්‍රවෘත්ති කාලයෙහි ලැබෙනුයේ ලෞකික සම්‍යක් දෘෂ්ටිය යි. ඥාන දර්ශනවිශුද්ධිකාලයෙහි ලැබෙනුයේ ලොකොත්තර සම්‍යක් දෘෂ්ටිය යි.

**යෙභුය්‍යෙන** - මෙයින් ආර්‍ය්‍යපුද්ගලයන් හැර ඉතිරි ලොකයා ගන්නා ලැබේ.

**ලොකසමුදයං**:- මෙහි ලොක නම් සංස්කාර ලොකය යි. සමුදය නම් ඉපදීම යි. සංස්කාර ලොකයාගේ ඉපදීම ලොකසමුදය නම් වන්නේ යැ.

**සම්මප්පඤ්ඤාය**:- මෙහි සම්‍යක්ප්‍රඥා නම් විදර්ශනා සහගත මාර්ගප්‍රඥාව යි.

**යා ලොකෙ නත්‍ථිතා**;- සංස්කාර ලොකයෙහි උපන් ධර්මයන් දෘශ්‍යමාන වන කල්හි මැ නැතැ යි යන යම්බඳු උච්ඡෙද දෘෂ්ටියක් වන්නේ ද, ලොකසමුදය විදර්ශනාසහගත මාර්ගප්‍රඥාවෙන් මනාව දක්නහුට ඒ දෘෂ්ටිය නූපදනේ ය යනුයි.

**යාලොකෙ අත්‍ථිතා**:- සංස්කාරලොකයෙහි ඇතිවන සියලු ධර්මයන්ගේ බිඳීම දෘශ්‍යමාන වන කල්හි මැ, එබඳු සදාකාලික ධර්මයක් ඇතැ යි යන ශාශ්වත දෘෂ්ටියක් වන්නේ ද, ලොකනිරොධය මනාව දක්නහුට එබඳු දෘෂ්ටියක් නූපදනේය යනුයි.

ලොකනිරොධං:- ප්‍රත්‍යය ධර්මයන්ගේ නිරොධයෙන් ප්‍රත්‍යොත්පන්න ධර්මයන්ගේ නිරොධය දක්නහුට ඇතිවන සාශ්වත දෘෂ්ටිය ලොකනිරොධය දැකීම් හේතුවෙන් නොවන්නේය, යනුයි.

උපායුපාදානාභිනිවෙස විනිබන්ධො:- උපායයන්ගෙන් ද, උපාදානයන්ගෙන් ද, බඳනාලදය යනාඑ සි. තණ්හුපාය, දිට්ඨුපාය වශයෙන් උපාය දෙදෙනෙකි. උපාදානාදීහු ද, තණ්හුපාදාන, දිට්ඨුපාදානාදි වශයෙන් ලැබෙති. තෘෂ්ණාදෘෂ්ටිහු වනාහි යම්හෙයකින් මමය, මාගේය යනාදී ආකාරයෙන් ත්‍රෛභූමක ධර්මයන් කරා පැමිණෙත් ද, එහෙයින් උපාය නම් වෙති. යම්හෙයකින් ඒ ත්‍රෛභූමක ධර්මයන් ගනිත් ද, එසේමැ ත්‍රෛභූමක ධර්මයන්හි පැතිරී සිටිත් ද, එහෙයින් උපාදාන, අභිනිවෙශ නමුදු වෙති. ඒ උපායුපාදානාදින්ගෙන් මේලොකය බැඳුනේ ද වෙයි.

අභිනිවෙසානුසයං - අකුශල චිත්තය තෘෂ්ණා දෘෂ්ටීන්හි පිහිටන්නේ වෙයි. තෘෂ්ණා දෘෂ්ටිහු ද එම අකුශල චිත්තයෙහි අනුප්‍රවිෂ්ටව සිටිති. එම සිතෙහි ම වෙසෙති. එහෙයින් තෘෂ්ණා, දෘෂ්ටි දෙදෙන සිත මැඩපවත්වමින් පවත්නාහුයැ යි කියන ලදී.

න කඞ්ඛති:- දුක මැ උපදනේ යැ, දුක මැ නිරුඩ වන්නේ යැ, මෙහි අන්‍යවූ සත්වයෙක් පුද්ගලයෙක් නැත, යන මෙහිලා සැක නොකරන්නේ වෙයි, යනාඑසි.

අයමෙකො අන්තො:- "සබ්බ මත්ථි"ති යනාදී වශයෙන් ප්‍රකාශිත ශාස්වත දෘෂ්ටිය එක් අන්තයෙක් වෙයි. "සබ්බං නත්ථි"ති යනාදීන් ප්‍රකාශිත උච්ඡෙද දෘෂ්ටිය එක් අන්තයකි. මේ දෙකම ලාමක යැ. තථාගතයන් වහන්සේ මේ අන්තදෙක හැර මධ්‍යම ප්‍රතිපත්තියෙහි පිහිටා දහම් දෙසනසේක.

---

(7= කාත්‍යායන ගොත්‍ර සූත්‍රවර්ණනය යි.)

---

පදවි:-

( 6 )

භන්තෙ, සවාමිනි! ධම්මකථිකො ධම්මකථිකො ඉති, ධර්මකථිකයෙක, ධර්මකථිකයෙකැයි; වුච්චති, කියනුලැබේ.- කිත්තාවතානුඛො, කොපමණකින්වනාහි; ධම්මකථිකොහොති ඉති, ධර්මකථිකයෙක් වන්නේ ද යනුයි. වෙ, ඉදින්; භික්ඛු, මහණතෙම; ජරාමරණස්ස, ජරාමරණයාගේ; නිබ්බිදය' කලකිරීම පිණිස; විරාගාය, නොඇලීම

පිණිස; නිරොධාය, නිරුද්ධකිරීම පිණිස; ධම්මං, ධර්මය; දෙසෙති, දේශනාකරයිද; (එපමණකින්) භික්ඛු, මහණෙතෙම; ධම්මකථිකො ඉති, ධර්මකථිකයෙකැයි; වචනාය, කීමට; අලං, සුදුසුයි.– (ජාතියාවෙ භික්ඛු යනාදියෙහි, අර්ථද මේනයින් සැලකිය යුතුයි.)

පටිපන්නොහොති, පිළිපන්නේවෙයි ද; ධම්මානුධම්මපටිපන්නො භික්ඛු ඉති, නිර්වාණධර්මයට අනුකූල ප්‍රතිපත්තියට පිළිපන් භික්ෂුවකැයි; වචනාය, කීමට; අලං, සුදුසුයි. චෙ, ඉදින්; භික්ඛු, මහණතෙම; අවිජ්ජාය, අවිද්‍යාවගේ; නිබ්බිදාවිරාගානිරොධා, කළකිරීමෙන් ද; නොඇලීමෙන් ද, නිරුද්ධකිරීමෙන් ද; අනුපාදාවිමුත්තො, සතරඋපාදානයන් කෙරෙන් කිසිධර්මයක් නොගෙන විශෙෂයෙන් මිදුණේ; හොති, වෙයි ද; දිට්ඨධම්මනිබ්බානප්පත්තො භික්ඛු ඉති, ඉහාත්මයෙහි නිර්වාණයට පැමිණි භික්ෂුවකැයි; වචනාය, කීමට; අලං. සුදුසුයි. (සෙසුතන්හි අර්ථ පෙරමෙන් දතයුතු )

( 6 )

විස්තර—

**පටිපන්නො හොති:**– පළමු කොට ශිලයෙහි පිහිටි පුද්ගලයා පටන් අර්හත් මාර්ගස්ථයා දක්වා මේ අතර ඇත්තාහු පටිපන්න නාමයට අතුලත් වන්නාහු යැ.

**ධම්මානුධම්ම පටිපන්නො:**– ලොකොත්තරවූ නිර්වාණය මෙහි ධම්ම නම් වේ. එයට අනුරූප වූ ප්‍රතිපත්තිය ධම්මානුධම්මපටිද නම්. එම ප්‍රතිපත්තියෙහි පිළිපන් පුද්ගලතෙමේ ධම්මානුධම්මපටිපන්න නමින් හැඳින් වේ.

**අනුපාදාවිමුත්තො:**– සතර උපාදානයන්ගෙන් මිදුණු තැනැත්තේ අනුපාදාවිමුත්ත නම්. "භුසං ආදියන්ති ති, උපාදානානි" යනු හෙයින් අරමුණ දැඩිව ගන්නෝ උපාදානයෝ යි. මෙහි උප ශබ්දය දෘඪාර්ථ යි. කාමුපාදාන, දිට්ඨුපාදාන, සීලබ්බතුපාදාන, අත්තවාදුපාදාන. යන මොවුහු සතර උපාදානයෝ යි. කෙලශකාමය හෙවත් කාමතෘෂ්ණාව කාමුපාදාන නම්. මිථ්‍යාග්‍රාහය දිට්ඨුපාදාන නම්. ගව එළු ආදීන්ගේ ඒ ඒ ප්‍රකෘති අනුව හැසිරීම මෙහි සීල නම් වේ. එය සමාදන්ව ගන්නාලද්දේ වත (ව්‍රත) නම් වේ. එම ශීලය හා ව්‍රතය සසරින් මිදීමට මාර්ගය යි දැඩිකොට ගන්නා ලද්දේ සීලබ්බතුපාදාන නම්. තීර්ථකයන් විසින් ආත්ම පුද්ගලාදි වශයෙන් කල්පනා කොට ගන්නාලද්ද කියනලද්දේ යමකින්නම් එය අත්තවාද නම්. එය ම දැඩිකොට ගන්නා ලද්දේ අත්තවාදුපාදාන නම් වේ. එනම්:– රූපය ආත්මය ඇත්තේය යනාදි වශයෙන් ප්‍රකාශිත විංශද්විධ සත්කාය දෘෂ්ටිය යි.

අලං වචනාය:- ජරාමරණාදිය පිළිබඳව කලකිරීම් ආදිය පිණිස දහම් දෙසන භික්ෂුව **ධම්මකථිකයෙකැ** යි කීමට ද, ජරාමරණාදිය පිළිබඳව කලකිරීම් ආදිය පිණිස පිළිපන්නාවූ භික්ෂුව **ධම්මානුධම්මයට ප්‍රතිපන්නෙකැයි** කියා ද, එසේම ජරාමරණාදිය පිළිබඳව කලකිරීම් ආදියෙන් උපාදාන රහිතව මිදුණු භික්ෂුව **දිට්ඨධම්ම නිබ්බාණප්පත්තය** යි කීමට ද, සුදුසුය යනු යි. මෙසේ මෙහි එක් ක්‍රමයකින් ධම්මකථික භික්ෂුව පිළිබඳව විචාරණලද නමුත් දෙයාකාරයකින් එය වෙසෙසා සෙඛ අසෙඛ (සයික්ෂඅසයික්ෂ) භූමිහු දෙශනාකරන ලද්දහ.

---

(6= ධම්මකථික සූත්‍රවර්ණනාය යි.)

---

පදාර්ථ:-

( 7 )

1 පුබ්බණ්හසමයං, පෙරවරුකාලයෙහි නිවාසෙත්වා, හැඳපෙරවා; පත්ත චීවරං, පාසිවුරු; ආදාය, ගෙන;--අචෙලකස්සපො, අචෙල කාශ්‍යපතෙම; දූරතොව. දුරදීම; ආගච්ඡන්තං, එන්නාවූ; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේ; අද්දසාඛො, දිටී;- සචෙ, ඉදින්; භවං ගොතමො, භවත්ගෞතමතෙම; නො, අපගේ; පඤ්හස්සවෙය්‍යාකරණාය, ප්‍රශ්නව්‍යාකරණය පිණිස; ඔකාසංකරොති, අවකාශකරන්නේනම්; මයං, අපි; භගවන්තං ගොතමං, භවත් ගෞතමයන්; (අතින්) කිඤ්චිදෙවදෙසං, කිසිකාරණයක්; පුච්ඡෙය්‍යාම ඉති, විචාරන්නෙමු, යනුයි. කස්සප, කාශ්‍යපය; තාව, තවම; පඤ්හස්ස, ප්‍රශ්නව්‍යාකරණයට; අකාලොඛො, සුදුසුකාලය නොවෙයි; අන්තරඝරං, ගමතුළට; පවිට්ඨම්හ ඉති, පිවිසියෙමු; යනුයි. දුතියම්පි ඛො, දෙවනුවද වනාහි;- තතියම්පි ඛො, තෙවනුවද වනාහි;-

2 එවං වුත්තෙ, මෙසේවදාළකල්හි; අචෙලකස්සපො, අචෙල කාශ්‍යපතෙම; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; මයං ඛො අපි වනාහි; භගවන්තං ගොතමං, භගවත් ගෞතමයන් (වෙතින්) බහුදෙව, බොහෝදෙයක්; න පනපුච්ඡිතුකාමා ඉති, නොවිචාරනු කැමැත්තම්හ යන; එතං, මෙය; අවොච, කියේය. කස්සප, කාශ්‍යපය; යං, යමක්; ආකඞ්ඛසි, (විචාරනු) කැමැත්තෙහිනම්; පුච්ඡ, විචාරව. භොගොතම, භවත්ගෞතමයන් වහන්ස; සයං කතං දුක්ඛං, තමා විසින් කරනලද දුක; කින්නුඛො ඉති, කුමක්ද? යනුයි.—

කස්සප, කාශ්‍යපය; මාහෙවං ඉති, එසේ නොවිචාරව යි;- පරංකතං, අනුන් විසින් කරනලද;— සයංකතංච, තමා විසින් කරන ලද්දවූ ද; පරංකතංච, අනුන් විසින් කරණලද්දවූ ද;-- අසයං කාරං, තමා විසින් නොකරනලද; අපරංකාරං, මෙරමා විසින් නොකරනලද; අධිච්ච සමුප්පන්නං, අකාරණයෙන් උපන්;—

3 තෙනහි, එසේවීනම්,-- නජානාති, නොදන්නේද, නපස්සති, නොදක්නේ ද— අහං, මම; න ජානාමි, නොදන් නෙම් නොවෙමි. න පස්සාමි, නොදක්නෙම් නොවෙමි; – ඉති පුට්ඨො සමානො, මෙසේ විචාරණ ලදුයේ-- ආචික්ඛතු, ප්‍රකාශ කෙරේවා;-- දෙසෙතු, දෙශනාකෙරේවා;--

4 කස්සප, කාශ්‍යපය; සො, හෙතෙම; කරොති, කරයි; සො, හෙතෙම; පටිසංවෙදියතීති බො, විඳිනුලබන්නේය යයි; ආදිතො, ආදියෙහි ම; සතො, මෙසේ කිමක් ඇතිකල්හි; දුක්ඛං, සංසාර දුඃඛය; සයංකතං ඉති, තමා විසින් කරනලද්දේය යන (ලබ්ධිය පසුව වෙයි;) ඉති, මෙසේ; වදං, කියන්නේ; ආදිතො, ආදියෙහිම; සස්සතං, සාශ්වතදෘෂ්ටිය; (දීපෙති, දක්වයි;) එතං, මේ දර්ශනය; සස්සතං, සාශ්වත දෘෂ්ටියට; පරෙති, පැමිණෙයි; අඤ්ඤො, අන්‍යයෙක්; කරොති, කරයි. අඤ්ඤො, අන්‍යයෙක්; පටිසංවෙදියතීතිබො, විඳිනු ලබන්නේය යි; (ආදිතො, ආදියෙහිම; සතො, මෙසේ (කිමක්) ඇතිකල්හි; වෙදනාභි තුන්නස්ස, වෙදනාවෙන් විඳුනාලද්දහුට; දුක්ඛං, දුඃඛය; පරකතනති, අනුන් විසින් කරනලද්දේය යන ලබ්ධිය වෙයි; ඉති, මෙසේ; වදං, කියන්නේ; (ආදිතො, ආදියෙහිම) උච්ඡේදං, උච්ඡේදය ගනී; කුමක්හෙයින්දයත්; එතං, ඔහුගේ මේ දර්ශනය; උච්ඡේදං, උච්ඡේදයට; පරෙති, පැමිණෙයි; එතෙ තෙ උභො අන්තා, සාශ්වත උච්ඡේද සඞ්ඛ්‍යාත ඒමේ අන්ත දෙක; අනුපගම්ම, හැර; තථාගතො, තථාගතතෙම; මජ්ඣෙන, මධ්‍යම ප්‍රතිපදාවෙහි සිටියේ; ධම්මං, ධර්මය; දෙසෙති, දෙශනාකරයි. (කවර ධර්මයක්ද? යත්-) අවිජ්ජාපච්චයා, අවිද්‍යා ප්‍රත්‍යයෙන්-

5-6-7-8 ආරද්ධචිත්තා, ගම්පිවිසීම් ආදී අවවැදෑරුම් වත්පිරී මෙන් ආරාධනයකරනලද සිත්ඇත්තාවූ; අපිච, තවද; මයා, මා විසින්; පුග්ගලවෙමත්තතා, පුද්ගලනානත්වය; විදිතා, දන්නාලදී;- (සෙසු සියලුතන්හි අර්ථ පළමු කියනලදපරිදි දතයුතු.)

( 7 )

## විස්තර—

අචෙලකස්සපො:- මේ තෙම නාමයෙන් කාශ්‍යපය යි ප්‍රසිද්ධ වූ නිගණ්ඨ ශ්‍රමණ කොටසට අයත් වූවෙක.

**අන්තරඝරං:-** අන්තරඝර ශබ්දයෙන් ඇතැම් තැනෙක ග්‍රාමාභ්‍යන්තරය ද, ඇතැම් තැනෙක ගෘහාභ්‍යන්තරය ද, වාච්‍ය වන්නේ යැ. මෙතැන්හි දී ග්‍රාමාභ්‍යන්තරය යන අර්ථය ලැබෙන්නේ යැ

**යදාකඞ්ඛසි:-** යමක් අසනු කැමැත්තෙහි නම් එය විචාරව යනු යි. භාග්‍යවතුන් වහන්සේ මොහුගේ ප්‍රශ්නය විසදීමට කැමැත්තෙන් වුසු සේක. එහෙත් ගෞරවය හා මනාව ඇසීමෙහි අභිලාශය ද, මොහුතුල වර්ධනය කරනු පිණිස තෙවෙනි වර දක්වා ප්‍රතික්ෂේප කළහ. අන්‍යදෘෂ්ටිකයෝ යමක් වහා කියනු ලබන කල්හි එයට ගරු නොකරති බුදුන්කරා එළඹීමට ද, යමක් ප්‍රශ්නකිරීමට ද සුකරය යන අදහසිති. දෙතුන් වරක් ප්‍රතික්ෂේප කළ කලැ එම අදහස ද දුරලති ප්‍රශ්න කිරීමට අවකාශ ගැනිම දුෂ්කර හෙයින් මනාව ද අසති එසේම අදහති.

තවද යම්කිසි තෙලක් හෝ පැණියක් හෝ පිසින්නා වූ වෛද්‍ය තෙම මුදුපාක බරපාක ආදි ඒ ඒ පිසියයුතු අවස්ථාවන් නොසික්මවා එය උදුනෙන් බහා ගන්නේයැ. එසේම භාග්‍යවතුන් වහන්සේ සත්ත්වයන්ගේ නුවණ මුහුකිරීමට පැමිණෙන අවස්ථාවන් බලාමැ දහම් දෙසති. එසේ හෙයින් ද තෙවෙනිවර දක්වා මොහුගේ ප්‍රශ්නය ප්‍රතික්ෂේප කළසේක.

**මාහෙවංකස්සප -** කාශ්‍යපය! "සයංකතංදුක්ඛං" යි නොකියව. එසේ කිම නොවටනේ යැ. වෘත්තදුඃඛය කරන්නාවූ කිසියම් ආත්මයක් හෝ පුද්ගලයෙක් නැතැ යි මෙයින් දක්විණ. පරං කතං යනාදිය ද, මෙසේම දතයුතු යි.

**ඉතිපුට්ඨසමානො:-** මෙසේ විචාරන ලද්දා වූ ඔහුට මෙවෙනි සිතෙක් වියැ. මේ ශ්‍රමණ භවත් ගෞතමතෙම තමාවිසින් කරනලද දුක කුමක්ද? යනාදින් විචාරණලද කල්හි එසේ නොකියව යි කිය යි. දුක් නැද්ද යි විචරණ ලද කලැ ඇතැ යි කිය යි. එසේ නම් භවත් ගෞතම තෙම දුක් නොදන්නේද යි විචාළ කලැ දනිමි යි ප්‍රතිඥා කර යි, මෙසේ හෙයින් කිම? මාවිසින් වරද ලෙස ප්‍රශ්නකරන ලද්දේද යි මුලැ සිට සවකිය ප්‍රවෘත්තිව මැ ශොධනය කරනුයේ මෙසේ කිය.

**සතො:-** (සප්තම්‍යාර්ථයෙහි ස්වාමි වචන යි.) එහෙයින් අර්ථය මෙසේ දතයුතු. කාශ්‍යපය! හේ කරන්නේ යැ. හේ විඳිනුලබන්නේ යැ යි ආදියෙහි මැ මෙබදු ලබ්ධියක් ඇතිකලැ පසුව දුක තමා විසින් මැ කරනලද්දේය යන ලබ්ධිය වෙයි, යනුයි.

**ඉතිවදං - ආදිතො, සස්සතං** යන පද දෙක මෙය හා සම්බන්ධ වෙති. අදහස මෙසේ දතයුතු. මෙසේ කියන්නේ මුලදී මැ ශාශ්වත දෘෂ්ටිය ප්‍රකාශ කර යි. එයම ගනී යි. කුමක් හෙයින් ද? යත්- කරන්නා ද විඳින්නා ද එකෙක්මය යි ගන්නා වූ ඔහුගේ ඒ දශීනය ශාශ්වත දෘෂ්ටියට පැමිණෙන හෙයින් යැ.

**අඤ්ඤො කරොති:-** යනාදිය ‘පරංකතං දුක්ඛං” යන ලබ්ධිය දුරලනු පිණිස කියන ලදි ආදිතො, සතො යන පද මෙතැනට ද සම්බන්ධ වෙති. කාශ්‍යපය! අන්‍යයෙක් කරයි; අන්‍යයෙක් විඳිනු ලැබේය යි ආදියෙහි මැ මෙබඳු ලබ්ධියක් ඇතිකල්හි පසුව කරන්නෙක් මෙහිදී මැ නැති වෙයි. ඔහු විසින් කරනලද්ද අන්‍යයෙක් විඳිනු ලැබේය යන මෙසේ උපන්නාවූ උච්ඡේද දෘෂ්ටිය සමග සම්ප්‍රයුක්ත වූ වෙදනාවෙන් විඳිනා ලද්දහුට දුක මෙරමා විසින් කරන ලද්දේය, යන ලබ්ධිය වෙයි. මෙසේ ද කියන්නේ පළමුකොට මැ උච්ඡේද දෘෂ්ටිය දක්ව යි. එයම ගනී යි කුමක් හෙයින් ද? යත්- ඔහුගේ ඒ දශීනය උච්ඡේදයට පැමිණී හෙයිනි.

**මජ්ඣෙන:-** ශාශ්වත උච්ඡේද සඞ්ඛ්‍යාත අන්ත දෙක හැර තථාගතයන් වහන්සේ මැදුම් පිළිවෙතහි පිහිටි සේක් දහම් දෙසන සේක. කවර ධර්මයක් ද යත් **අවිජ්ජා පච්චයා සඞ්ඛාරා** යනාදිය යි මෙහි හේතුවෙන් ඵලය ඇතිවන බව ද, හේතු නිරොධයෙන් ඵල නිරොධය ද දක්වන ලදී. එය කරන්නෙක් හෝ විඳින්නෙක් හෝ නොදක්වන ලදී. මෙතෙකින් සෙසු ප්‍රශ්න වලක්වන ලදී. “උභොඅන්තෙඅනුපගම්ම” යන මෙයින් තෙවෙනි ප්‍රශ්නය ප්‍රතික්ෂිප්ත යැ. “අවිජ්ජාපච්චයාසඞ්ඛාරා,” යන මෙයින් අකාරණයෙන් උපනැ යි යන මතය හා, භාග්‍යවතුන් වහන්සේ දුක නොදන්නේ යැ යන මතය ද බැහැර කරන ලදි

අනතුරුව කාශ්‍යපතෙම භාග්‍යවතුන් සමීපයෙහි භික්ෂුභාවය ප්‍රාර්ථනයකරන්නේ “ලභෙය්‍යාහංභන්තෙ” යනාදිය කියේයැ. “**අහං ඉත්ථංනාමො අඤ්ඤතිත්ථියපුබ්බො ඉමස්මිංධම්මවිනයෙ ආකඞ්ඛාමි උපසම්පදං ස්වාහං භන්තෙ! සඞ්ඝං චත්තාරො මාසෙ පරිවාසං යාචාමි.**” යනාදී ක්‍රමයෙන් පූර්වයෙහි අන්‍ය තීර්ථකව සිට සාමණේර භූමියට පැමිණ පිළිවෙත් සමාදන්ව එය රැකිය යුතු යැ. භාග්‍යවතුන් වහන්සේ ඒ බව “යොඛොකස්සප” යනාදි වශයෙන් මොහුට ද දෙසූ සේක.

පැවිදිබව ලබනු පිණිස ද, එසේ පිරිවෙස් රැකියයුතු බව සූත්‍රයෙහි “ආකඞ්ඛති පබ්බජ්ජං” යනාදී වශයෙන් දෙශිත යි. එසේ වුවද පිරිවෙස් නොරැක ද, පැවිද්ද ලබා උපසම්පත්තිය කැමැත්තහු

ගම් පිවිසීම් ආදී අට වැදූරුම් වත් පුරමින් පිරිවෙස් විසිය යුතු සි. මෙසේ කිරීමෙන් භික්ෂූන් ආරාධනය කළ කල්හි උපසම්පත්තිය ලැබිය හැකි වෙයි.

පුග්ගල වෙමත්තතා විදිතා - මේ පුද්ගලතෙම පිරිවෙස් විසීමට සුදුසු යැ. මේ පුද්ගලතෙම පිරිවෙස් විසීමට නුසුදුසු යැ යි පුද්ගල නානාත්වය මාවිසින් දන්නා ලද සි වදාරණ ලදී. එකලැ කාශ්‍යපතෙම මෙසේ සිතී. අහෝ! බුද්ධශාසනය අතිශයින් ආශ්චය්‍ය යැ. මෙසේ නොයෙක් අයුරින් පරීක්ෂා කොට සුදුසු වූවකුම ශාසනයට ඇතුළත් කරති, නුසුදුස්සන් හැරලති, යි ප්‍රව්‍රජ්‍යාව පිණිස වඩාත් උත්සාහවත් වූයේ "සචෙභන්තෙ" යනාදිය කියේ යැ.

එකලැ භාග්‍යවතුන් වහන්සේ මහණකම පිළිබඳව මොහුගේ බලවත් උත්සාහය දැන, කාශ්‍යපතෙම පිරිවෙස් විසීමට සුදුස්සෙක් නොවේය, යි සිතා එක් භික්ෂුවකට ආමන්ත්‍රණය කොට "කාශ්‍යප යන් ස්නානයකරවා පැවිදිකොට ගෙනෙව" යි වදාළ සේක. ඒ භික්ෂුව එසේ කොට ඔහු සමග බුදුන් සම්මුඛයට පැමිණියේ යැ. එතැනදීම භික්ෂූන් රැස්කරවා ඔහුට උපසම්පත්තිය දෙවාවදාළසේක. (සෙසු විස්තර බ්‍රහ්මසංයුත්තකයෙහි කියනලද පරිදි දතයුතු.)

---

(7= අචෙලකාශ්‍යප සූත්‍රය යි.)

---

පදවි—

1 තිම්බරුකො පරිබ්බාජකො, තිම්බරුක නම් වූ පිරිවැජිතෙම-

2 සා, ඹතොමෝ; වෙදනා, වෙදනා නම් වන්නී යැ. සො, හෙතෙම; වෙදියති ති බො, විඳිනු ලබන්නේ යැ යන; ආදිතො, ආදියෙහි මැ; සතො, මෙ දු ලබ්ධියක් ඇතිකල්හි; සුඛදුක්ඛං, සුවදුක්; සයං කතං ඉති, තමන් විසින් කරන ලද්දේයැ යන දෘෂ්ටිය වෙයි. අහං, මම; එවං, මෙසේ; නවදැමි, නොකියමි. වෙදනා, වෙදනා තොමෝ; අඤ්ඤ, අනිකක-- (සෙස්ස පළමු සූත්‍රයෙහි කියනලද පරිදි දතයුතු යි.)

( 8 )

---

විස්තර—

සාදෙව්නා:- යනාදිය සුව දුක් තමා විසින් කරන ලද්දේ යැ, යන ලබ්ධිය දුරලනු පිණිස කියන ලදී. තිම්බරුකය! ඹතොමෝ වෙදනා නම් වන්නී යැ; හෙතෙමේ විඳින්නේ යැ; යන මෙබඳු අදහසක් මුලදී මැ ඇතිකලැ දුක තමාවිසින් කරනලද්දේ යැ; යන

ලබ්ධිය වෙයි එකල්හි වේදනාව විසින් මැ වේදනාතොමෝ කරන ලද්දී යැ; යන 1 දහස වෙයි එසේ කිවහොත් ඒ වේදනාවගේ පූර්වයෙහි ද අස්තිත්වය අනුදැනීමෙන් ශාස්වත දෘෂ්ටිය ගන්නේ යැ. ඔහුගේ ඒ දශීනය සාශ්වත දෘෂ්ටිය අනුව මැ යන හෙයිනි.

**එවංපාහං න වදාමි:–** මම "ඕ වේදනා යැ; හේ විඳින්නේ යැ; යනුවෙන් ද නොකියමි. සුවදුක් තමාවිසින් කරනලද්දේ ය යි ද නොකියමි. යනාදී යි.

**අඤ්ඤා වේදනා:–** යනාදිය සුවදුක් අනුන් විසින් කරන ලද්දේ යැ; යන ලබ්ධිය නවත්වනු පිණිස දෙශිත යි. තිම්බරුකය! වේදනාතොමෝ අතිකකැ. අන්‍යයෙක් විඳින්නේයැ යි ආදියෙහි මැ මෙබඳු අදහසක් ඇතිකල්හි පසුව පූර්වපක්ෂයෙහි කාරකවූ යම් වේදනාවක් විනම් ඒ වේදනාතොමෝ උච්ඡින්න යැ. ඒ වේදනාව විසින් කරන ලද සුවදුක් අන්‍යයෙක් විඳින්නේ යැ යි මෙසේ උපන් උච්ඡෙද දෘෂ්ටිය හා සම්ප්‍රයුක්ත වූ වේදනාව විසින් මඩිනලද කල්හි සුවදුක් අනුන්විසින් කරනලද්දේයැ; යන ලබ්ධිය වෙයි. මෙසේ කියන්නේ, කරන්නහු මතු නොවන්නේ යැ අන්‍යයකු විසින් ප්‍රතිසන්ධිය ගන්නා ලද්දී යි, මෙසේ උච්ඡෙදය දක්ව යි. උච්ඡෙදය මැ ගනී. ඔහුගේ ඒ දශීනය උච්ඡෙදය අනුව මැ යන හෙයිනි

(8= තිම්බරුක සූත්‍රය යි)

---

පදාර්ථ—

1 භික්ඛවෙ, මහණෙනි! එවං, මෙසේ; අවිජ්ජානිවරණස්ස, අවිද්‍යාවෙන් නිවාරිතවූ; තණ්හායසම්පයුත්තස්ස, තෘෂ්ණාවෙන් සම්ප්‍රයුක්තවූ; බාලස්ස, බාලයාගේ; අයංකායො, මේ ශරීරය; සමුදාගතො, උපන්නේ ය. ඉති, මෙසේ; අයං ච කායො, (තමන්ගේ) මේ සවිඤ්ඤාණක ශරීරය ද; බහිද්ධා ච නාමරූපං, (අනුන්ගේ) සවිඤ්ඤාණක ශරීරය ද යන ඉත්ථං, මෙසේ; එතංවයං, මේ වය වන්නේ යැ. වයං පටිච්ච, චක්ඛුරූපාදී මේ දෙකනිසා; සළෙවඵස්සායතනානි, සවදෑරුම් ස්පර්ශායතනයෝ මැ වෙති.– යෙහි, යමකින්; ඵුට්ඨො, ස්පර්ශකරනලද; බාලො, බාලතෙම; එතෙසං, මේ ස්පර්ශායතනයන් අතුරෙන්; අඤ්ඤතරෙන වා, එකකින් හෝ; සුඛදුක්ඛං, සුවදුක්; පටිසංවෙදියති, විඳිනුලබන්නේ යැ.– පණ්ඩිතස්ස, පණ්ඩිතයාගේ– තත්‍ර, ඒ බාලය, පණ්ඩිතය යන මොවුන්පිළිබඳ ශරීර පහළවීමෙහි; කොවිසෙසො, වෙනස කවරේ ද? කොඅධිප්පායො, අධික ප්‍රයෝගය කවරේ ද? බාලෙන, බාලයා හා; පණ්ඩිතස්ස, පණ්ඩිතයාගේ; නානාකරණං, වෙනස; කිං, කුමක් ද?

2 භන්තෙ, ස්වාමීනි! නො, අපගේ; ධම්මා, මේ ධර්මයෝ; භගවං මූලකා, භාග්‍යවතුන් මුල්කොට ඇත්තාහු යැ. භගවංනෙත්තිකා, භාග්‍යවතුන් වහන්සේ කෙළවරකොට ඇත්තාහු යැ. භගවං පටිසරණා, භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහු යැ. භන්තෙ, ස්වාමීනි! එතස්සභාසිතස්ස, මේභාසිතයාගේ; අත්ථො, අර්ථයතෙම; භගවන්තං එව, භාග්‍යවතුන් වහන්සේට මැ; පටිභාති, වැටහෙතෙස්ක් නම්; වත, ඒකාන්තයෙන්; සාධු, යහපති.

භගවතො, භාග්‍යවතුන් වහන්සේ ගෙන්; සුත්වා, අසා; භික්ඛූ, භික්ෂූහු; ධාරෙස්සන්ති ති, ධාරණයකරන්නාහ; යනුයි- යාය ච අවිජ්ජාය, යම් අවිද්‍යාවකිනුත්; නිවුතස්ස, නිවාරිත වූ; යාය ච තණ්හාය, යම් තෘෂ්ණාවකිනුත්; සම්පයුත්තස්ස, සම්ප්‍රයුක්ත වූ; බාලස්ස, බාලයාගේ, අයං කායො, මේ ශරීරය; සමුදාගතො, උපන්නේ ද? බාලස්ස, බාලයාගේ; සාචෙව අවිජ්ජා, ඒ අවිජ්ජාව ද; අප්පහීනා, අප්‍රහීනය. සාච තණ්හා, ඒ තෘෂ්ණාව ද; අපරික්ඛීණා, අපරික්ෂීණය; තංකිස්ස හෙතු, ඊට හේතු කවරේද? යත්- හි, යම්හෙයකින්; බාලො, බාලතෙම; සම්මාදුක්ඛක්ඛයාය, මනාකොට වෘත්තදුඃඛය ක්ෂයකරනු පිණිස; බ්‍රහ්මචරියං, මාර්ගී බ්‍රහ්මචර්‍ය්‍යයෙහි; න අචරි, නොමහැසුරුණේ ද? තස්මා, එහෙයින්; බාලො, බාලතෙම; කායස්ස භෙදා, ශරීරයාගේ භෙදයෙන්; කායූපගො හොති, ප්‍රතිසන්ධි වශයෙන් අන්‍යශරීරයකට යන්නේවෙයි. කායූපගො සමානො, අන්‍ය ප්‍රතිසන්ධියකට ගියාවූ ම; සො, හෙතෙම; ජාතියා, උත්පත්තියෙන් ද; ජරාමරණෙන, ජරාමරණයෙන් ද, සොකෙහි, සොකයන්ගෙන් ද; පරිදෙවෙහි, වැලපීම්වලින් ද; දුක්ඛෙහි, කායිකදුක්වලින් ද; දොමනස්සෙහි, චෛතසික දුක්වලින් ද; උපායාසෙහි, දැඩිආයාසයන්ගෙන් ද; නපරිමුච්චති, නොමිදෙන්නේය; දුක්ඛස්මා, දුකින්; නපරිමුච්චති ඉති, නොමිදෙන්නේය යි; වදාමි, කියමි- පහීණා, ප්‍රහීණය- න කායූපගොහොති, අන්‍යශරීරයකට නොපැමිණෙන්නේ වෙයි;- යදිදං, එනම්; බ්‍රහ්මචරියවාසො මාර්ගීබ්‍රහ්මචර්‍ය්‍යාවාසය යි. (සෙස්ස පෙරමෙනි.)

( 9 )

## විස්තර—

**එවමයං කායො සමුදාගතො;** මෙසේ අවිද්‍යාවෙන් වසනලද හෙයින් ද, තෘෂ්ණාවෙන් සම්ප්‍රයුක්ත හෙයින් ද මේ ශරීරය උපන්නේ ය; යනුයි.

**අයඤ්ච කායො, බහිද්ධා ච නාමරූපං:-** තමන්ගේ ද අනුන්ගේ ද රූපාදි පඤ්චස්කන්ධයෙන් හා චක්ඛාදී ෂඩායතනයෙන් යුක්ත වූ ශරීරය, යනාදී යි.

**ඡ සං පටිච්ච ඵස්සො:-** චක්ඛාදි අධ්‍යාත්මික ආයතනයෝ රූපාදි බාහිරායතන හා පිළිවෙළින් ගැටෙන්නාහු වෙති. චක්ඛු රූපාදි වශ නිසා ස්පර්ශය වන්නේ යැ යි කියනලද්දේ එහෙයිනි.

**භගවම්මූලකා:-** "භගවා මූලං එතෙසන්ති භගවම්මූලකා." භාග්‍යවතුන්වහන්සේ මුල්කොට ඇති ධර්මයෝ යි. මෙහි අදහස නම්- ස්වාමිනි! මේ අපගේ ධර්මයෝ පූර්වයෙහි කාශ්‍යප සම්බුද්ධයන් වහන්සේ විසින් උපදවන ලද්දාහ. උන්වහන්සේගේ පිරිනිවීමෙන් පසු මේ ධර්ම ඉපදවීමට සමර්ථ වූ අන්‍ය ශ්‍රමණ බ්‍රාහ්මණාදි කිසිවෙක් නොවූහ. එහෙයින් භාග්‍යවතුන්වහන්සේ විසින් මැ මේ ධර්මයෝ උපදවන ලදහ. භාග්‍යවතුන් වහන්සේ ඇසුරුකොට මැ අපි මේ ධර්ම ඉගෙන ගන්නෙමු; අවබොධ කරන්නෙමු; යනු යි.

**භගවං පටිසරණා:-** චාතුර් භූමක වූ සියලු ධර්ම සර්වඥතාඥාන යට ඇතුළත් වෙති. එහෙයින් ඒ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ අනුගමනය කරන්නාහ යි කියන ලදී. ඒ එසේමැයි. භාග්‍යවතුන් වහන්සේ මහබෝමැඩ දී සියලු ධර්ම පිළිවෙළින්, යථාස්වභාවයෙන් අවබොධ කළසේක. ස්පර්ශකිරීම් අර්ථයෙන් ඵස්ස නම්. වේදනා, සඤ්ඤා, සඞ්ඛාර විඤ්ඤාණාදි එක එක ධර්මයක් ද, මෙසේ තමන් වහන්සේගේ ඥානයට අසුවූවාහු මේ මේ ස්වභාවයෙන් මොවුහු මෙනම් ඇත්තාහ; යි වෙන්කොට දැනගත් සේක.

**සාවෙව අවිජ්ජා:-** අවිද්‍යා තෘෂ්ණා දෙදෙන සත්වයන් ලවා කම් රැස්කරවා ප්‍රතිසන්ධිය ගෙනහැර දෙන්නාහු යැ.

**යදිදං බ්‍රහ්මචරියවාසො:-** යම් ඒ මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාවාසයක් වේසිද, එය බාලයාකෙරෙන් පණ්ඩිතයාගේ වෙනස යැ; යනුයි. මේ සූත්‍රයෙහිදි ප්‍රතිසන්ධිය ගන්නාවූ පෘථග්ජනතෙම බාලය යි ද, ප්‍රති සන්ධිය නොගන්නා වූ ක්ෂීණාශ්‍රවතෙම පණ්ඩිතය යි ද කියන ලදී. ශ්‍රොතාපන්න, සකෘදාගාමි, අනාගාමීහු, බාලය කියා හෝ පණ්ඩිතය කියා හෝ නොකියන ලද්දාහ. එහෙත් පණ්ඩිතයැ යි කියන ලද කොටසට අයත් වෙති

---

(9= බාලපණ්ඩිත සූත්‍රය යි.)

---

## පදාර්ථ—

1 තථාගතානං, බුදුවරයන්ගේ; උප්පාදෙවා, ඉපදීම ඇති කල්හි ද- අනුප්පාදෙවා, ඉපදීම නැතිකල්හි ද, ජාතිපච්චයා, ජාති ප්‍රත්‍යයෙන්, ජරාමරණං, ජරාමරණය වන්නේය. ධම්මට්ඨිතතා, ධර්‍මයන්ගේ ස්ථිතිභාවය යි කියනලද, ධම්මනියාමතා, ධර්මන්‍යාමතාවය යි

කියනලද; ඉදප්පච්චයතා, මේජරාමරණාදීන්ගේ ප්‍රත්‍යයවූ; සා ධාතු, ඒ ප්‍රත්‍යය ස්වභාවය; ඨිතාඑව, සිටියේ ම වෙයි. තථාගතො, තථාගත තෙම; තං, ඒ ප්‍රත්‍යය; අභිසම්බුජ්ඣති, අවබොධකරයි. අභිසමෙති, දැනගැනීම් වශයෙන් එයට පැමිණෙයි. අභිසම්බුජ්ඣිත්වා, අවබොධ කොට; අභිසමෙත්වා, දැනගැනීම් වශයෙන් එයට පැමිණ; ආචික්ඛති, කියයි; දෙසෙති, දෙශනාකරයි. පඤ්ඤපෙති, දන්වයි. පට්ඨපෙති, ඥානයට අභිමුඛකොට තබයි. විවරති, විවරකොට දක්වයි. විභජති, බෙදාදක්වයි. උත්තානීකරොති, ප්‍රකටකරයි; පස්සථ ඉති, බලව් ය යි ද, ආහ, කිය යි.

2 භික්ඛවෙ, මහණෙනි! ඉති ඛො, මෙසේ වනාහි; තත්‍ර, ඒ "ජාතිපච්චයා ජරාමරණං" යනාදියෙහි; යා තථතා, යම් සත්‍ය ස්වභාවයක් වන්නේ ද; අවිතථතා, අන්‍යධර්මවූ ප්‍රත්‍යයකින් අන්‍යවූ ස්වභාවයක් නොපවත්නා හෙයින් යම් අවිතථතා ස්වභාව ඇත්තාවූ; අඤ්ඤතථා, ජරාමරණාදීන්ගේ ප්‍රත්‍යය වශයෙන් හෝ; ප්‍රත්‍ය සමූහවශයෙන් හෝ; අඤ්ඤථාභාවයක් නොවන්නාවූ; යා ඉදප්පච්චය තා, යම් ඉදප්‍රත්‍යතාවක් වන්නේ ද; භික්ඛවෙ, මහණෙනි! අයං, මේ; පටිච්චසමුප්පාදො පටිච්චසමුප්පාදයැ යි; වුච්චති කියනු ලැබේ.

3 අනිච්චං, ඇතිවැ නැතිවන හෙයින් අනිත්‍යය; සංඛතං, ප්‍රත්‍යයන් විසින් එක්රැස්වීමෙන් කරනලද්දේය. පටිච්චසමුප්පන්නං, ප්‍රත්‍යයන් නිසා උපන්නේය. ඛයධම්මං, ක්ෂයය ස්වභාවකොට ඇත්තේය; වයධම්මං, ව්‍යය ස්වභාවකොට ඇත්තේය; විරාගධම්මං, නොඇලීම ස්වභාවකොට ඇත්තේය; නිරොධධම්මං, නිරුඬවීම ස්වභාවකොට ඇත්තේ ය.-

4 (අර්ථ සුබොධයි.)

5 භික්ඛවෙ, මහණෙනි! යතො ඛො, යම්හෙයකින් වනාහි; අරියසාවකස්ස, ආර්‍ය්‍යශ්‍රාවකයා විසින්; අයං පටිච්චසමුප්පාදො ච, මේ ප්‍රතීත්‍ය සමුප්පාදය ද; ඉමෙ පටිච්චසමුප්පන්නා ධම්මා ච, මේ ප්‍රතීත්‍යසමුප්පන්න ධර්මයෝ ද; යථාභූතං, තත්වූපරිදි; සම්මප්පඤ්ඤා ය, මනානුවණින්; සුදිට්ඨාහොන්ති, මොනවට දක්නාලද්දාහුවෙත් ද; "සො හෙතෙම; අහං, මම; අතීතමද්ධානං, අතීතකාලයෙහි; අහො සිං නුඛො, වූයෙම් ද; න අහොසිංනුඛො, නුවූයෙම් ද; කිං අහොසිං නුඛො කවරෙක් වූයෙම් ද; කථං අහොසිං නු ඛො, කෙබඳුවූයෙම් ද;- කිං හුත්වා කිං අහොසිංනු ඛො, ජාත්‍යාදියෙන් කවරෙක්ව පසුව කවරෙක් වූයෙම් දැ" යි; පුබ්බන්තං වා, අතීත අන්තයට හෝ; පටිධාවිස්සති, දුවන්නේය. "අහං, මම; අනාගතං අද්ධානං, අනාගත කාලයෙහි; භවිස්සාමිනු ඛො, වන්නේ ද; න භවිස්සාමිනු ඛො,

නොවන්නෙම් ද; කිං භවිස්සාමිනු ඛො, කවරෙක් වන්නෙම් ද; කථං භවිස්සාමිනු ඛො, කෙබඳුවන්නෙම් ද; කිං හුත්‍වා කිං භවිස්සාමිනු ඛො, ජාත්‍යාදියෙන් කවරෙක්ව පසුව කවරෙක් වන්නේද" යි; අපරංතං වා, අනාගත අන්තයට හෝ; උපධාරිස්සති, දුවන්නේ වෙයි.

6 "අහං, මම; අස්මිනු ඛො, වෙම් ද; නොඅස්මිනු ඛො, නොවෙම් ද; කිං අස්මිනු ඛො, කවරෙක් වෙම් ද; කථං අස්මිනු ඛො, කෙබඳු වෙම් ද; අයං නු ඛො සත්තො, මේ සත්වතෙම; කුතො, කොයින්; ආගතො, නු ඛො, ආයේ වේද; සො, හෙතෙම; කුහිං, කොහි; ගාමිභවිස්සතීති, යන්නේද" යි; එතරහි දැන්; පච්චුප්පන්නං අද්ධානං වා, වර්තමානකාලයෙහි හෝ; අජ්ඣත්තං, තමාකෙරෙහි; කථං කථී, විචිකිච්ඡාවක්; භවිස්සති, වන්නේ ද; එතං ඨානං, මේ කාරණය; නවිජ්ජති, විද්‍යමාන නොවෙයි - (සෙසු තන්හි අර්ථ සුබොධ යි.)

( 10 )

---

දුතියො, දෙවැනිවූ; ආහාරවග්ගො, ආහාරවර්ගය යි.

—)(—

(තස්ස, ඒ වර්ගයාගේ; උද්දානං, බන්ධනය යි.)

(ආහාර, ආහාර සූත්‍රය ද; එග්ගුනොවෙව, එග්ගුන සූත්‍රය ද; චෙව සමණබ්‍රාහමණා, සමණ බ්‍රාහමණ සූත්‍ර දෙකද; කච්චාන ගොත්තො, කච්චානගොත්ත සූත්‍රය ද; ධම්මකථි, ධර්මකථික සූත්‍රයද; අචෙලතිම්බරුකෙනච, අචෙලකස්සපයන් හේතුකොටගෙන දෙශිත සූත්‍රය හා තිම්බරුක යන් හේතුකොටගෙන දෙශිත සූත්‍රයන් ද, බාල පණ්ඩිතතො, බාලපණ්ඩිත සූත්‍රය ද; දසමො, දසවැනි; පච්චයෙන ච, ප්‍රත්‍යය හේතුකොටගෙන දෙශිත සූත්‍රය ද යන මෙයින් යුක්තවූයේ වෙයි.)

— || —

## විස්තර—

**දෙසිස්සාමි:-** තථාගතයන් වහන්සේ මේ සූත්‍රයේ දී ප්‍රත්‍යය ධර්මයන් ද, ප්‍රත්‍යුත්පන්න ස්වභාව ධර්මයන් ද දෙශනා කරන් නෙමි යි වදාළ අයුරු යි.

**උප්පාදෙ වා තථාගතානං ඨිතාව සා ධාතු:-** බුදුවරයන් උපන් කල්හි ද නූපන් කල්හි ද ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණය වන්නේය,

හෙවත් ජාතිය මැ ජරාමරණයට ප්‍රත්‍යය වන්නේ යැ, යන සවභාව ධර්මය පවත්නේ යැ. කිසි කාලෙක්හි දූ ජාතිතොමෝ ජරා මරණයට ප්‍රත්‍යය නොවන්නේ නොවෙ යි.

**ධම්මඨිතතා, ධම්මනියාමතා**:- මේ දෙපදයෙන් ද ප්‍රත්‍යය මැ කථිත යි. ප්‍රත්‍යයන් හෙතුකොටගෙන ප්‍රත්‍යොත්පන්නයෝ පවත් නාහ. එහෙයින් ප්‍රත්‍යයතෙම ධම්මට්ඨිතතා යයි කියනු ලැබේ. ප්‍රත්‍යයතෙම ප්‍රත්‍යොත්පන්න ධර්මයන් නියමකර යි එහෙයින් ධම්ම නියාමතා යි ද කියනු ලැබේ

**ඉදප්පච්චයතා**:- මේ ජරාමරණාදීන්ගේ ප්‍රත්‍යයෝ ඉදප්පච්චය නම්. එයම ඉදප්පච්චයතාය යි කියනු ලැබේ.

**තථතා**:- අනූන වූ ද, අනධික වූ ද ඒ ඒ ධර්ම හේතුවෙන් මැ ඒ ඒ ධර්මයාගේ සම්භවය වනහෙයින් ප්‍රත්‍යාකාරයතෙම "තථතා" නම් ප්‍රත්‍යයන්ගේ සහයොගය ඇතිකලැ එයින් නිපන් ධර්මයන් ගේ අසම්භවයෙ (හටනොගැනීමෙ) ක් මොහොතකු දූ නොවන හෙයිනි.

**අනිච්චං**:- ඇතිව නැතිවන අර්ථයෙන් අනිත්‍ය නම් වේ. අනිත්‍ය සවභාවය ඇති ස්කන්ධයෝ ජරාමරණය සවභාව කොට ඇත්තාහ.

**අහොසිං නු ඛො, න නු ඛො**:- යනාදීන් ප්‍රකාශකරන ලද්දේ සොළසවිධ සැකය යි. ශාශ්වත දෘෂ්ටිය නිසා ද, අධිච්චසමුප්පන්න ය යන දෘෂ්ටිය නිසා ද අතීතයෙහි තමන්ගේ විද්‍යමානත්වය ද, අවිද්‍ය මානත්වය ද සැක කර යි.

**කිං නු ඛො අහොසි**:- ජාති වශයෙන්, ලිඞ්ග වශයෙන්. මම පූර්වයෙහි කොබන්දෙක් වීම් දූ යි කරන සැකය යි.

**කථං නු ඛො අහොසි**:- සටහන් වශයෙන් මම උස්වූයෙම් ද? මිටිවූයෙම් ද? සෙවතාදි කිනම් වර්ණයකින් යුක්තවූයෙම් ද? යනාදී වශයෙන් කරන සැකය යි. ඊශ්වරනිර්මාණාදී කවර හේතුවකින් වූයෙම් ද? යනාදීවශයෙන් උත්පත්ති හේතුව සැකකිරීමය යි ද කියනු ලැබේ.

**කිං හුත්වා කිං අහොසිං**:- ජාතියාදී වශයෙන් කවරෙකු වී සිට නැවත කවරෙක් වීම් ද? යනාදී වශයෙන් තමන්ගේ පරම්පරාව පිළිබඳ කරන සැකය යි.

**භවිස්සාමි නු ඛො න නු ඛො**:- යථොක්ත ශාශ්වත, උච්ඡේද දෘෂ්ටිදෙක නිසා මැ අනාගතයෙහි තමන් පිළිබඳ විද්‍යමානත්වය ද, අවිද්‍යමානත්වය ද සැක කරන්නේය, යනු යි.

**පච්චුප්පන්නං අද්ධානං:-** අද්ධාන නම් කාලය යි. පච්චුප්පන්න යනුවෙන් ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය අවසන්කොට ඇති සියලු වර්තමාන කාලය ගන්නා ලැබේ.

**අහං නු ඛො ස්මි:-** වර්තමානයෙහි මම වෙම් දැ? යි කරන සැකය යි. මෙසේ සිතීම වටනේ ද? එසේය ඒ පිණිස නිදර්ශන වශයෙන් කථාවකු ද වෙයි. සුළු මවය මහමවය යි දෙමෑණී කෙනෙක් වූහ මහමවගේ පුතා මුඩුනොකළ හිසක් ඇත්තේ යැ. සුළු මවගේ පුතා මුඩුකළ හිස් ඇත්තෙකි. පසුව මහමවගේ පුතාගේ ද හිස මුඩු කළ කලැ මම සුළුමවගේ පුතාවෙම්දැ?යි සැක කෙළේ ලු. මෙයද එබඳු වේ.

**නො නු ඛො ස්මි:-** වර්තමානයෙහි තමන්ගේ නාස්තිභාවය සැක කරන්නේ යැ, යනු යි. එයට නිදර්ශනයක් මෙසේ යි එක්පුරුෂයෙක් තමන්ගේ පාදය දියෙහි තබාගෙන මසුන් ඇල්ලීමට පටන් ගත්තේ යැ බොහෝ වේලාවක් දියෙහි තිබී මන් පාදය සිහිල් වූයේ යැ එකලැ මත්ස්‍යයෙකැ යි සිතා ඔහු මැ තමන්ගේ පාදයට ගැසී ලු එසේම සොහොනක් අසලැ කෙතක් රකින එක්මනුෂ්‍යයෙක් බියෙන් මැ සයනය කෙළේයැ. පසුව නින්දෙන් පිබිද යකෙකැ යි සිතා තමන්ගේ දනහිසට මැ ගැසී ලු මේ සැකය ද මෙසේ සිතිය යුතු යි

**කිං නු ඛො ස්මි:-** ඒ ඒ කුලාදියෙහි උපන්නා වූ තමන් ගැනම "මම මෙබඳු කුලාදිය ඇත්තෙක් ද" යනාදී වශයෙන් කරන සැකය මෙයින් අදහස් කරන ලදී.

**කථං නු ඛො ස්මි:-** "හුදෙක් මේ ශරීරය අභ්‍යන්තරයෙහි ජීවයක් ඇතැ" යි ගෙන එය කෙබඳු ආකාර ඇත්තේ දැ? යි කරන සැකය මෙයින් කථිත යි.

**අරියසාවකස්ස:-** මෙහි අරියසාවක යන්නෙන් ශ්‍රොතාපන්න පුද්ගලයා ගැනෙ යි. ඉතිරි ආර්‍ය්‍යශ්‍රාවකයන්ගේ ගැනීම ද නොවලක් වන ලදී.


---

(**10=** ප්‍රත්‍යයධම් සූත්‍රය යි )

---

දෙවෙනි ආහාර වර්ගය නිමියේ යි.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු